පළමු කාණ්ඩය - තෙවන කලාපය




# ශ්‍රී ලංකාවේ මානව හිමිකම්

2013
ජූනි



නීතියක් නැති රටක් 2
නීත්‍යානුකූල භාවයේ අහිමි අර්ථය 5
ආසියාවට වැරදුණේ කොතැනද? 10
දුගඳ - දේශපාලන මේසය 19

කලුතර දකුණ පොලීසිය වෘෂණ කෝෂවලට ලී අතකොලුවකින් කොටති. 20





ලෙයින් ලියැවුණු වධ හිංසා සිද්ධි 400 ක්
ආසියානු මානව හිමිකම් කොමිසමේ නවතම ප්‍රකාශනය 24

නම් ගම් සොයන - නම් නැති අය - කොළඹ මහේස්ත්‍රාත් අධිකරණ නීතීඥ සංගමයේ
' සභාපති ගුණරත්න වන්නිනායක මහතාට හිරිහැර කිරීමට තවත් උත්සාහයක්' 25
සෝදාපාළුව බරපතළයි 27
ගිනිගන්නා රටක කෙළින මී හරකුන් වැනි පුතුන් 30
පාරිශුද්ධ අධිකරණයක්...? 32
මාධ්‍යයට ආචාරධර්ම ...? 34



මාතලේ සමූහ මිනීවළේ නිදන්නේ කවුද..? 37

ප්‍රශ්නයක් ගැන කතා කරමු 43
සාධාරණ තීන්දු වෙනුවෙන් අපි එදා විනිසුරු කුටියේදී අසිපත් අමෝරා ගත්තා 45



*සංස්කරණ උපදේශකත්වය*



**බැසිල් ප්‍රනාන්දු**

Asian Human Rights Commission Ltd.
Unit 701A, Westley Square
48 Hoi Yuen Road
Kwan Tong, KLN
Hong Kong, China
Tel: +(852) 2698 6339
Fax: + (852) 26986367
Web: humanrights.asia



| | | | | | |
|---|---|---|---|---|---|
| නීතියක් නැති රටක් 02 | ආසියාවට වැරදුණේ කොතැනද? 10 | ලෙයින් ලියැවුණු වධ හිංසා සිද්ධි 400 ක් 24 | නම් ගම් සොයන - නම් නැති අය 25 | මාධ්‍යයට ආචාරධර්ම ...? 34 | මාතලේ සමූහ මිනීවළේ නිදන්නේ කවුද..? 37 |



# නීතියක් නැති රටක්

**නියෝජ්‍ය පොලිස්පති වාස් ගුණවර්ධන මිනීමැරුම් චෝදනා මත අත්අඩංගුවට පත්වීම හුදෙකලා සිද්ධියක් නොවන බව ආසියානු මානව හිමිකම් කොමිසම අවධාරණය කරයි.**

- බැසිල් ප්‍රනාන්දු විසිනි.

මුදල් සඳහා ව්‍යාපාරිකයෙකු ඝාතනය කිරීම කුමන්ත්‍රණය කිරීමේ සිද්ධිය පිළිබඳ පරීක්ෂණ පැවැත්වෙන අතරතුර නියෝජ්‍ය පොලිස්පති වාස් ගුණවර්ධන දැන් සිටින්නේ රිමාන්ඩ් භාරයේ ය. ඔහුගෙන් ප්‍රශ්න කෙරෙන අතර පවා, ස්වර්ණවාහිනී රූපවාහිනී නාලිකාවේ මුල්පිටුව වැඩසටහනෙන් වාර්තා වුණේ ඔහු සිය විමර්ශන නිලධාරීන් වෙත තමන් මිනීමරුවෙක් බවත් 'නැවත පැමිණි විට තමන්ගේ පළිය ගන්නා බවත්' ඔහු කියා තිබෙන බවයි.

වසර ගණනක් මුලුල්ලේ වාස් ගුණවර්ධන සම්බන්ධයෙන් චෝදනා රැසක් විය. ඔහුගේ බිරිඳ සහ පුත්‍රයා විසිණ්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා වශයෙන් ඔහු වෙත සේවය කරමින් සිටි පොලිස් නිලධාරීන් දෙදෙනෙකුගේ උපකාරය ඇතිව නිපුණ රාමනායක ශිෂ්‍යයා හට පහර දීමේ සිද්ධිය පුලුල් මාධ්‍ය ආවරණයක් ලබාගත්තේය. කෙසේ නමුත් මෑතක් වන තෙක්ම මේ සිද්ධිය සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීම සලකා බලමින් තිබෙන්නේ දැන් ය. එම ශිෂ්‍යයා විසින් ගොනු කළ මූලික අයිතිවාසිකම් අයදුම්පත 2014 ජනවාරි දක්වා විභාගයට ගැනීම කල්දමා තිබිණි.

ප්‍රාදේශීය දේශපාලනඥයකුගේ සහෝදරයෙකු ඝාතනය කිරීමෙන් පසුව පුද්ගලයන් පස් දෙනෙක් මහ දවාලේ මරාදැමීම ද පුලුල් ප්‍රචාරයක් ලබාගත්තේය. මේ මිනීමැරුම් සිදුකෙරන විට වාස් ගුණවර්ධන එම ප්‍රදේශය භාර නිලධාරියා විය. දේශපාලනඥයාගේ සහෝදරයාගේ සත්‍ය ඝාතකයන් එසේ මරා දමන ලද පුද්ගලයන් පස් දෙනා නොව පසුව අධිකරණයට භාර වූ වෙනත් අය බව ද හෙළිදරව් විය. මේ මහදවාලේ සිදුකළ මිනීමැරුම්වලට අදාළ ව කිසිදු අත්අඩංගුවට ගැනීමක් සිදුකර නැත.

අභිරහස් ඝාතන 16 ක් සිදුවී තිබූ කහවත්ත ප්‍රදේශයේ ඉහළම නිලධාරියා වශයෙන් වාස් ගුණවර්ධන ව මාරුකිරීමෙන් පසුව ඒ අතරින් එක් ඝාතනයක් සම්බන්ධයෙන් පොලිස් භාරයේ සිටි එක් අයෙක් සහ ඇප මත නිදහස් වී සිටි තවත් අයෙක් අතුරුදන් වූ අතර වාර්තාවලට අනුව පසුව ඔවුන්ගේ මළ සිරුරු විසිකර දමා තිබියදී හමුවිය. නැවතත්, මේ ඝාතන සම්බන්ධයෙන් කිසිවෙක් අත්අඩංගුවට ගැනුණේ නැත.

පොලිස් නිලධාරියෙකුට යම්කිසිවෙක් අත තබන්නේ නම් ඔවුන්ට වෙඩි තබන්නට තමන් යටතේ පවතින ප්‍රදේශයේ පොලිස් නිලධාරීන්ට අවසර තිබේය යන ජනප්‍රිය ප්‍රකාශය වාස් ගුණවර්ධන විසින් සිදුකළේ එයට සති කිහිපයකට පෙර ය. එම පොලිස් නිලධාරීන් සෑම අයෙකුටම තුවක්කුව සහ උණ්ඩ 20 බැගින් නිකුත් කර ඇති බව ද ඔහු තවදුරටත් කීය. අනාගතයේ සිදුවන ඕනෑම සිද්ධියකදී මේ උන්ඩ භාවිතා නොකරන ඕනෑම නිලධාරියෙකුට තමන් තරවටු කරන බවත් ඔහු කීවේය. මෙම ප්‍රකාශය නිසැකවම සිදුකරන්නට ඇත්තේ දේශපාලන අධිකාරීන්ගේ අනුමැතිය සහිතව ය.

ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සහ වාස් ගුණවර්ධන අතර තිබෙන සමීප සම්බන්ධතාවය පිළිබඳ මාධ්‍ය විසින් පුළුල් ලෙස වාර්තා කර තිබිණි. වර්තමානයේ පොලීසිය ක්‍රියාත්මක වන්නේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ය. පොලීසිය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ නොව වෙනම ආයතනයක් ලෙස ක්‍රියාකළ යුතු යැයි උගත් පාඩම් හා සංහිඳියා කොමිසම (LLRC) සිය අවසන් වාර්තාවේදී නිර්දේශ කළේය. කෙසේ නමුත් ආණ්ඩුව මෙම නිර්දේශය ප්‍රතික්ෂේප කර ඇති අතර පැහැදිලි ලෙසම ගෝඨාභය රාජපක්ෂගේ පාලනය යටතේ තිබෙන මෙම අමාත්‍යාංශය යටතේ පොලීසිය තබාගැනීමට පැහැදිලි ලෙසම උත්සුක වෙයි.




*එකෙක් ඇල්ලුවා යැයි පොලිස් භටයා හරි සතුටෙනි. නමුත් ඊට පිටුපසින් ඔහුගේ ලොක්කෙකි. ලොක්කාට පිටුපසින් රටේ ලොක්කෙකි.*

*-කාටූනය - ඩේලි මිරර්*

ප්‍රධාන පෙළේ කෝටිපති ව්‍යාපාරික මොහොමඩ් ෂියාම් ඝාතන කොන්ත්‍රාත්තුවක ස්වරූපයෙන්, නියෝජ්‍ය පොලිස්පති යටතේ සේවය කළ පොලිස් නිලධාරීන් යොදාගෙන ඝාතනය කළ බවට නැගෙන චෝදනා, ශ්‍රී ලංකාවේ පොලිස් ක්‍රමය කොතරම් දුරකට නීතියක් රෙගුලාසියක් නැති මට්ටමකට ගමන් කර තිබේද යන්න විදහා දක්වයි. නියෝජ්‍ය පොලිස්පති වාස් ගුණවර්ධනගේ සිද්ධිය එක් හුදෙකලා සිදුවීමක් නොවේ. නිසි පරීක්ෂණ සිදුකරන්නේ නම් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් ගණනාවක් ඇතුළුව බොහෝ පොලිස් නිලධාරීන් තමන් වෙනුවෙන් මෙන්ම අනුන්ගේ අපරාධ වසං කිරීම සඳහා ද කරන ලද අපරාධයන්ට සම්බන්ධ බව හසුවීමට ඉඩ තිබේ.

නියෝජ්‍ය පොලිස්පති වාස් ගුණවර්ධන අපරාධවලට සම්බන්ධ බවට ඇතිවී තිබෙන සැකය පුදුමයට කාරණයක් නොවේ. ගතවූ වසරවලදී ශ්‍රී ලංකාව තුළ කතා කළ එක් බරපතළම ගැටලුවක් වූයේ දේශපාලනීකරණය යැයි සාමාන්‍යයෙන් කියන ක්‍රියාවලිය හේතුවෙන් මහජන ආයතන බිඳවැටීමයි. පොලිස් සේවය එසේ දේශපාලනීකරණය වූ ආයතන අතරින් ඉහළින්ම වේ. මෙය ජනප්‍රිය ව තිබෙන්නේ 17 වැනි ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ විවාදය හෝ 18 වැනි සංශෝධනයට එරෙහි විවාදය යනුවෙනි.

පොලීසිය නීතියක් රෙගුලාසියක් නැති ආයතනයක් දක්වා පහළ වැටීම, නීතියක් හෝ රෙගුලාසියක් නැති දේශපාලන ක්‍රමයක සමස්ත මෙහෙයවීමක කොටසක් ද වේ. 18 වන සංශෝධනය මගින් 1978 ආණ්ඩුක්‍රමයෙන් ආරම්භ වූ අවනීතිය වෙතට හායනය වීම සම්පූර්ණ කළේය. 17 වන සංශෝධනයේ මාර්ගයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරන්නට ගිය සීමාසහිත ප්‍රතිසංස්කරණ, රාජපක්ෂ රෙජීමය විසින් 18 වන සංශෝධනය සිදුකිරීම මගින් විනාශ කර දැමුවේය.

දැන්, අවනීතිය ජාතියේ සෑම ක්ෂේත්‍රයකටම තර්ජනය කරමින් සිටියි. නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු විසින් කරවූවා යැයි කියන ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයෙකුගේ ඝාතනය, ව්‍යාපාර ප්‍රජාව පවා කොතරම් දුරකට තර්ජනයට ලක්ව ඇත්දැයි හෙළි කර සිටියි. යම් ව්‍යාපාරිකයෙකු සමග ආරවුලක් තිබෙන තවත් ව්‍යාපාරිකයෙකුට හෝ පදිංචිකරුවන් එළවීමට අපහසු ඉඩම් හිමියෙකු හට සහ තම විරුද්ධවාදියාගෙන් මිදීමට තරම් මුදල් වියදම් කිරීමට තිබෙන ඕනෑම අයෙකුට දැන් පොලීසියේම දරුණු ක්‍රමවල සහාය ලබාගැනීමට දැන් පුළුවන.

නියෝජ්‍ය පොලිස්පති වාස් ගුණවර්ධන අත්අඩංගුවට ගැනීම, නීතියක් නැති කම නීතියේ ආධිපත්‍යයට එරෙහි වීම ලෙස සැලකීමට වඩා කැමති දේශපාලන ක්‍රමයක් හේතුවෙන් සමස්ත රටම දැන් මුහුණ දී සිටින අන්තරායේ ගැඹුර මැන බලන අවස්ථාවක් ලෙස ගත යුතුය. මෙය, ගතවූ වසර පහළොව මුළුල්ලේ ආසියානු මානව හිමිකම් කොමිසම විසින් නැවත නැවතත් සිදුකරන අනතුරු ඇඟවීම් මගින් ඉස්මතු කළ තේමාවකි. මේ ප්‍රමාදී අවධියේ පවා, ව්‍යාපාරික ප්‍රජාව ඇතුළුව ශ්‍රී ලංකා සමාජයේ සිටින හෘද සාක්ෂියක් සහිත මිනිසුන් මේ අනතුරු ඇඟවීම බරපතළ ලෙස නොගනියි නම් ඔවුන් සිදුකරන්නේ තමන් විසින් තමන්ම තවදුරටත් උපද්‍රවයේ හෙළා ගැනීමකි.

අනෙක් අතට, මේ සිද්ධියේ විමර්ශන නිලධාරීන් හට, ඕනෑම අපරාධ විමර්ශනයක් විසින් ඉල්ලා සිටින සම්පූර්ණ බවින් යුතුව-පිරිසිදු අත්වලින් සිය පරීක්ෂණ කළ හැකිවීමේ හැකියාව පිළිබඳ සාමාන්‍ය නරුමවාදයක් තිබේ. සංශයවාදීන් විශ්වාස කරන්නේ, නිසි විමර්ශන ක්‍රියාදාමයකදී තව තවත් අපරාධ හෙළිදරව් වීමේ බිය නිසා මේ විමර්ශනයට දේශපාලන අධිකාරීන් මැදිහත් විය හැකි බවයි. එය එසේ වේ නම් ව්‍යාපාරික ප්‍රජාව සහ සෙස්සන්ගේ ආරක්ෂාව අතිදැවැන්ත ලෙස අභාවයට යයි.

නියෝජ්‍ය පොලිස්පති වාස් ගුණවර්ධන අත්අඩංගුවට ගැනීම, නීතියක් නැති කම නීතියේ ආධිපත්‍යයට එරෙහි වීම ලෙස සැලකීමට වඩා කැමති දේශපාලන ක්‍රමයක් හේතුවෙන් සමස්ත රටම දැන් මුහුණ දී සිටින අන්තරායේ ගැඹුර මැන බලන අවස්ථාවක් ලෙස ගත යුතුය. මෙය, ගතවූ වසර පහළොව මුළුල්ලේ ආසියානු මානව හිමිකම් කොමිසම විසින් නැවත නැවතත් සිදුකරන අනතුරු ඇඟවීම් මගින් ඉස්මතු කළ තේමාවකි. මේ ප්‍රමාදී අවධියේ පවා, ව්‍යාපාරික ප්‍රජාව ඇතුළුව ශ්‍රී ලංකා සමාජයේ සිටින හෘද සාක්ෂියක් සහිත මිනිසුන් මේ අනතුරු ඇඟවීම බරපතළ ලෙස නොගනියි නම් ඔවුන් සිදුකරන්නේ තමන් විසින් තමන්ම තවදුරටත් උපද්‍රවයේ හෙළා ගැනීමකි.



**පහත දැක්වෙන්නේ එවකට සීඅයිඩී යේ අධ්‍යක්ෂවරයා වූ වාස් ගුණවර්ධනගේ අනුදැනුම මත ඔහුගේ බිරිඳ සහ පුත්‍රයා මාලඹේ පරිගණක සිසුවා හට පහරදුන් බවට පැවසෙන සිද්ධිය, බැසිල් ප්‍රනාන්දු විසින් 1977 ආණ්ඩුක්‍රමය පිළිබඳ රචිත 'ගයිජස්ගේ මුද්ද -1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව' ග්‍රන්ථයෙන් විග්‍රහ කර තිබූ ආකාරයයි.**

# නීත්‍යානුකූල භාවයේ අහිමි අර්ථය

ලංකාවේ නීතිය, අධිකරණය සහ නීති වෘත්තිය පිළිබඳ පුරසාරම් කීම එක් කලෙක නීතීඥවරුන් සහ විනිශ්වයකාරවරුන් අතර මෙන්ම ඇතැම් දේශපාලනඥයන් අතර පවා, එක් කලෙක සාමාන්‍ය දෙයක් විය. ශ්‍රී ලංකාවේ නූතන නීති ක්‍රමයේ ඉතිහාසය පිළිබඳ පොත් ලියැවී ඇති අතර කෙසේ වෙතත් ඒවා අද දිනයේ කියැවීම දුෂ්කර ය. ඒ වෙනුවට අධිකරණයේ කොරිඩෝරයන් හි, නීතීඥවරුන්ගේ කාර්යාලවල, සහ සාමාන්‍ය සංවාදවලදී පවා, නීත්‍යානුකූල භාවය ට එහි අර්ථය අහිමි වූ සහ පුරවැසියන් ශූන්‍යයන් බවට පත් කළ ශාපලත් ක්‍රමයක් පිළිබඳ ශාපයන් පමණක් කියැවේ. වර්තමානයේ ශ්‍රී ලංකාවේ නීතිය නිෂ්ඵල භාවයේ පරීක්ෂාවකි. 1978 ආණ්ඩු ක්‍රමයෙන් 31 වසරකට පසුව, නීතිය කුමක් ද නීතිය නොවන්නේ කුමක් ද යන්න පවා වෙන් කර හඳුනාගත නොහැක. විධායක ජනාධිපතිවරයා විසින් තමන් ව නීතිය ට ඉහළින් තබාගත් විට නීතිය මඳින් මද කිසිදු සුවිශේෂීතාවයක් නොමැති අවස්ථාවක් දක්වා හායනය වීමේ ක්‍රියාවලිය ආරම්භ විය. මෙය පුදුමයක් නොවේ. විධායකය කෙරෙහි සකල සංවරණයන් හා තුලනයන් නිශේධනය කිරීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය විනාශ කරගෙන තිබේ. ප්‍රමුඛ නීතිය විසින් ම තමන් අනුකූල නැතැයි සඳහන් කරන විට, එහි අනනුකූලතාවය විසින් සෙසු සියලු නීතීන් ද පසාරු කරයි. එයින් පසුව මහජන ආයතනයන් ද ඒවායේ බලය සහ වටිනාකම අහිමි කර ගනියි. පරාණ බය ඇති නොකළ ද මෙහි ප්‍රතිඵලයන් විසුලු සහගත ය. 17 වැනි සහ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ විවාදය ගන්න. මෙකී සංශෝධන පිළිබඳ විවාදයන් නිමක් නැතිව සිදුවන්නේ අදාළ නොවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් සිදුකිරීම යම්කිසි අර්ථයක් සහිත ගැටලුවක් යැයි මතුපිටට යටින් වැරදි පූර්වානුමිතියක් පවතින නිසා ය. මළ ගසකට ජීවී අත්තක් බද්ධ කිරීම මගින් අත්ත ට හෝ ගස ට ජීවයක් නොලැබෙන බව පිළිගැනීම ට අකමැත්තක් මෙහි තිබේ.

අද වන විට, යුක්තිය පරිපාලනය කරන ආයතනයවල මගපෙන්වීමෙන් පාතාල මූලාවයව විසින් නීති සාධන ඒජන්සිවල ක්‍රියාකාරකම් අත්පත් කරගෙන සිටියි. උදාහරණයක් වශයෙන්, ණයකරු සිය ණය ආපසු නොගෙවයි නම් ණය හිමියා ප්‍රසිද්ධ අපරාධකරුවෙකු වෙත යයි. එම මුදල් ආපසු රැගෙන දීමට පමණක් නොව එය ඉතා ඉක්මනින් කර දීමට ද අපරාධකරු සමත් වෙයි. නමුත් මේ ප්‍රතිඵලය ම ලබාගැනීම සඳහා ණය හිමියා නීති



ප්‍රමුඛ නීතිය විසින් ම තමන් අනුකූල නැතැයි සඳහන් කරන විට, එහි අනනුකූලතාවය විසින් සෙසු සියලු නීතීන් ද පසාරු කරයි. එයින් පසුව මහජන ආයතනයන් ද ඒවායේ බලය සහ වටිනාකම අහිමි කර ගනියි.

පරාණ බය ඇති නොකළ ද මෙහි ප්‍රතිඵලයන් විසුලු සහගත ය.

ක්‍රියාදාමයේ  සහාය පැතුවේ නම්, ඔහුට එම අයවිය යුතු මුදලට ද වඩා වැඩි මුදලක් සහ ප්‍රමාද කාලයක් ඒ සඳහා ගත වෙයි. මේ සැකසුම තුළ අපරාධකරු නීතිය ට වඩා අතිශයින් කාර්යක්ෂම ය. දේශපාලනඥයෝ ද නීති ආයතනවලට වඩා අපරාධමය මූලාවයවයන් මත රැඳෙති. සෑම මැතිවරණයක් ම අපරාධකරුවන් සහාය වන්නේ මේ පක්ෂයට ද නැත්නම් අර පක්ෂයට ද යන්න පිළිබඳ තරගයක් වේ. ඡන්ද දායකයන්ගේ ජීවිතවල තත්වය ඉහළදැමීම පිණිස වන ප්‍රතිපත්ති වෙත ඔවුන් යොමුකරවනවා වෙනුවට, මෙය අපේක්ෂකයන් තෝරාගැනීම සඳහා ඡන්ද දායකයන් හට අයුතු බලපෑම් සිදුකරන බලහත්කාරී ක්‍රියාදාමයකි.

නීත්‍යානුකූලභාවයේ අර්ථය අහිමි වූ විට, "විනිසුරු", "නීතීඥයා" සහ "පොලිස් නිලධාරියා" වැනි යෙදුම් අතීතයේ මෙන්ම මතුපිට අර්ථයෙන් පමණක් යෙදේ. නමුත් ඒවායේ අභ්‍යන්තර අර්ථය සැලකියයුතු තරමින් වෙනස් වී ඇත. මෙබඳු නිල නාමයන් දරන්නන් හට නීතිය සංවිධානාත්මක මූලධර්මයක් ලෙස පැවති අතීතයේ තිබූ අධිකාරිය, බලය සහ වගකීම තවදුරටත් නොමැත.

උදාහරණයක් වශයෙන්, නීතියේ ආධිපත්‍යය මත පදනම් වූ සමාජයක සාමාන්‍ය අපරාධ නඩු විධානය යටතේ, සියලු අපරාධ විමර්ශනය කිරීමට බැඳීමක් තිබූ අතර එකී විමර්ශන ක්‍රමවේයන් වල ප්‍රමිතියක් තිබිණි. නමුත් දැන් මෙවැනි බැඳීමක් ශ්‍රී ලංකාවේ නැත. විමර්ශන සිදුකෙරෙන විට ඒවා අතිශයින් ම විධානාත්මක ලෙස සිදුකරයි. යම් කිසිවෙකු තවත් අයෙකු විනාශ කිරීම ට කැමැත්තෙන් පසුවෙයි නම් සම්පූර්ණයෙන් ම ව්‍යාජ විමර්ශන පවා සිදුකළ හැකිය. අපරාධ විමර්ශන ක්‍රියාදාමය නීතිය හා සාමය නඩත්තු කිරීමේ මාධ්‍යයක් පමණක් දක්වා හායනය වෙමින් තිබේ. තවද එය පුරවැසියන් තාඩන පීඩන හා විපත ට හෙළන සහ පුරවැසියන් ත්‍රස්ත කරවන මාධ්‍යයක් බවට පත් ව තිබේ.

නීතීඥවරුන්ගේ භූමිකාව හීනවීම ද නීතියේ අර්ථය අහිමි වීමේ එක් ලක්ෂණයකි. අද වන විට පොලිස් ස්ථානවලදී හෝ මහේස්ත්‍රාත් උසාවි වල සිය සේවාදායකයන් වෙනුවෙන් මැදිහත් වන නීතීඥවරුන් හට පොලිස් කොස්තාපල්වරුන් පවා කඩාපනිති. ඇප ලබාගැනීම සඳහා, නීත්‍යානුකූල අයිතීන් අවධාරණය කරමින්

## Nipuna relates horror at Pittugala house; police deny SSP's son involved in assault

**Alleged assault of IT campus student by CCD men**

**වාස් ගුණවර්ධනගේ පුත් රවිඳු විසින් නිපුණ රාමනායක හට පහරදීමක් ගැන සාක්ෂි නැතැයි පොලිස් ප්‍රකාශක පැවසූ අයුරු සන්ඩේ ටයිම්ස් එදා මෙසේ වාර්තා කළේය**

and Technology (SLIIT) in Malabe continues to receive treatment at the Colombo National hospital.
Nipuna who hailed from Ratnapura came to Colombo with his mother to follow an IT degree.
He admitted that some SLIIT students had allegedly harassed the CCD director's son Ravindu Sameera Gunawadena, a junior student.



The injured Nipuna Ramanayake

"I did not know who Ravindu was until he had a brawl with a batch mate of mine last year. I was there when it happened. The brawl erupted when he banged against my friend and tried to push his weight around without any reason," Nipuna said.

Recalling the incident on Tuesday, he said he was in a pretty good mood because he felt he had fared well in the exam. "I went to the canteen after I finished my exam around

නඩු විධාන සංග්‍රහ අනුගමනය කරනවාට වඩා පොලිස් භටයන් ට අල්ලස් දීම වඩා හොඳ ක්‍රමයකි. පොලීසියේ නීති විරෝධීභාවය ප්‍රශ්න කිරීම, සේවාදායකයා ට මෙන්ම නීතිඥවරයා ට හෝ නීතිඥවරිය ට තාඩන පීඩන කිරීම සඳහා ඔවුන් කුපිත කිරීමක් පමණක් වනු ඇත. නීතියේ අර්ථය අහිමි වන විට නීතිඥ වෘත්තියේ ගුණාත්මය ද ස්වභාවයෙන් ම හීන වී යයි. කිසිවෙක් නිරර්ථක ව්‍යායාමයන් සඳහා කාලය වැය නොකරනු ඇත. නඩු විභාගයකින් තොරව, අපරාධ නඩු විධාන සංග්‍රහය මගින් සලසන ආරක්ෂාවේ පිහිට පැතීමකින් තොරව ජනතාව අත්අඩංගුව ට ගත හැකි නම් සහ රඳවා තබාගත හැකි නම්, සාමාන්‍ය ක්‍රියාදාමය ට පිටතින් වූ ක්‍රම වෙත යොමුවීම ට වඩා දෙයක් නීතිඥවරුන් ට ද කළ නොහැක. මේ ආකාරයට ඔවුන්ගේ භූමිකාව ද නීතිමය

**දේශපාලනඥයන් සමග වැඩ කරන අපරාධකරුවන් නොව දේශපාලන වාසි ලබාගැනීම සඳහා තුරන් කර දැමිය යුතු වන අපරාධකරුවන් යැයි කියන අය පැහැරගැනීම සහ ඝාතනය කිරීම ද නීත්‍යානුකූලභාවයේ අර්ථය අහිමි වී යාම විදහා දැක්වීමට අදාළ වේ.**

අර්ථයක් නොලැබෙන පරිදි හීන වී යයි.

මේ සියල්ල අතරින් අධිකරණය ලොකු ම පරාජිතයා ය. අධිකරණ ස්වාධීනතාවයේ සංකල්පීය පදනම ශ්‍රී ලංකාවේ සම්පූර්ණයෙන් ම අවතැන් වී තිබේ. 1978 ආණ්ඩු ක්‍රමය ක්‍රියාව ට නැංවෙන මුල් වර්ෂවලදී, අධිකරණවලට එරෙහි ව එහි බලපෑම අවම කරගැනීම සඳහා විනිසුරුවරුන් හා නීතිඥවරුන් පෙර යුගයන්හිදී මෙන්ම සිය චර්යා රටා තුළින් උත්සාහ කළහ. නමුත් අද වන විට මෙම ප්‍රතිරෝධය සැහෙන ප්‍රමාණයකින් හීන වී ගොස් තිබේ. පවතින ක්‍රමය විධායක ජනාධිපති ට සරිලන සේ ස්වයං සීරුමාරුවකට පත් ව තිබෙන අතර ඒ තුළ පැහැර හැරිය නොහැකි සෑම දෙයක ම සුවිශේෂතාවය හිස් වී තිබේ.

ණය මුදල් එක්රැස් කර ගැනීම මෙන්ම ඝාතනය සඳහා යොදාගන්නා ක්‍රමවේදය ද දැන් මිලෙන් ඉතා අඩු ය. ලාබ ය. ඉක්මන් ය. අධිකරණ හරහා එය කරනවාට වඩා අවදානමෙන් අඩු ය. පොලීසිය, හමුදාව හෝ වෙනත් අපරාධමය මූලාංගයන් ද ඇතුළත් ව ඔවුන් යටතේ කටයුතු කරන ඕනෑම අයෙක්, විනිර්මුක්තියේ සහතිකය ලබති. මෙය මෙසේ වන්නේ ඝාතන සිදුකෙරන රහස් ක්‍රමවේදයන් හා අපරාධකරුවන් හට ලැබෙන ආරක්ෂාවන් නිසා ය. 2009 වර්ෂයේ සිදුවූ සිද්ධීන් දෙකකින් මේ බව අනාවරණය වෙයි.

ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යාංශය යටතේ සේවය කරන සහකාර සම්බන්ධීකාරක නිලධාරියෙකු ඔහුගේ නිවසින් පැහැරගන්නා ලදී. ඔහු වෙනුවෙන් ලැබුණු නිමක් නැති ඇමතුම්වලින් පසුව අමාත්‍යවරයා සෑම අතකට ම දුරකතනයෙන් කතාකර, ඔහු යම්කිසි පොලිස් ස්ථානයක පොලිස් භාරයේ සිටින බව සොයාගත්තේ ය. ඔහුගේ ජීවිතය බේරුණේ අමාත්‍යවරයාගේ මැදිහත් වීම නිසා ය. පැහැරගැනීම ට ලක්වූ එම පුද්ගලයා භයානක අපරාධකරුවෙකු බවටත් අපරාධ කල්ලියක නායකයෙකු බවටත් පොලීසිය චෝදනා නගා තිබිණි. පොලීසිය විසින් ඔහුගේ නිවසින් ගිනි අවි සහ වෙඩි බෙහෙත් සොයාගත් බව ද වාර්තාවල සඳහන් විය. පැහැරගැනීම හෙළාදකිමින් ප්‍රසිද්ධ ප්‍රකාශයක් නිකුත් කිරීම ට අමාත්‍යවරයා හට සිදුවිය.



රවීන්ද්‍ර සහ වාස් ගුණවර්ධනගේ බිරිඳ

තවත් සිදුවීමකදී, කොළඹ අපරාධ විමර්ශන කොට්ඨාසයේ (සීඅයිඩී) අධ්‍යක්ෂවරයාගේ පාසල් යන පුත්‍රයා වූ රවීන්ද්‍ර, චමී නමැති තවත් පාසල් මිතුරෙකු සමග දබරයක් ඇති කර ගත්තේය. චමී සමග නිපුණ නමැති මිතුරෙක් තේ පානය කරමින් සිටින විට එතැනට පැමිණි රවීන්ද්‍ර, ඔවුන් ව කුපිත කරවා රණ්ඩුවක් ඇති කරගැනීම ට වෑයම් කළේය. දෙදෙනා තේ හළෙන් පිටවී සිය නවාතැන්පොළ වෙත යමින් සිටින අතර පොලිස් ජීප් රථයක් ඔවුන් පසුපස ආවේය. එය හරවා ඔවුන්ගේ මග හරස් කළේය. ගිනි අවි සමග සිව්දෙනෙක් පමණ එයින් බැසගත්හ. ඔවුන් චමී ව බිත්තියකට හේත්තු කර පිස්තෝලයක් නළලට තැබූ අතර නිපුණ ට ද එය ම සිදුවිය. චමී ට යන්නට දෙන ලෙසත් ඒ වෙනුවට තමන් ව රැගෙන යන ලෙසත් නිපුණ කෑගැසුවේය. ඉන්පසු පොලිස් භටයෝ නිපුණ ව ජීප් රියට දමාගෙන රවීන්ද්‍රගේ නිවසට ගෙන ගියහ. ඔහු ට වාහනයෙන් බිමට බැස දණගාගෙන යන ලෙස කීය. එසේ දණගාගෙන යන අතර ඔහුට පොලුවලින් පහර දුන්නේය. සීඅයිඩී යේ අධ්‍යක්ෂකවරයාගේ බිරිඳ වන රවීන්ද්‍රගේ මව, නිපුණගේ සිරුර මත සිටගෙන නිපුණගෙන් මෙසේ ඇසූ බව කියැවේ. "දැන් උඹ දන්නවද මගෙ බර?" එයින් පසු පොලීසිය විසින් නිපුණ ව පෑලියගොඩ සීඅයිඩී ය වෙත ගෙන ගිය අතර එහිදී අධ්‍යක්ෂකවරයා ද එම ස්ථානය ට පැමිණියේය. බෝම්බ ළඟ තබාගැනීම පිළිබඳ චෝදනා ගොනුකරන්නේ යැයි එහිදී නිපුණ ට තර්ජනය කර ඇත්තේ, එම චෝදනාවෙන් ගැළවීම ට තිබෙන එකම ක්‍රමය කටඋත්තරයකට අත්සන් ගැනීම බවයි. මේ සිද්ධියේදී, වහාම මේ ගැටලුව පොලිස්පතිවරයා ට සහ සෙසු බලධාරීන් ට දන්වමින් නිපුණගේ පවුල මෙයට මැදිහත් වූ නිසා ඔහුගේ ජීවිතය බේරුණේය.

වඩාත් ම විශ්වාසනීය ලෙස ඝාතන සිදුකළ හැක්කේ ආයතනයික ලෙස වනවා පමණක් නොව, ඝාතනය නීති විරෝධී ක්‍රියාවක් ය යන අදහස පවා, මේ ප්‍රතිපත්තිය ට වගකිවයුතු වන පුද්ගලයන් නිසා නැති වී යයි. බීබීසී සිංහල සේවය විසින් පොලිස් ප්‍රකාශක ව සම්මුඛ සාකච්ඡාවට ලක් කරන විට, ඝාතනය ට ලක්වන්නන් සැබවින් ම කළායැයි කියන අපරාධවල සැකකරුවන් පමණක් වන විට ඔවුන් ට අපරාධකරුවන් ලෙස සැලකුවේ කෙසේදැයි

ඉන්පසු පොලිස් භටයෝ නිපුණ ව ජීප් රියට දමාගෙන රවීන්ද්‍රගේ නිවසට ගෙන ගියහ. ඔහු ට වාහනයෙන් බිමට බැස දණගාගෙන යන ලෙස කීය. එසේ දණගාගෙන යන අතර ඔහුට පොලුවලින් පහර දුන්නේය. සීඅයිඩී යේ අධ්‍යක්ෂකවරයාගේ බිරිඳ වන රවීන්ද්‍රගේ මව, නිපුණගේ සිරුර මත සිටගෙන නිපුණගෙන් මෙසේ ඇසූ බව කියැවේ. "දැන් උඹ දන්නවද මගෙ බර?" එයින් පසු පොලීසිය විසින් නිපුණ ව පෑලියගොඩ සීඅයිඩී ය වෙත ගෙන ගිය අතර එහිදී අධ්‍යක්ෂකවරයා ද එම ස්ථානය ට පැමිණියේය. බෝම්බ ළඟ තබාගැනීම පිළිබඳ චෝදනා ගොනුකරන්නේ යැයි එහිදී නිපුණ ට තර්ජනය කර ඇත්තේ, එම චෝදනාවෙන් ගැළවීම ට තිබෙන එකම ක්‍රමය කටඋත්තරයකට අත්සන් ගැනීම බවයි.


නිවේදකයා ඇසීය. පොලිස් ප්‍රකාශක පැවසුවේ පොලීසිය ට අනුව, ඔවුන් අපරාධකරුවන් මිස සැකකරුවන් නොවන බවයි.


නීතියට අනුව, ප්‍රශ්න කරන අවධියේදී හෝ ප්‍රශ්න කිරීම ට ලක්කිරීම ට පෙර ඕනෑම අයෙක් සැකකරුවෙකු පමණක් වන අතර චූදිතයෙකු ලෙස නම් කළ නොහැක. පුද්ගලයෙක් චූදිතයෙකු බවට පත්වන්නේ අධිකරණය ඉදිරියේ චෝදනා ගොනුකළ විට පමණි. කෙසේ වෙතත් පොලීසියේ නිල ප්‍රකාශකයා මෙම අර්ථදැක්වීම පිළිනොගනියි. ඔහු විසින් පවසන දෙය විසින් ශ්‍රී ලංකා පොලීසියේ නිල ස්ථාවරය නියෝජනය වන හෙයින්, මේ අනුව ඝාතන සිදුකිරීම හරහා පොලීසිය විසින් පුද්ගලයන් වරදකරුවන් බවට පත් කිරීමේ බලය අත්කරගෙන තිබේ. මේ අනුව, නිර්දෝෂී බවේ පූර්වනිගමනය ට තවදුරටත් කිසිදු අර්ථයක් නොමැති අතර පුද්ගලයෙකු විනිශ්චය කර ඔහු ට දඬුවම් නියම කිරීමේ තනි අධිකරණ පරමාධිකාරය ට ද කිසිදු අර්ථයක් නොමැත.

අපරාධ මර්දනය නමැති ව්‍යාජ හේතුව යටතේ අධිකරණයට පිටතින් සිදුකරන ඝාතනවල ඉහළයාම සහ නීත්‍යානුකූල භාවයේ අර්ථය අහිමි වී යාම එකවිට සිදුවීම, හුදෙක් පොලීසිය විසින් සිදුකරන හේතු දැක්වීම හා පොලීසියේ කටයුතු සීමා වීම සමග පමණක් සිදුවන්නක් නොවේ. එය මහේස්ත්‍රාත් අධිකරණය විසින් දුෂ්ට හැඩයක් ගනු ලැබීම නිසා ද සිදුවන්නකි. එනම්, පොලීසිය විසින් ම සිද්ධිය පිළිබඳ සකස් කරන වාර්තා මත පදනම් ව මහේස්ත්‍රාත්වරු බහුතර අවස්ථාවලදී ඒවා "යුක්ති සහගත මනුෂ්‍ය ඝාතන" ලෙස ප්‍රකාශය ට පත් කරති.

මහේස්ත්‍රාත්වරුන් මරණ පරීක්ෂණ සහ සෙසු පරීක්ෂණ සිදුකරන විට එහිදී රටේ පිළිගත් නෛතික ක්‍රියාපිළිවෙත ඔවුන් විසින් අනුගමනය කළ යුතු යැයි අපේක්ෂා කෙරේ. සියලු සැකකටයුතු මරණ පිළිබඳ, විශේෂයෙන් ම පොලීසියේ මෙහෙයවීම සැකකටයුතු වන අවස්ථාවල පරීක්ෂණ පැවැත්විය යුතු යැයි අපරාධ නඩු විධාන සංග්‍රහය මගින් ඔවුහු බැඳී සිටිති. සියලු සැකකටයුතු මරණවලදී නිසි නීති ක්‍රියාදාමය අනුගමනය කරමින් පරීක්ෂණ පැවැත්වෙන බව සහතික කිරීම මහේස්ත්‍රාත්වරුන්ගේ රාජකාරියයි. අදාළ ප්‍රදේශයේ පොලිස් ස්ථානයෙන් පැමිණිය හැකි පීඩනය රෝධනය කිරීම ට සමත් ස්වාධීන විමර්ශන ඒකක ද මෙම රාජකාරිය ට ඇතුළත් වේ. මෙම රාජකාරිය ඉටුකිරීම සඳහා මහේස්ත්‍රාත්වරුන් අසමත් වීම, ශ්‍රී ලංකාව තුළ නීත්‍යානුකූල භාවයේ අර්ථය නැති වී යාම තවදුරටත් විදහා දක්වන්නකි.

*1978 ආණ්ඩුක්‍රමය පිළිබඳ සාකච්ඡාවක් සඳහා බැසිල් ප්‍රනාන්දු ලියූ "ගයිජස්ගේ මුද්ද" කියවන්න.*




ගයිජස්ගේ මුද්ද
ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
Gyges' Ring by Basil Fernando හි
සිංහල පරිවර්තනය
ශ්‍රී ලංකාවේ බෙදාහැරීම:ස්ටැම්ෆර්ඩ් ලේක්




# ආසියාවට වැරදුණේ කොතැනද...?




**ජූනි 26 දිනට යෙදී තිබූ වධ හිංසා වින්දිතයන්ට සහයෝගය දැක්වීමේ එක්සත් ජාතීන්ගේ දිනය නිමිත්තෙන් ආසියානු මානව හිමිකම් කොමිසම සිදුකළ විශේෂ ප්‍රකාශය මගින් අවධාරණය කෙරුණේ වධ හිංසා සංස්කෘතිය අවසන් කිරීම සඳහා පොලීසිය ප්‍රතිසංස්කරණයට ලක්කිරීම පූර්ව අවශ්‍යතාවක් වන බවයි.**

වධ හිංසාව වැළැක්වීමට ගනු ලබන සියලු පරිශ්‍රමයන් නොතකා ආසියාතික රටවල් අති බහුතරයක වධ හිංසාව දිගින් දිගටම දැකිය හැකිය. සැබවින්ම ආසියාවට වැරදුණේ කුමක්දැයි ඒ ඒ රටට සුවිශේෂීව විශේෂඥයන් විසින් ඉදිරිපත් කරන මතයන් පෙළකි, මේ.

## 1 ප්‍රශ්නය : ඔබේ රටේ වධ හිංසාව බහුල ලෙස පැතිරී තිබෙනවාද?



බංග්ලාදේශය: බංග්ලාදේශයට වධ හිංසාව ආවේණිකයි. සෑම පොලිස් ස්ථානයක්ම හෝ පොලීසිය විසින් (හෝ වෙනත් නීති සාධක නියෝජිතායතන) අල්ලාගෙන තිබෙන ඕනෑම ස්ථානයක් වධ හිංසාව ක්‍රමානුකූලව - දිනපතාම භාවිතා කරන ස්ථානයක්. නීති සාධක නියෝජිතයන් හෝ ආරක්ෂක අංශ නැවතී සිටින, හෝ පසුකර යන, හෝ තාවකාලිකව නේවාසිකව සිටින, හෝ වීදියක්- නගරබද වුණත් ගම්බද වුණත් වධ හිංසාව සිදුවිය හැකි ස්ථානයක්.



බුරුමය: බුරුමයේ වධ හිංසාව ප්‍රධාන වශයෙන් විශේෂිත ස්ථාන දෙකක පුළුල් ලෙස පැතිරී තිබෙනවා. එනම් (1) පොලිසිය විසින් ප්‍රශ්න කරන සහ පුද්ගලයන් රඳවා තබාගන්නා රැඳවුම්



**බහුල වශයෙන් පහර දීම් සහ වේදනාව ඇති කර පාපොච්ඡාරණයක් ලබාගැනීමේ අරමුණින් යුතුව මොට ආයුධ ආදිය භාවිතයෙන් මෙය සිදුකරනවා. අස්වාභාවික ඉරියව් ලැබෙන පරිදි අත් පා ඇඹරීම සහ නැමීම හා අත්පා පිළිස්සීම මෙයට උදාහරණයක්.**

මධ්‍යස්ථානවල සහ (2) බුරුම හමුදාව සිටින-වාර්ගික සුළුතරයන් බහුතර වශයෙන් සිටින ප්‍රදේශවල. සාමාන්‍ය අපරාධ පරීක්ෂණයන්ගේ සහ අපරාධ පාලනයේදීත් වධ හිංසාව පුළුල් ලෙස පැතිරී තිබෙනවා. බහුල වශයෙන් පහර දීම් සහ වේදනාව ඇති කර පාපොච්ඡාරණයක් ලබාගැනීමේ අරමුණින් යුතුව මොට ආයුධ ආදිය භාවිතයෙන් මෙය සිදුකරනවා. අස්වාභාවික ඉරියව් ලැබෙන පරිදි අත් පා ඇඹරීම සහ නැමීම හා අත්පා පිළිස්සීම මෙයට උදාහරණයක්. මිනීමැරුම, ස්ත්‍රී දූෂනය සහ සොරකම වැනි අපරාධවලදී පොලීසියට වහාම ක්‍රියාත්මක වී ඉහළ අධිකාරියට මාසික වාර්තාවක් ලබාදිය යුතුයි. පොලීසියට ප්‍රශ්නය විසඳන්නට බැරි නම් හෝ නිවැරදි පුද්ගලයා සොයාගන්නට බැරිනම් ඔවුන් ප්‍රශ්නයට පැටලෙනවා වගේම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් හෝ ආණ්ඩුවේ පීඩනයට ලක්වන්නට ඔවුන්ට සිදුවනවා. එනිසා පාපොච්ඡාරණයක් ලබාගැනීම සඳහා ඔවුන් විසින් සැකකරුවන් ගණනාවක් අත්අඩංගුවට ගෙන ඒ පුද්ගලයන්ට වධ හිංසා පමුණුවනවා. ඔවුන් නිතරම චූදිතයා සඳහා පාපොච්ඡාරණයක් ලියනවා. ඒක නැවත නැවතත් කියවන්නට සලස්වනවා. එහෙමත නැතිනම් ඔවුන්ට එය මතක තබාගන්නට සලස්වනවා. පොලීසියට වධ හිංසා ක්‍රම රාශියක් තිබෙනවා. ඔවුන් ඒවා පාපොච්ඡාරණ ලබාගැනීම සඳහා නිල ක්‍රමවේදයන් වශයෙන් භාවිතා කරනවා. වාර්ගික සුළුතරයන් ප්‍රමුඛ වී සිටින ස්ථානවල තිබෙන විධිමත් රඳවා තබාගැනීමේ මධ්‍යස්ථානවල වධ හිංසාව සිදුවන්නේ කලාතුරකින්. නමුත් හමුදා කඳවුරුවල හෝ හුදෙකලා කඳුකර ගම්මානවල එය නිතර සිදුවෙනවා. වෙනම හෝ විශේෂිත වරදක් විදිහට වධහිංසාව නීතියට අනුව අපරාධමය නැහැ.



කාම්බෝජය : පොලිස් ප්‍රශ්න කිරීම් අතරතුරදී කාම්බෝජයේ වධ හිංසාව සුලභ ලෙස භාවිතා වෙනවා. පොලිස් ක්‍රමය ඉතාම ප්‍රාථමිකයි. එය කිසිම නූතනකරණයකට ලක්වී නැහැ. බන්ධනාගාරවල වධහිංසාව සිදුවීම ඉතා සුබල දෙයක්.



ඉන්දියාව: ඉන්දියාවේ වධ හිංසාව පුළුල් ලෙස පැතිරී තිබෙනවා පමණක් නොවෙයි, ඉන්දියාව වැනි රටක් වධහිංසාව නොමැතිව පාලනය කරන්නට බැහැ කියන දුර්මතයත් ආණ්ඩුව හිතාමතාම පතුරවනවා. මේ නිසා ඉන්දියාව තුළ වධ හිංසාව පුළුල් ලෙස භාවිතා කිරීම, නීතිය හා සාමය පවත්වාගෙන යාමට නැතිවම බැරි සංරචකයක් කියන හැඟීම ඇතිකිරීම මගින් සාධාරණීකරණය වෙනවා. ඒ විතරක් නෙවෙයි, 1860 දණ්ඩ නීති සංග්‍රහය මගින් වධ හිංසාව ආංශිකව අපරාධ වරදක් බවට පත්කර තිබුණත්, පැමිණිලි භාරගැනීම දිරිමත් කරවන සහ විමර්ශනයට හා ඒ පැමිණිලි අභිචෝදනයට අනුග්‍රහය දක්වන ස්වාධීන විමර්ශන යාන්ත්‍රණයක් නොමැති කම විසින් වධ හිංසාව පුළුල් ලෙස පැතිරීමට පහසුකම් සපයනවා. රාජ්‍ය නිලධාරීන්

විසින් බලය පාවිච්චි කිරීම, රජය විසින් සෑම ආකාරයකම දේශපාලන විසම්මුතීන්ට ප්‍රතික්‍රියා ලෙස දක්වන අසහාය සහ අපූරු ප්‍රතිචාරය වී තිබෙනවා. විමර්ශනයේදී සහ පිරිස් පාලනයේදී බලය පාවිච්චි කිරීමට පොලිස් පුහුණුවේදී ලැබෙන්නේ ප්‍රමුඛස්ථානයක්. අපරාධ විමර්ශනය සම්බන්ධයෙන් විද්‍යාත්මක විමර්ශන ක්‍රම සහ මනෝවිද්‍යාත්මක එළඹුම පොලිස් පුහුණුවේ ප්‍රමුඛ අංග නොවෙයි. මේ විදිහට පොලිස් නිලධාරීන් වධ හිංසාව ඇතුළත්ව බලය පාවිච්චි කිරීම සඳහා පුහුණු කිරීමත් ඒ සඳහා ඔවුන්ට ඉඩ ලබාදීමත් සිදුකරනවා. වධ හිංසාව ඇතුළත්ව බලය පාවිච්චි කිරීම නීතිමය වශයෙන් සාධාරණීකරණය වන බව සහ ඉන්දියාවේ පොලිස් නිලධාරීන්ගෙන් අපේක්ෂා කරන බව ඔවුන්ගේ දැඩි විශ්වාසයයි.



**ඉන්දුනීසියාව:** ඉන්දුනීසියාවේ වධ හිංසාව පුද්ගලයන්ට එරෙහිව විශාල වශයෙන් යොදාගන්නා. මේ පුද්ගලයන් වැඩි වශයෙන්ම අපරාධවල සැකකරුවන්. මේ පිළිබඳ ඉන්දුනීසියාවේ දේශීය රාජ්‍ය නොවන සංවිධාන ගණනාවක් පර්යේෂණ සිදුකර තිබෙන අතර ඔවුන් නිගමනය කර තිබෙන්නේ පොලීසිය විසින් සැකකරුවන්ගෙන් 70-80% අතර ප්‍රමාණයක් වධ හිංසාවට සහ අවමන් සහගත සැලකිලිවලට බඳුන් කරන බවයි. 2007 වසරේදී ඉන්දුනීසියාවට ගිය වධ හිංසාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරුත් මේ කරුණු හුවාදක්වා තිබෙන්නේ වධ හිසාව ජකර්තා සහ ඉන්දුනීසියාවේ වෙනත් කොටස්වල දෛනික භාවිතාවක් බව සඳහන් කරමින්. ගතවූ පස් වසර තුළ ආසියානු මානව හිමිකම් කොමිසමට ඉන්දුනීසියාවෙන් පුද්ගලයන්ට වධ හිංසා පැමිණවීම් පිළිබඳ සැලකිය යුතු වාර්තා ගණනක් ලැබී තිබෙනවා.



**නේපාලය:** නේපාලයේ වධ හිංසාව පුළුල් ලෙස පැතිරී තිබෙන අතර එය ඵලදායී අපරාධ විමර්ශන ක්‍රමෝපායයක් ලෙස විශ්වාස කෙරෙනවා. බලාත්මක නීතියක් හෝ යාන්ත්‍රණයක් වගේම අපරාධ විමර්ශන සිදුකිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් නැති නිසා වධ හිංසාව පුළුල් ලෙස පැතිරී තිබෙනවා. මේ නිසා නීති සාධක නියෝජිතායතන විසින් වධ හිංසාව සහ වධ දෙන බවට තර්ජනය කිරීම්, අපරාධ විමර්ශනයේ උපකරණයක් වශයෙන් භාවිතා කරනවා. අපරාධ විමර්ශකයන් විශ්වාස කරන්නේ අපරාධ විමර්ශනය නිරන්තරයෙන් සිදුකෙරෙන පදනම වන පාපොච්ඡාරණක් ලබාගැනීම සඳහා තමන්ට අයිතියක් තිබෙනා බවයි. අපරාධ විමර්ශනයේදී සැකකරුවන්ට සහ සාක්ෂිකරුවන්ට එරෙහිව බලය යොදාගැනීම සඳහා නීති සාධක නියෝජිතායතනවලට බලය තිබෙනවාය කියන හැඟීම ජනතාව අතරත් තිබෙනවා. එයට හේතුව ඔවුන් දන්නේ නැහැ, එහෙමත් නැතිනම් වෙනත් වචනවලින් කියනවා නම් ඔවුන්ට නිතරම කියා තිබෙනවා, සැකකරුවන් කෙරෙහි විතරක් නෙවෙයි, සාක්ෂිකරුවන් කෙරෙහි පවා සියලු ආකාරවල වධ හිංසාවන් යොදාගැනීම සඳහා ඔවුන්ට බලය තිබෙන බව.



**පාකිස්ථානය :** ඔව්, වධ හිංසාව ඉතාම පුළුල් ලෙස පැතිරී තිබෙන අතර පාකිස්ථානයට ආවේණික දෙයක් බවටත් පත්වී තිබෙනවා. සෑම පොලිස් ස්ථානයකම අවම වශයෙන් එක වධක කුටියක් හෝ තිබෙනවා. ඒකට හේතුව එවිට පොලීසියට චෝදනා කරන්නට බැහැ, ඔවුන්ගේ පරිශ්‍රය තුළ වධ හිංසාව සිදුවෙනවා කියා. සන්නද්ධ හමුදාව, විශේෂයෙන්ම කඳවුරු ප්‍රදේශවල වධක කුටි පවත්වාගෙන යන යුධ හමුදාවේත් තත්වය එයමයි. ගුවන් හමුදාව සහ නාවික හමුදාවත්, ඔවුන්ගේ මූලස්ථානවල පවා වධක කුටි පවත්වාගෙන යනවා.

## ප්‍රශ්නය 2 : වධ හිංසාව අපරාධ පාලනය කිරීම සඳහා තිබෙන හොඳම ක්‍රමය ලෙස සැලකෙනවාද?



**පිලිපීනය:** ඔව්, පිලිපීනයේ වධ හිංසාව කියන්නේ පොලීසිය සහ හමුදාව විසින් භාවිතා කරන නිල නොලත් ප්‍රමිතිගත ක්‍රමවේදයක්. සෑම අත්අඩංගුවට ගැනීමකදීම, ප්‍රශ්න කිරීමකදීම සහ රඳවා තබාගැනීමකදීම වධ හිංසාව විවිධ ප්‍රමාණවලින් යෙදෙනවා. කායික හෝ මානසික වධහිංසාවේ

ස්වභාවයෙන්. වධ හිංසාව භාවිතා කිරීම අත්‍යවශ්‍ය දෙයක් විදිහට පොලීසිය දැඩි ලෙස සලකනවා.



ශ්‍රී ලංකාව: ශ්‍රී ලංකාවේ පොලිස් වධ හිංසාව සෑම පොලිස් ස්ථානයකම පාහේ දිනපතා සිදුවෙනවා. ප්‍රශ්න කිරීමෙන් සරල ලෙසම අදහස් කරන්නේ වධ හිංසා පැමිණවීමයි. ප්‍රශ්න අහන්නත් කලින්ම මිනිසුන්ට වධ හිංසා පමුණුවනවා. ආසියානු මානව හිමිකම් කොමිසම ශ්‍රී ලංකාවේ පොලිස් වධ හිංසාව පිළිබඳ සිද්ධි 400 ක් අඩංගු පොතක් පළ කළා. වධ හිංසා පැමිණවීමට යොදාගන්නා ක්‍රම අතිශයින්ම සාහසිකයි.



තායිලන්තය: තායිලන්තයේ පොලීසිය, හමුදාව සහ වෙනත් රාජ්‍ය ආරක්ෂක අංශ විසින් මර්දනකාරී උපකරණයක් ලෙසත් දඬුවම් පැමිණවීමේ හුරුපුරුදු ආකරයක් ලෙසත් වධහිංසාව පුළුල් ලෙස යොදාගන්නවා. රටපුරාම පොලිස් ස්ථානවල සිදුකරන ප්‍රශ්නකිරීම්වලදී සහ/හෝ පාපොච්ඡාරණ ලබාගැනීමේදී පොලීසිය විසින් සැකකරුවන්ට වධ හිංසා පමුණුවනවා. පොලිස් ස්ථානයෙන් පොලිස් ස්ථානයට වධහිංසා පමුණුවන ක්‍රමවේදයන් වෙනස් වුණත් ඒ සෑම ස්ථානයකදීම නියත වශයෙන්ම වධහිංසාව භාවිතා කරනවා. දකුණු දිග තායිලන්තයේ හමුදා නීතිය සහ හදිසි නීතිය බලාත්මක වී වසර නවයක් ගතවී තිබෙන අතර වධහිංසාව සහ අත්තනෝමතික ලෙස රඳවාතබාගැනීම් ගැන පැමිණිලි කරන මිනිසුන් ට තර්ජන එල්ල වන බවටත් ඔවුන්ට දඬුවම් කරන බවටත් පුරවැසියන් වාර්තා කරනවා. ත්‍රස්තවාදය සමග සටන් කරනවා වෙනුවට රජයේ ආරක්ෂක අංශත් එහිම නියෝජිතයන් බවට පත්වෙලා.

## ප්‍රශ්නය 3 : ඔබේ රටේ වධ හිංසාව සහ බලෙන් මුදල් ලබාගැනීම එකිනෙකට සම්බන්ධද?



බංග්ලාදේශය: ඇත්තෙන්ම ඔව්! සැකයක් නැතිවම! පොලීසිය හිතාමතාම වධහිංසාව පාවිච්චි කර මිනිසුන්ගෙන් අල්ලස් ගන්නවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළත්ව නීතියේ කුමක් තිබුණත්, වධ හිංසාව සහ අල්ලස් ගැනීම සිදුවෙනවා. යථාර්ථයේදී රජයේ නියෝජිතයන් මිනිසුන් අත්අඩංගුවට ගන්නා විට කිසිම ආකාරයකින් නීතියට අනුකූලව එය සිදුකරන්නේ නැහැ. ඔවුන් රැඳවියන්ව වධ හිංසාවන්ට ලක් කරනවා. ඔවුන්ගෙන් මුදල් බලයෙන් ලබාගන්නවා. එය අවසානයක් නැතිව සිදුවෙනවා. ප්‍රතිකර්ම සොයන ජනතාවට මනා ක්‍රියාකාරිත්වයකින් යුතු අධිකාරීන් නැහැ. බංග්ලාදේශය නීතියේ ආධිපත්‍යය නොපතින සහ යුක්තිය අතුරුදන් වී ගිය රටක්.



බුරුමය: වධ හිංසාව සහ පොලිස් භටයන් විසින් සිදුකරන මුදල් බලයෙන් ලබාගැනීම හැමවිටකම එකකට එකක් සම්බන්ධිතයි. බුරුමයේ මූලික ගැටලුව තමයි, පොලීසියට නිසි ගෙවීමක් නැහැ. උදාහරණයක් විදිහට ඔවුන්ට මාසයකට ලැබෙන්නේ MMK 40,000 ක්. මෙය සමාන වන්නේ දළ වශයෙන් ඇමරිකානු ඩොලර් 40කට. ආදායමේ අඩුව පිරිමසා ගන්නට මුදල් බලයෙන් ලබාගන්නවා.



කාම්බෝජය: වධහිංසාව සහ මුදල් බලයෙන් ලබාගැනීම එකිනෙකට ඉතාම සම්බන්ධයි. පොලීසියේ දූෂණ ඉතා ප්‍රසිද්ධ දෙයක්. ඒ වගේම දූෂනය සහ මුදල් බලයෙන් ලබාගැනීම පාලනය කරන්නට යාන්ත්‍රණයක් නැහැ.



ඉන්දියාව: මිනීමරු පොලිස් නිලධාරීන් 'සටන් විශේෂඥයන්' විදිහට හැමවිටකම කීර්තියක් උසුළනවා. මාධ්‍ය විසින් පවා මේ හැඟීම කුළුගන්වනවා. මේ සටන් විශේෂඥයන් කියන්නේ



අපරාධකරුවන් යැයි සැකකරන පුද්ගලයන්ව වෙඩි තබා මරාදමන අයයි. වධහිංසාවට සක්‍රිය ලෙස සමාව දෙන සහ සියලු නීති සාධක නියෝජිතායනවල නිර්වචනමය ලක්ෂණය වේ යැයි අපේක්ෂා කරන රටක නීති සාධක නියෝජිතායන විසින් බලයෙන් ලබාගැනීමේ අර්ථයක් විදිහට ජනතාව තුළ බිය ඇතිකළ හැකි මගක් වශයෙන් වධ හිංසාව භාවිතාකිරීම ස්වාභාවිකයි. ඉන්දියාවේ දූෂනය සියලු මහජන අංශවල පුළුල් ලෙස පැතිරී තිබෙනවා. මුදල් බලයෙන් ලබාගැනීමේදී භාවිතාකරන වඩාත්ම සුලබ උපකරණය වශයෙන් රාජ්‍ය නියෝජිතායන විසින් වධ හිංසාව භාවිතා කිරීමේ ඉඩ අඩුකිරීමට හැකියාවක් නැහැ.



ඉන්දුනීසියාව : සැකකරුවන්ගෙන් මුදල් ලබාගැනීමේ අදහසින් පොලීසිය විසින් වධ හිංසාව භාවිතා කිරීමේ සිද්ධි විශාල වශයෙන් ඇති රටක් වශයෙන් මේ ගැටලු දෙක එකිනෙකට සම්බන්ධ බව කිව හැකියි. පොලිස් නිලධාරීන් ඉල්ලා සිටින මුදල් ලබාදීමට අසමත් වන හෝ එසේ ලබාදීම ප්‍රතික්ෂේප කරන සැකකරුවන්ට දඬුවම් කිරීම සඳහා නිතරම වධහිංසාව සහ අවමන් සහගත සැලකිලි යොදාගන්නා නිසාත් මේ ගැටලු දෙක එකිනෙකාට සම්බන්ධිතයි. නියමාකාරනේ සලකනවිට, යම්කිසි පුද්ලයෙක් පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන රඳවා තබාගත්තොත් ඔහු හෝ ඇයට මුදල් ටිකක් ගෙවන්න යැයි කියනවා. පොලීසිය කියන්නේ ඔහුගේ හෝ ඇයගේ ආහාරවලට හෝ වෙනත් දේවල්වලට මේ මුදල් අවශ්‍ය වන බවයි. මේ සියලු දේවල්වලට ආණ්ඩුවෙන් මුදල් වෙන්කර තිබෙන නිසා මේ භාවිතය නීතිවිරෝධී බවට සැකයක් නැහැ. සැකකරුවෙකුට තේරීම් කිහිපයක් නැති නිසා එම මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කිරීම මගින් වධහිංසාව සහ අවමන් සහගත සැලකිල්ල ප්‍රතිඵල වෙනවා.



නේපාලය : හරියට, වධ හිංසාව අපරාධයක් නොවන වෙනත් යම්කිසි අධිකරණ බල ප්‍රදේශයක පිහිටා තිබෙනවා වගේ, විනිර්මුක්තිය සමග වධ හිංසාවට ඇඳී සිටින නීති සාධක නියෝජිතායතන මුදල් බලයෙන් ලබාගැනීම සඳහා අවබෝධාත්මකව වධහිංසාව යොදාගන්නවා. විනය අඩුකම, අඩු වේතන සහ බහුල ලෙස පැතිරුණු දූෂනය, සිවිල් වැසියන්ගෙන් මුදල් ලබාගැනීම සඳහා උත්තේජක ලෙස ක්‍රියාකරන-එය දිරිමත් කරන සෙසු සාධක වෙනවා. සෙසු පුරවැසින්ගෙන් මුදල් බලයෙන් ලබාගන්නා අනෙක් පුද්ගලයනුත් රජයේ නීති සාධක නියෝජිතායතන හරහා වධ හිංසා පමුණුවන බවට තර්ජනය කිරීම මගින් එය සිදුකරනවා.



පාකිස්ථානය: වධ හිංසාව සහ මුදල් බලයෙන් ලබාගැනීම එකිනෙකට ඉතාම සම්බන්ධිතයි. වධ හිංසාවේ අරමුණ ව න්නේ තොරතුරු ලබාගැනීම පමණක් නොවෙයි. සාමාන්‍ය වශයෙන් සලකන විට එහි අරමුණ මුදල් බලයෙන් ලබාගැනීමයි. වධහිංසාවට ලක්වෙමින් සිටින අතර පවා මිනිසුන්, එම වධහිසාවේ සැර බාල කරවා ගැනීම සඳහා මුදල් ගෙවනවා. චූදිත මිනිසුන් පොලිස් භාරයට ගැනීමෙන් පසුව පොලීසිය දින කිහිපයක් ගත වන තෙක් ඔහුව/ඇයව නිසි පරිදි අත්අඩංගුවට ගන්නේ නැහැ. ඉන්පසුව ඇප ලබාගත හැකි වරදවල් සම්බන්ධයෙන් නඩු ගොනු කිරීම සඳහා අල්ලස් ඉල්ලනවා. අල්ලස් නොගෙව්වොත් එවිට එම තැනැත්තා, පොලීසියට අල්ලස් නොගෙවීම සඳහා දඬුවමක් වශයෙන් බරපතළ වරදක් යටතේ අත්අඩංගුවට ගන්නවා.



පිලිපීනය: යම්තාක් දුරකට ඔව්. ඓතිහාසිකව ගත්විට විසම්මුතිය මර්දනය කිරීම සඳහා වධහිංසාව යොදාගෙන තිබෙනවා. විශේෂයෙන්ම කොමියුනිස්ට්වාදීන්ට සහ මුස්ලිම් ගරිල්ලන්ට එරෙහිව. 1986 වසරේ මාර්කෝස් බලයෙන් පහවීමෙන් පසුව දේශපාලනමය උත්තේජකයක් සහිත වධහිංසාවන්ට අමතරව දේශපාලනමය නොවන වධහිංසා සිදුවීම් වැඩි වැඩියෙන් මතුවෙන්නට පටන් ගත්තා. මුදල් ලබාගැනීම සඳහා පොලීසිය විසින් සිදුකරන වධ හිංසා පැමිණවීම්ද මේ අතර වනවා. වධ හිංසාව

සහ මුදල් බලයෙන් ලබාගැනීම අතර සහ සම්බන්ධයක් තිබෙන බව මම හිතනවා. නමුත් මුදල් ලබාගැනීම සඳහා වධ හිංසා පමුණුවන බව වටහාගන්නට තරම් පිලිපීන හෘදසාක්ෂි දියුණු වී නැහැ. එය පැහැදිලිව වටහාගෙන නැහැ. මේ සම්බන්ධයෙන් සැලකිය යුතු ලේඛනගත කිරීම් නැත්තේ ඇයිද යන්නත් එමගින් පැහැදිලි කර දෙනවා.



ශ්‍රී ලංකාව: වධ හිංසාව සහ මුදල් ලබාගැනීම ගැඹුරු ලෙස එකිනෙකට සම්බන්ධිතයි. පැහැරගැනීම් සහ කුලියට මිනීමැරූ බවට සැකකරන්නන්ගෙන් පොලීසිය දරුණු ලෙස අපරාධකරණය වී තිබෙනවා. මිනිසුන්ට වධහිංසා පමුණුවන බවට තර්ජනය කිරීම මගින් වරදට ඉඩදීමෙන් සහ සැකකරුවන්ගේ ඥාතීන්ගෙන් මුදල් ලබාගන්නට පොලීසියට පුළුවන්. පොලිසිය විසින් මුදල් ලබාගැනීම පාලනය කළ හැකි සාර්ථක යාන්ත්‍රණයක් නැහැ.



තායිලන්තය: පොලිස් වධහිංසාව සාමාන්‍ය දෙයක්. දූෂනය පිටුදකින එලදායී ක්‍රම නැහැ. ඒ වගේම ස්වභාවිකව පොලිස් ක්‍රමයට දූෂනයයෙන් දැවැන්ත බලපෑමක් එල්ල වී තිබෙනවා.

## ප්‍රශ්නය 4 : ඔබේ රටේ වධහිංසාව වළක්වන්නට ආණ්ඩුවට දේශපාලනමය අභිමතයක්/කැමැත්තක් තිබෙනවාද?



බංග්ලාදේශය: වධ හිංසාව අවසන් කිරීම සඳහා බංග්ලාදේශයේ දේශපාලන අභිමතයක් නැහැ. පාලක දේශපාලන පක්ෂය විසින් '2011-වධ හිංසාව සහ රැකවරණ මරණ (වැළැක්වීමේ) පනත්කෙටුම්පත' යනුවෙන් නම් කර තිබෙන ව්‍යවස්ථාකරණය නොතකා හැර තිබෙනවා. 2011 මාර්තු සිට. පුද්ගලික සාමාජිකයන්ගේ පනත් කෙටුම්පත් සහ රෙගුලාසි පිළිබඳ පාර්ලිමේන්තු කමිටුව විසින් එම පනත් කෙටුම්පත සම්මත කරන්නට නිර්දේශ කර තිබුණත් එය පවා නොතකා හැර තිබෙනවා. පාලක දේශපාලන පක්ෂය දැනට සිදුවෙමින් පවතින මානව හිමිකම් උල්ලංඝනයන් අවසන් කිරීමට පොරොන්දු වී ඇති අතර 2008 මැතිවරණ ප්‍රකාශය මගින් වරදකරුවන් නීතිය ඉදිරියට පැමිණවීමට ත් පොරොන්දු වුණා. නමුත් මේ දක්වා ඒ කිසිවක් ඉටුකර නැහැ.



බුරුමය : ඔව්.. ඔවුන් හැමතිස්සෙම කියනවා. වධහිංසාව සහ අවමන් සහගත සැලකිල්ල නීතිවිරෝධී බවත් එය ජිනීවා සම්මුතියට පටහැනි බවත්. අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය පොලිස් විනය රීති සහ රෙගුලාසි ලියැවුණු කඩදාසි අලුත් කරන අතර විදේශ ආණ්ඩුවල දෙපාර්තමේන්තු සමග යම්කිසි පුහුණුවක් ලබාදෙනවා. ඒ වගේම ප්‍රශ්නකිරීම් පිළිබඳ අන්තර්ජාතික ප්‍රමිතීන් පිළිබඳ පුහුණුවීම් ලබාගන්නවා. පොලිස් ක්‍රමයේ ව්‍යුහය යම්කිසි වෙනසකට ලක්වෙලා. කොහොම වුණත්, දිස්ත්‍රික්, රාජ්‍ය සහ කොට්ඨාස පොලිස් ප්‍රධානීන් එන්නේ හමුදාවෙන්. මේ නිසා තමයි, වධ හිංසාව රටේ දිගින් දිගටම සිදුවන්නේ.



කාම්බෝජය: පොලීසිය ඇතුළු යුක්තික ආයතනවල තත්වය වැඩිදියුණු කිරීමට කාම්බෝජ ආණ්ඩුව කිසිම කැමැත්තක් මේ දක්වා පෙන්වා නැහැ. නීතියේ ආධිපත්‍යය වෙතට ප්‍රතිසංස්කරණ සිදුකිරීම දේශපාලන ක්‍රමය විසින් වළක්වනවා.



ඉන්දියාව: දූෂනය සහ දූෂනය නොනැවතී කරගෙන යාම, දේශපාලන අවනතභාවය සහ ආණ්ඩු බිහිවීම සඳහා පොදු සාධකයක් නිර්මාණය කරන දේශපාලන වාතාවරණයක් තුළ, විද්‍යාත්මකව සහ අපක්ෂපාතී ලෙස අපරාධ විමර්ශනය කරන පොලීසියක් තිබීම ඉන්දියාවේ දේශපාලකයන්ට සහ ප්‍රතිපත්ති තනන්නන්ට හොඳ පරිසරයක් නෙවෙයි. මේ අනුව ඔවුන් බලාපොරොත්තු වෙනවා, නීති සාධක

නියෝජිතායතන තවදුරටත් දූෂිත ව, සාමාන්‍ය පුරවැසියන්ට කෲර බවින් යුතුව සහ සෑම ආකාරයකම රජයේ අඥාවන් පුරවැසියන් මත ක්‍රියාත්මක කරවාවි කියලා. මේ තත්වය නිසා රජයේ ක්‍රියාවන් දේශපාලනමය ලෙස ප්‍රශ්න කරන්නට තිබෙන්නේ ඉතාම පටු-පොදු අවකාශයක්.

අද ඉන්දියාවේ තිබෙන පොලීසිය ප්‍රතිසංස්කරණය කරන්නට කිසිම ප්‍රතිපත්තියක් නොමැති තත්වයක් තුළ, වේගයෙන් දියුණු වන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක අවශ්‍යතා ඉටුකරන්නට සරිලන සිවිල් පොලීසියක් ඇති කරන තෙක් නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කිරීමට එරෙහිව තිබෙන විශාලතම ඒකල අවහිරය විදිහට වධ හිංසාව පවතීවි. ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වන්නේ ප්‍රතිසංස්කරණයන් සඳහා ප්‍රතිපත්තියක් නොමැති වීමයි.



ඉන්දුනීසියාව: වධ හිංසාවේ භාවිතය නවතන්නට ඉන්දුනීසියානු ආණ්ඩුවට කැමැත්තක් නැහැ. අද වන විට වධ හිංසාව පුළුල් ලෙස පැතිරී තිබෙනවා කියන කාරණයට අමතරව ආණ්ඩුවට මේ සම්බන්ධයෙන් කැමැත්තක් නැහැ යන්න ඉතාම පැහැදිලිව පෙනෙන කරුණක් වන්නේ වධහිංසාව තවමත් අපරාධ වරදක් බවට පත් කර නැත යන කාරණය සහ එවැනි ක්‍රියාවන්ට සම්බන්ධ පොලිස් නිලධාරීන්ට එරෙහිව පැමිණිලි ගොනු කරන්නට බලාපොරොත්තු වන වින්දිතයන්ගේ පවුල්වල උදව්යට සහ වින්දිතයන්ට කිසිම බලාත්මක සහ සුදුසු ආරක්ෂාවක් නැහැ යන කාරණයයි. වර්තමානයේ තිබෙන අපරාධ නඩු විධාන සංග්‍රහය සහ අපරාධ සංග්‍රහය සංශෝධනය කරන්නට ආණ්ඩුව බලාපොරොත්තු වෙනවා. මේ අනුව එම කෙටුම්පත සම්මත වුණොත් වධ හිංසාව තුරන් කිරීම සඳහා ඒකෙන් යම් දායකත්වයක් ලැබේවි. කොහොම වුණත් මේ සංශෝධන සැලැස්මත දැන් වසර ගණනක් තිස්සේ සම්මත කරනවාද නැත්ද යන්න ගැනත් සම්මුතිය




ක් නැතිව නිකම්ම නිකම් සැලසුමක් විදිහට තිබෙනවා.



නේපාලය: නීති සාධක ඒජන්සි විසින් සිදුකරන වධහිංසාවන් ඇතුළු කිසිම ආකාරයක අපරාධ මැඩ පවත්වන්නට ආණ්ඩුවට කැමැත්තක් හෝ හැකියාවක් නැහැ. ආණ්ඩුව රජයේ නියෝජිතායතන හික්මවන්න සහ පාලනය කරන්න උත්සාහ කළොත් ඒවා ආණ්ඩුවට විරුද්ධව සාමූහිකව කැරළි ගසයි කියලා ආණ්ඩුව බයයි. ඒ වගේම රජයේ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කරවන්නට සහ ඒවා සාදන්නට ප්‍රධාන භූමිකාවන් ඉටු කරන දේශපාලකයන්ගේ අපවාදාත්මක දූෂනයන් විසින් රාජ්‍ය නිලධාරීන් දූෂිත වීම සඳහා පහසුකම් සපයා දෙනවා.



පාකිස්ථානය: වධ හිංසාව නතර කිරීම සඳහා කිසිම බරපතළ පරිශ්‍රමයක් කිසිම බලධාරියෙකු විසින් දරන ආකාරය අප දැක නැහැ. වර්තමාන ජනාධිපතිවරයා දරුණු ලෙස වධ හිංසාවට ලක්වී සිටින අයෙක්. නමුත් ඔහුගේ දේශපාලන පක්ෂය, බලයේ සිටි පස් වසර තුළ, පොලිස් රැකවරණයේ සිටියදී සිදුවන වධ හිංසාවන්ට එරෙහිව නීතියක් සාදන්නට කිසිම මුලපිරීමක් කර නැහැ.



පිලිපීනය: යම්තාක් දුරකට ඔව්. නමුත් ආණ්ඩුව හොඳටම දන්නවා, පමණ ඉක්මවා මේ සඳහා පීඩනයක් එල්ල කළොත් එයින් ප්‍රබල බාධාවක් ඇති වන බව. පොලීසියේ සහ හමුදාවේ අදත් සිටින්නේ මාකෝස් යුගයේදී පුළුල් ලෙස සහ ක්‍රමානුකූල ලෙස පැතිරී තිබූ වධ හිංසා පැමිණිවීම්වලට සම්බන්ධ වූ අයමයි. ඔවුන් ට දඬුවම් ලැබී නැහැ. තමන්ගෙ දේශපාලන කැමැත්තේ සීමාව ආණ්ඩුව දන්නවා.



ශ්‍රී ලංකාව: නරක පොලිස් ක්‍රමයක් පවත්වාගෙන යන්නට ආණ්ඩුව නිහඬව අනුකූලතාවය දක්වන්නේ එය දේශපාලකයන්ගෙන් අති බහුතරයකට වාසිදායක නිසයි. වධ හිංසාවට එරෙහි නීතිය ක්‍රියාත්මක කරවන්නට කිසිම කැමැත්තක් නැහැ. වධ හිංසාව සම්බන්ධ චෝදනා පිළිබඳ විමර්ශන පැවැත්වීම නතර කර තිබෙනවා. CAT කමිටුවේ හෝ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනවල නිර්දේශ ක්‍රියාවට නැංවීමක් සිදු වී නැහැ.



තායිලන්තය : වින්දිතයන් සහ මානව හිමිකම් සුරක්ෂකයන් විසින් වධ හිංසාව නතර කිරීමට තායි ආණ්ඩුවට බලපෑම් කර තිබියදීත් අද දක්වාම කිසිදෙයක් සිදුවී නැහැ. රජයේ නිලධාරීන් විසින් වධ හිංසා පැමිණිලිවලට පිළියම් යෙදීමට යෝජනා වූ ස්වාධීන ආයතනය, ඒ කියන්නේ ජාතික දූෂණ විරෝධී කොමිෂන් සභාව සිය රාජකාරි ඉටුකිරීම සඳහා අවශ්‍ය වන හැකියාවෙන් සහ කැමැත්තෙන්ද ඌන මට්ටමක පවතිනවා. තමන්ට එරෙහිව වධ හිංසා පැමිණිලි ගොනු කරන රජයේ නිලධාරීන් හට, එම වින්දිතයන් විසින් පැමිණිලි ගෙනඒමට විරුද්ධව පීඩනය එල්ල කරන්නට ඉඩදීම මගින් අධිකරණය හිතාමතාම වින්දිතයන්ගේ අයිතිවාසිකම් අහිමිකර තිබෙනවා.

## ප්‍රශ්නය 5: පොලිසිය ප්‍රතිසංස්කරණය නොකළොත් වධ හිංසාව දිගින් දිගටම පවතීවි යැයි පැවසීම නිවැරදිද?



බංග්ලාදේශය: බංග්ලාදේශයේ පොලිස් ක්‍රමය සහ අධිකරණ ක්‍රමය සම්පූර්ණ ප්‍රතිසංස්කරණයකට ලක් නොකර වධ හිංසාවෙන් ආරක්ෂාවක් ලබන්නට හැකිවේ යැයි සිතන්නටවත් බැහැ.



බුරුමය: අපරාධ නඩුවලදී දිගුකාලීනව වධ හිංසාව තුරන් කිරීමට නම් බුරුම පොලිස් බලකාය ඉතා ප්‍රබල ප්‍රතිසංස්කරණවලට ලක්කළ යුතුයි. අපරාධ චෝදනා සඳහා රඳවා තබාගෙන සිටින

මිනිසුන්ව බුරුම පොලිස් බලකාය විසින් 'අතිශයින්ම' දරුණු 'ශාරීරික' වධහිංසාවන්ට ලක් කරනවා. අධිකරණය ස්වාධීන සහ ශක්තිමත් විය යුතුමයි.



කාම්බෝජය: නීතිය සහ යුක්තිය සමස්තයක් වශයෙන් මූලික ප්‍රතිසංස්කරණයකට ලක් නොකර පොලිස් ස්ථානවලත් බන්ධනාගාරවලත් වධ හිංසාව භාවිතාවීම වළක්වන්නට ක්‍රමයක් නැහැ. 1993 වසරේ නව ආණ්ඩුක්‍රමයක් පනවාගත්තත් තවමත් ප්‍රබල ලෙස පවතින්නේ පැරණි ක්‍රමයේ පරිපාලනයයි. බලතල බෙදීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබුණත් එය ප්‍රායෝගිකව හඳුනාගෙන නැහැ. මේ ක්ෂේත්‍රයේ මූලික ප්‍රතිසංස්කරණ සිදුනොවුණහොත් වධ හිංසාව දිගින් දිගටම භාවිතා වේවි.



ඉන්දියාව: ඔව්



ඉන්දුනීසියාව: ඒක හරියටම හරි. ඉන්දුනීසියාවේ වර්තමාන නෛතික සැකැස්ම පුද්ගලයන්ට විනිර්මුක්තියෙන් යුක්තව වධහිංසා පමුණුවන්න ඉතා විශාල අවකාශයක් ලබාදෙනවා. අධිකරණයේ කිසිම අධීක්ෂණයකින් තොරව පොලීසියට සැකකරුවන් දින 60කටත් අධික කාලයක් රඳවා තබාගන්නට පුළුවන්. මේ කාලය තුළ යම්කිසි හිංසාවක් සිදුවුණොත් ඔවුන්ට කරන්නට පුළුවන් කම තිබෙන්නේ, පොලීසියට වාර්තා කිරීම පමණයි. නමුත් වධ හිංසා පමුණුවන්නේත් පොලිසියම නිසා ඔවුන් ඒ ගැන කිසිම ක්‍රියාමාර්ගයක් ගන්නේ නැහැ.

අවශ්‍ය වන්නේ නෛතික සහ විධිමත් ප්‍රතිසංස්කරණ විතරක් නෙවෙයි. එම ප්‍රතිසංස්කරණ ස්වාධීන ගැටලු ආමන්ත්‍රණය කරන්නටත් සමත් විය යුතුයි. උදාහරණයක් වශයෙන්, අද වන විට පොලීසිය අභිචෝදකයන්ගෙන් සහ අධිකරණයෙන් ආයතනයික ලෙස වෙන්වී තිබුණත්, වධ හිංසා සිද්ධිවලදී ඔවුන්ගේ බලතල අභිචෝදනය සහ නඩුවාර අවධිය දක්වාම දීර්ඝ වන බව පේනවා. ඔවුන්ට අභිචෝදකයන්ටත් අධිකරණයටත් බලපෑම් කරන්නට පුළුවන්. වධ හිංසා සිදුකරන පොලිස් නිලධාරීන් සාපරාධී වරද සඳහා චෝදනා ලබන සහ නඩු විභාගවලට ලක්කරන දුර්ලභ ගණයේ සිදුවීම්වලදී ඒ සම්බන්ධයෙන් ලැබෙන දඬුවම් අතිශයින්ම සැර අඩුයි. ඒ වගේම නඩුතීන්දුවලින් සැබවින්ම සිදුවූ දෙය විදහා දැක්වෙන්නේත් නැහැ.



නේපාලය: පොලීසිය ප්‍රතිසංස්කරණවලට ලක්කිරීම කෙරෙහි වෙනස් දෘෂ්ටිකෝණයන්ගෙන් බැලිය යුතුයි. සම්පත්, පුහුණුව සහ වගවීමත් වධ හිංසාව අපරාධ වරදක් බවට පත්කිරීමත් ඇතුළුව පොලිස් බලකාය ක්‍රියාත්මක වන නෛතික රාමුව තුළ සිදුකරන වෙනස්කම් එයට ඇතුළත් වෙනවා. දැන් පවතින තත්වය මගින් දූෂනයට සහ ආණ්ඩුවේ සියලු ආකාරවල වගවීමක් රහිත බවට පහසුකම් සලසන නිසා නේපාලයට සිවිල් පොලීසියක් ගෙන එන්නට බලයේ සිටින්නන් හට අවශ්‍ය නැහැ.



පාකිස්ථානය: පොලිස් ක්‍රමය ප්‍රතිසංස්කරණයට ලක් වුවහොත් වධ හිංසාව යම්තාක් දුරකට අඩුවේවි. නමුත් වධ හිංසාව භාවිතාකිරීමට විරුද්ධව සිවිල් සමාජය ප්‍රතිරෝධී වෙන තෙක්, වධ හිංසාව භාවිතයට එරෙහිව ඔවුන් විරෝධය පළ කරන තෙක් එය නතර කරන්නට බැහැ. අප වධ හිංසාවට එරෙහිව සටන් කරන විට, මේ දඬුවම් නැතිව සමාජය පවිත්‍රකරන්නට බැහැ කියා මනස සකස් වී තිබෙන ආකාරය එක්කයි, ඇත්තෙන්ම අපි සටන් කරන්නේ. ධනවත් තැනැත්තන් තමන්ගේ සේවකයන්, අතවැසියන් සහ අප්‍රධානීන්ව වධ හිංසාවට ලක් කරන්නට පොලීසියට අල්ලස් දෙනවා. අනෙක් ගැටලුව තමයි, පොලිස් නිලධාරීන්ට අල්ලස් නොගත්තොත් තමන්ගේ අවස්ථා අහිමි වෙනවා. වධ හිංසාව මෙතරම් පැතිර පවතින්නට බලපා තිබෙන අනෙක් වැදගත් හේතුව තමයි, පාකිස්ථානයේ බලවත් මිනිසුන්ගේ බිය. ඒ කියන්නේ ඔවුන් සිතනවා, වධහිංසාවට සාමාන්‍ය මිනිසුන් තුළ තිබෙන බිය නැති වුණොත් පාකිස්ථාන ජනතාව පරිපීඩන තත්වයෙන් තබාගන්න බැහැ කියලා. බිය නැති වුණොත් ඔවුන් නිදහසේ සිතයි කියා බයයි.



**පිලිපීනය:** ඔව්. එය පටන් ගත යුත්තේ පොලීසියෙන්. 1986 ට කලින් අපේ පොලිසිය සහ හමුදාව ක්‍රියාකළේ සහ මෙහෙයවනු ලැබුවේ එකම ආඥප්තිකයක් විදිහටයි. ඔවුන්ට එක හා සමාන පුහුණුවක් ලැබුණා. 1986 න් පසුව පොලීසිය සහ හමුදාව ව්‍යුහාත්මක වශයෙන් වෙන් වුණා. කොහොම වුණත් විධිමත් විදිහට වෙන් වුණා කියන කාරණය පසෙක තිබියදී ඔවුන් තවමත් ක්‍රියාකරන්නේ මාකෝස් යටතේ වැඩකළ විදිහටමයි. සිද්ධාන්තයක් විදිහට සැලකුවොත් අපේ පොලීසිය සිවිල්. නමුත් ප්‍රායෝගිකව ඒක එහෙම නැහැ.




**ශ්‍රී ලංකාව:** ඒක සම්පූර්ණයෙන්ම ඇත්ත. නමුත් ආණ්ඩුව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන සංශෝධනය පනවා ගැනීම මගින් සිදුකළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවමය වෙනස්කම් නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවමය ප්‍රතිසංස්කරණ නොමැතිව පොලිසිය ප්‍රතිසංස්කරණය කරන්නට බැහැ. ඒ ප්‍රතිසංස්කරණ සිදුවන තෙක් පොලිස් වධ හිංසාව ශ්‍රී ලංකාවේ බරපතළ ප්‍රශ්නයක් විදහට ඉතුරු වෙලා තියේවි.



**තායිලන්තය:** අවශ්‍ය වී තිබෙන්නේ පොලිස් ප්‍රතිසංස්කරණ සමග අනුගාමී ලෙස අධිකරණයේ ද ප්‍රතිසංස්කරණ සිදුවීමයි. ඒ වගේම මානව හිමිකම් පිළිබඳ අධ්‍යයනය බිම් මට්ටමෙන් පුළුල් ලෙස පැතිරී යාමත් අවශ්‍යයි. අපරාධ සමග සටන් කිරීම සහ අපරාධ සිදුකළ පාපීන් සමග වැඩකිරීම පිළිබඳ තම එළඹුම පොලීසිය විසින් රැඩිකල් විදිහට වෙනස් කළ යුතුයි. නිර්දෝෂී බව ඔප්පු වන තෙක්ම චූදිතයාට සලකන්නේ වරදකරුවෙකු ලෙසයි. මෙමගින් බරපතළ අමානුෂිකත්වයක් බිහි කරනවා. මෙය වධහිංසාවට පහසුකම් සලසනවා වගේම එකවිටම ආමන්ත්‍රණය කළ යුතු අභියෝග ද නිර්මාණය කරනවා.

යූ ටියුබ් වීඩියෝව නරඹන්න :http://www.youtube.com/watch?v=2hyF4KP-vvU

# දුගඳ - දේශපාලන මේසය



පඩ හඬය පඩ ගඳය
දේශපාලන මේසයේ
බඩජාරීන් වමාරති
වේදිකා කාණුවේ
මහා මැසි උවදුරකි
ඒ කුඩා දේශයේ

බැසිල් ප්‍රනාන්දු
චීන ගෙදර කිරිල්ලියගේ ගීතය- පිටුව 13




# කලුතර දකුණ පොලීසිය වෘෂණ කෝෂවලට ලී අතකොලුවකින් කොටති.

**ආසියානු මානව හිමිකම් කොමිසම 1984 වර්ෂයේ පටන් ආසියානු රටවල මානව හිමිකම්වල තත්වය සහ ගැටලු වාර්තාකරණයේ යෙදී සිටියි. පහත දැක්වෙන්නේ ඔවුන් විසින් වඩාත් මෑතකාලීනව වාර්තා කළ කලුතර දකුණ පොලිස් නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන වධ හිංසා පැමිණවූ තවත් එක් ශ්‍රී ලාංකිකයෙකුගේ කතාන්දරයයි.**

---

ජාතික හැඳුනුම් පත් අංක 800361842 දරණ අංක C 15, ගල්විල ගාව නිවස, වෙලන්ගල්ලේ ගැටතැන්න හි පදිංචි කෝපියාවත්තගේ දොන් චමින්ද ප්‍රියන්ත කුමාර (32 හැවිරිදි) විවාහකයෙක් සහ දරු දෙදෙනෙකුගේ පියෙකි. ඔහු කළුතර දිස්ත්‍රික්කයේ නාගොඩ මහ රෝහලේ ආදේශක සෞඛ්‍ය සහායකයෙකු ලෙස රැකියාව කරයි.

2013 මැයි 21 වැනිදා සවස 8.30 ට, තමන් නේවාසිකව සිටින නිවසට යාම සඳහා බසයක නැගෙනු පිණිස ගල්ලස්සන හන්දියේ කුමාර බලා සිටින අතර මිනිසුන් දෙදෙනෙක් ඔහු වෙත පැමිණ ජංගම දුරකථනයක් සොරකම් කිරීම සම්බන්ධයෙන් ඔහුට චෝදනා කර තිබේ. කුමාර එම චෝදනා ප්‍රතික්ෂේප කළ විට එම



පොලීසියේ කෲර -අමානුෂික සහ අවමන් සහගත සැලකිලි හා වධ බන්ධනවලට ලක් වූ ප්‍රියන්ත

පුද්ගලයන් දෙදෙනා පොලීසිය අමතා තිබේ.

සුලු වේලාවක් ඇතුළත පොලීසිය පැමිණි අතර කලුතර දකුණ පොලිසියේ අපරාධ පොලිස් ස්ථානාධිපති (ඕඅයිසී) ගේ මෙහෙයවීම මත නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත පොලිස් කණ්ඩායමක් විසින් කුමාරව අත්අඩංගුවට ගන්නා ලදී. අත්අඩංගුවට ගැනීමෙන් පසු ඔහුව ජීප් රථය තුළට දමාගත් අතර එහි පසුපස කොටසේ බිම වාඩි කරවිණි. ජීප් රථය ගමන් කරන අතර පොලිස් ස්ථානාධිපතිවරයා කුරුඳු ගසකින් කපාගත් පොල්ලකින් කුමාරට පහරදීම ආරම්භ කළේය. ඔහුව පොලිස් ස්ථානයට රැගෙන ගිය අතර එතැනින් අපරාධ පොලිස් ස්ථානයට ගෙන යන ලදී. ඉන්පසු ඔහුව අත්අඩංගුවට ගත් පොලිස් නිලධාරීන්ගෙන් එක් අයෙක් එම කුරුඳු පොල්ලෙන් නැවත පහර දීම ආරම්භ කළේය. පෙර සිදුවූ හදිසි අනතුරකින් කුමාරට සිය වම්අත වැළමිටට පහළින් අහිමි වී තිබූ නිසා පොලිස් නිලධාරීන් හිතාමතාම ඔහුගේ දකුණු අතට පහරදී ඇත්තේ ඒ අතත් කඩා දමන බව කියමිනි. ඉන්පසුව ඔහුව කූඩුවකට දමන ලද අතරපසුදා උදෑසන වන තෙක්ම ඔහුව එහි තබනු ලැබිණි.

*'පහුවදා උදේ 9 ට ඒ පොලිස් නිලධාරීන් තුන්දෙනාම ඔහුව නැවතත් අපරාධ අංශයට අරන් ගියා. කලින් සූදානම් කරල තිබුණු ලියවිල්ලකට අත්සන් කරන්න කිව්වා. තවත් වධ දෙයි කියන බයට ඔහු ඒකට අත්සන් කළා. නමුත් ඒකෙ තිබුණු දේ ගැන කිසිම දෙයක් දැනගෙන හිටියෙ නැහැ කියල ඔහු දිවුරනවා. ඊළඟට ඔහුව පොලිසිය පිටිපස්සෙ තිබුණු නානකාමරයකට එක්ක ගිහින් ඇඳුම් ගැළෙව්වා. උඩ බලාගෙන ඉඳපන් කියලා බංකුවක නිදාගන්න කිව්වා. ඊට පස්සෙ එක පොලිස් නිලධාරියෙක් ලී අතකොලුවක් අරන් වෘෂණ කෝෂවලට කෙටුවා. ඊට පස්සෙ වළලුකරවලට මාංචු දාලා කඹයකින් බංකුවට ගැටගහලා තිබ්බා. ඊට පස්සෙ එක පොලිස් නිලධාරියෙක් ජනෙල් පඩිය උඩට නැගලා කුමාරගෙ පපුවට පැන්නා.*



*ඊට පස්සෙ කුමාරව ගැටගහල තිබ්බ බංකුව බිත්තියක් ළඟට අරන් ගියා. ඒ බිත්තියෙ හෝස් පයිප්පයකුයි ටැප් එකකුයි තියෙනවා. එක පොලිස් නිලධාරියෙක් කුමාරව කකුල් පළල් කරලා බංකුවෙ ඉන්දෙව්වා. අනෙක් කෙනා ඇස්වලට රෙදි කෑල්ලක් ගැට ගහලා නහයටත් කටටත් වතුර යන විදිහට හෝස් බටය ඇල්ලුවා. ඒ අතරෙම එක පොලිස්කාරයෙක් කුරුඳු පොල්ලක් අරන් කුමාරගෙ යටි පතුල් වලට තළන්නට පටන් ගත්තා. පොලිස් නිලධාරීන් මාරුවෙන් මාරුවට කුමාරගෙ මුහුණට හෝස් බටය ඇල්ලීමත් ඔහුට තැළීමත් කළා. වතුර පෙවෙන විට කුමාර දරාගන්න බැරි වේදනාවකින් කෑ ගහලා නතර කරන්න කියලා පොලිස් නිලධාරීන්ට පින්සෙණ්ඩු වුණා.*

බටය ඇල්ලීය. ඒ අතර එක් පොලිස්භටයෙක් කුරුඳු පොල්ලක් ගෙන කුමාරගේ යටි පතුල්වලට තළන්නටපටන් ගත්තේය. පොලිස් නිලධාරීහු මාරුවෙන් මාරුවට කුමාරගේ මුහුණට හෝස් බටය ඇල්ලීමට සහ ඔහුට තැළීමට පටන් ගත්හ. වතුර පෙවෙන විට කුමාර දරාගත නොහැකි වේදනාවකින් කෑ ගසන්නට පටන් ගත් අතර තමන්ට වධ දීම නතර කරන්නැයි පොලිස් නිලධාරීන්ට පින්සෙණ්ඩු විය.

මද වේලාකට පසු පොලිස් නිලධාරීන් කුමාරව නිදහස් කළ අතර ඔහුව සෝදවා, ඇඳුම් අන්දා පොලිස් ස්ථානය තුළ වූ ආපන ශාලාවට ගෙන ගොස් එහි වූ පුටුවක ඉන්දවූවෝය. අශික්ෂිත වදන් කියමින් ඔවුන් ඔහුට කෑ ගැසූ අතර සෞඛ්‍ය සහායකයෙකු ලෙස කරන රස්සාවෙන් දොට්ට දමන්නේ යැයි තර්ජනය කළහ. තමන්ට එරෙහිව නැගුණු චෝදනා කුමාර තවදුරටත් ප්‍රතික්ෂේප කළේය. ඉන්පසු ඔවුහු කුමාරගේ ගෙළ වටේ හෝස් පයිප්පයක් එතූ අතර පොලිස් නිලධාරීන් දෙදෙනා ඔහුට තවදුරටත් තර්ජනය කරන අතරතුර එම හෝස් පයිප්පය ඔවුන් විසින් ඇදීම සිදුකළේ ඇත්ත කියන ලෙස බල කරමිනි. සිය භීතිය සහ වේදනාව නොතකා කුමාර තවදුරටත් එම චෝදනා ප්‍රතික්ෂේප කළේය.

ඉන්පසු ඔහුව ඕඅයිසී කාර්යාලය වෙත ගෙන ගිය අතර ඕඅයිසීවරයා ඉදිරිපිට දණ ගස්වන ලදී. එසේ දණ ගසා සිටින අතර ඕඅයිසීවරයා කුරුඳු පොල්ල ගෙන ඔහුගේ හිසට සහ උරහිස්වලට පහර දෙන්නට පටන් ගත්තේය. කාර්යාලයේ කුරුඳු පොලු කිහිපයක් තිබෙන බව කුමාර දුටුවේය.



ඉන්පසු ඔවුන් විසින් ඔහුගේ ඉණ වටේට දම්වැලක් දමා එම දම්වැලේ අනෙක් කෙළවර මේස කකුලක ගැටගසා කාර්යාලය තුළ දණගාගෙන යන ලෙස ඔහුට නියෝග කළේය. ඔහු එසේ කරන අතර ද ඔවුන් විසින් ඔහුට තවදුරටත් පහර දීම සිදුකරන ලදී. ඉන්පසු ඔහුට නැගිටින ලෙස කියූ අතර එසේ නැගිටි පසු පොලිස් ස්ථානාධිපතිවරයා සිය බූට් සපත්තුවලින් ඔහුගේ ඇඟිලි පොඩිවන සේ පෑගීය.

මේ අවමන් සහගත සැලකිලිවලින් පසුව කුමාරව ජීප් රථයට දමාගෙන පොලිසිය විසින් ඔහුගේ ලැගුම්හළ වෙත ගිය අතර වරෙන්තුවකින් තොරව පොලීසිය ඔහුගේ කාමරය සෝදිසි කළෝය. මද වේලාවක් එසේ සෝදිසි කිරීමෙන් පසුව ඔහුගේ ජාතික හැඳුනුම්පත, රියැදුරු බලපත්‍රය, රෝහල් හැඳුනුම්පතක් සහ ඔහුට අයත් සිම් කාඩ්පත් තුනක් සොයාගන්නා ලදී. ඒ අතර පිරිසිදු ටී ෂර්ටයක් ඇඳගන්නට යැයි ඔහුට අණ කෙරිණි.

නවාතැන් පොළේ සිට කුමාරව නාගොඩ මහ රෝහලට සහ ජේඑම්ඕ කාර්යාලට ගෙන යන ලදී. එම කාර්යාලය තුළට ගෙන යාමට පෙර කුමාරගේ කමිසය ගළවා නිලධාරීන් විසින් ඔහුට ඇවිදින්නට යැයි කීවේ නොණ්ඩිගැසීමකින් තොරව ඔහුට එසේ ඇවිදියහැකිදැයි බැලීම සඳහා ය. ඉන්පසු ඔහුට නැවතත් කමිසය ඇඳගන්නට යැයි පවසා වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කෙරිණි.

වෛද්‍යවරයා පොලිස් නිලධාරීන්ට එළියෙන් සිටින ලෙස පැවසුවේ සිය තුවාළ සහ ඒවා සිදුවූ ආකාරය ඔහුට පැහැදිලිකර දීමට ඉඩ ලබාදෙමිනි. ඉදිමුණු වෘෂණකෝෂ, ශරීරයේ තඩිස්සි වීම්, සීරීම් සහ යටිපත්ලේ ලේ ගලන තුවාළ එම තුවාළවලට ඇතුළත් වූ අතර ඔහුගේ පිටේ, උරහිස්වල සහ අත්වල ද තුවාළ දක්නට ලැබිණි. ඔහු නියමාකාරයෙන් ඇවිදීමටද අපොහොසත් විය. වෛද්‍යවරයා මුණගැස්වීමෙන් පසුව නිලධාරියෝ ඔහුව නැවතත් පොලිස් ස්ථානය වෙත ගෙන ගියෝය.


ඔවුන්ගේ පැමිණීමෙන් විනාඩි දහයක් ඇතුළත ඔහු කලුතර අතිරේක මහේස්ත්‍රාත් වෙත ඉදිරිපත් කරන ලදී. පොලිස් නිලධාරීන් විසින් මහේස්ත්‍රාත්වරයා සමග කතා කරන තෙක් ඔහුට කූටියෙන් පිටත රැඳී සිටීමට සිදුවිය. ඉන්පසු ඔහුව බන්ධනාගාර නිලධාරීන් වෙත භාර කරන ලදී. මහේස්ත්‍රාත්වරයා හට ඍජුව කතාකිරීමට ඔහුට නොහැකි වූ නිසා තමන් මුහුණ දුන් දුෂ්කර තත්වය පිළිබඳ පැවසීමට ඔහුට හැකිවුණේ නැත.

කලුතර රිමාන්ඩ් බන්ධනාගාරයට පැමිණි වහාම වාගේ ඔහු සිහිසුන් විය. සිහිය ලද පසු බන්ධනාගාර නිලධාරීන් ඔහුගේ තත්වය පිළිබඳ විමසීම් කළ අතර පොලිසියේ භාරයේ සිටියදී තමන්ට සිදුවූ දෙය ඔහු ඔවුන්ට විස්තර කළේය. ඉන්පසු ඔහුව බන්ධනාගාර රෝහලේ නතර කළ අතර එහිදී ඔහුගේ ප්‍රකාශය සටහන් කරගන්නා ලදී. මැයි 31 වැනිදා ඔහුව නැවතත් කලුතර මහේස්ත්‍රාත් වෙත ඉදිරිපත් කරන ලද අතර රුපියල් 15,000 ක ශරීර ඇපයක් නියම කරන ලදී. කිසිම අවස්ථාවක ඔහු වෙනුවෙන් නීතීඥයෙක් පෙනීසිටියේ නැත. ඇප අත්සන් කිරීමට කිසිවෙක් නොසිටි නිසා ඔහුව නැවතත් රිමාන්ඩ් බන්ධනාගාරය වෙත ගෙන ආවේය. ජූනි 3 වැනිදා ඔහුව රිමාන්ඩ් බන්ධනාගාරයෙන් නිදහස් කළ අතර 2013 සැප්තැම්බර් 13 වැනිදා කලුතර මහේස්ත්‍රාත් ඉදිරිපිට පෙනී සිටින ලෙස පවසන ලදී.


තමන් නිදහස් කළ වහාම ඔහු තමන්ට අයත් දෑ ලබා ගැනීම සඳහා කලුතර දකුණ පොලිස් ස්ථානයට ගියේය. පොලිස් ස්ථානාධිපති හමුවූ විගස ඔහු කෑ ගසා ඇත්තේ 'අපි උඹට විරුද්ධව තවත් නඩුවක් දානව කියල තැපෑලෙන් දැනුම් දෙන්න හිටියේ' යැයි කියමිනි. ඔහුට අයත් දෑ එකතු කරනා තෙක් පොලිසිය තුළ සිටින ලෙසත් ඕඅයිසීවරයා ඔහුට කියා තිබේ. පැය පහක් පමණ එසේ සිටීමෙන් පසුව ඔහුට කියා ඇත්තේ ගෙදර යන ලෙසත් වෙනත් දවසක එන ලෙසත් ය.

තමන්ව නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගත් බවත්, රඳවාතබාගත් බවත්, වධ හිංසාවන්ට ලක් කළ බවත්, කලුතර පොලිසියේ රාජකාරි කරන නිලධාරීන් තමන්ට විරුද්ධව බොරු නඩු ගෙන එන බවටත් කුමාර චෝදනා කරයි. ඔහු ප්‍රබල ලෙස මේ චෝදනා ප්‍රතික්ෂේප කරන අතර පොලිස්පතිවරයා වෙත සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම වෙත පැමිණිලි කර තිබේ. මෙයින් කිසිම අධිකාරියක් ඔහුගේ පැමිණිලිවලට ප්‍රතිචාර දක්වා නැත.

## කුමාර යුක්තිය අයදියි.



අනේ අපි කවදාක හිනැහෙමුද මේ රටේ




### ලෙයින් ලියැවුණු

# වධ හිංසා සිද්ධි 400 ක්

## වැටත් නියරත් ගොයම් කන හැටි

*ශ්‍රී ලංකාවේ වධහිංසාව පිළිබඳ වත්මන් තත්වය කිව නොහැකි තරම් අප්‍රිත බව පමණක් කෙටියෙන් කිව හැකිය. පහත දැක්වෙන්නේ ආසියානු නීති සම්පත් මධ්‍යස්ථානය විසින් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ සිදුකළ සවිස්තරාත්මක වාර්තාකරණයක තවත් ප්‍රතිඵලයක් ලෙස එළිදුටු නවතම ප්‍රකාශනය පිළිබඳ කෙටි විස්තරයකි.*

ආසියානු නීති සම්පත් මධ්‍යස්ථානය හෙවත් ආසියානු මානව හිමිකම් කොමිසමේ සහෝදර ආයතනය 'Narrative of Justice in Sri Lanka' නමින් වධ හිංසා වින්දිතයන්ගේ කථාන්දර එකතුවක් මෙසේ එළි දක්වයි. මෙම ග්‍රන්ථය පිටු 736 කින් සමන්විත ය.

ආසියානු මානව හිමිකම් කොමිසම සහ ආසියානු නීති සම්පත් මධ්‍යස්ථානය විසින් දස වසරකට අධික කාලයක් මුළුල්ලේ පර්යේෂණයට ලක් කළ සහ ප්‍රකාශනය කළ වධ හිංසා පැමිණිවීම් 2,000කට අධික ප්‍රමාණයක් අතරින් සිද්ධි 400 ක සැබෑ කතාන්දරයන් මේ පොත මගින් වාර්තා කරයි. මෙම තොරතුරු ලබාගැනීම සඳහා වධ හිංසා වින්දිතයන් සමග සවිස්තරාත්මකව සාකච්ඡා කරන ලදී. ආසියානු නීති සම්පත් මධ්‍යස්ථාන පර්යේෂකයන් විසින් දීර්ඝ කාලයක් මුළුල්ලේ මේ සිද්ධි අධ්‍යයනය කර ඇති අතර වධ හිංසා වින්දිතයන්ගේ පැමිණිලි ශ්‍රී ලංකාවේ බලධාරීන් සහ අධිකරණවලට ඉදිරිපත් කිරීමටද ආසියානු මානව හිමිකම් කොමිසම සහ ආසියානු නීති සම්පත් මධ්‍යස්ථානය පියවර ගත්තේය.

ශ්‍රී ලංකාවේ අපරාධ යුක්තික පද්ධතිය ක්‍රියා කරන ආකාරය, එහෙමත් නැතිනම් ඇත්ත වශයෙන් කියනවා නම් එය ක්‍රියා නොකරන ආකාරය සහ සැබෑ තත්වය පිළිබඳ භයානක කථාන්දරය මේ පොත මගින් පවසනවා. වධ හිංසා වින්දිතයන්ගේ කථාන්දර හරහා පොලීසිය සහ වෙනත් නීති සාධක ආයතන මගින් භාවිතා කරන අතිශයින්ම කෲර සහ තිරිසන් ක්‍රම පිළිබඳ හෙළිදරව් කරනවා. මෙහිදී වඩාත්ම සිත් කළඹන කතාන්දරය වන්නේ අපරාධ විමර්ශනය කළ යුතු වන පොලීසිය, එම අපරාධ කාර්යක්ෂම ලෙස සහ අපක්ෂපාතී ලෙස අභිචෝදනය කළ යුතු නීතිපති දෙපාර්තමේන්තුව සහ රටේ පුරවැසියන් සුරැකිය යුතු අධිකරණය දක්වා ව්‍යාප්ත වී ඇති බව පෙනෙන අත්‍යන්ත නොසැලකිල්ලේ කථාන්දරයයි. නෛතික ක්‍රමයේ සකල අසාර්ථක වීම මත පිහිටා මේ පොතෙන් ඉදිරිපත් කරන සාක්ෂිවල බර විසින් ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ප්‍රතිචාරයක් මෙන්ම පොලීසිය, නීතිපති දෙපාර්තමේන්තුව සහ අධිකරණය වැනි එහි මූලික ආයතනවලින්ද පිළිතුරු සහ ප්‍රතිචාර ඉල්ලා සිටිනවා". ආසියානු නීති සම්පත් මධ්‍යස්ථානයේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් සංවර්ධනය පිළිබඳ අධ්‍යක්ෂ මෙන්ම මේ පොතෙහි සංස්කාරකවරයා ද වන බැසිල් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කළේය.

ඔහු තවදුරටත් මෙසේ පැවසුවේය. 'මේ ප්‍රකාශනය පරිශීලනය නොකර, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පිළිබඳ කිසිම අධ්‍යයනයක් සම්පූර්ණ වන්නේ නැහැ. වධ හිංසාව භාවිතය සම්බන්ධයෙන් විතරක් නෙවෙයි, ශ්‍රී ලංකාව තුළ පුළුල් ලෙස පැතිර පවත්නා විනිර්මුක්තිය පිළිබඳවත් වඩාත්ම සවිස්තරාත්මක-සර්ව ව්‍යාපී ග්‍රන්ථය මෙයයි".

ශ්‍රී ලංකාවේ නීතිය පිළිබඳ අධ්‍යයනයට වෙනසක් අවශ්‍ය කර තිබෙන බව ද ඔහු පැවසුවේය. නීතිය කුමක්දැයි පවසන බව හඟින නීති පාඨ ග්‍රන්ථයන්හි ඇති දෑ රට තුළ පැතිර පවත්නා සැබෑ තත්වයට පටහැණි ය. ශ්‍රී ලංකාව නීතියේ ආධිපත්‍යයෙන් කොතරම් දුරකට ගසාගෙන ගොස් තිබේද යන්න සහ ශ්‍රී ලංකාවේ මිනිසුන් කොතරම් දුරකට ඔවුන්ගේ මූලික ආරක්ෂාව ප්‍රතික්ෂේප කර තිබෙන්නේද යන්න මේ ග්‍රන්ථය මගින් විචිත්‍රවත් ලෙස හෙළිකර සිටියි.

**පොතෙහි පිටපත් හොංකොං හි පිහිටා තිබෙන ආසියානු නීති සම්පත් මධ්‍යස්ථානයෙන් හෝ අන්තර්ජාලය ඔස්සේ ලබාගත හැක.**

අන්තර්ජාලය ඔස්සේ ලබාගැනීමට පිවිසෙන්න :
http://www.humanrights.asia/resources/books/ALRC-PUB-001-201

# නම් ගම් සොයන - නම් නැති අය



නීතීඥ ගුණරත්න වන්නිනායක මහතා

**ලබ්බට තැබූ අත පුහුලටත් නොතියන්නට හේතුවක් නැත. අධිකරණය සහ නීති වෘත්තිය ඉතිහාසයේ දැවැන්තම විධායක අතපෙවීමෙන් බැට කමින් සිටියි. එහි තවත් පරිච්ඡේදයක් වන 'කොළඹ මහේස්ත්‍රාත් අධිකරණ නීතීඥ සංගමයේ සභාපති ගුණරත්න වන්නිනායක මහතාට හිරිහැර කිරීමට තවත් උත්සාහයක්' පිළිබඳ ආසියානු මානව හිමිකම් කොමිසම විසින් සිදුකළ විශේෂ ප්‍රකාශයයි, මේ.**

පොලිස් නිලධාරීන් කිහිප දෙනෙක් සිය නිවසට පැමිණ තමන් පිළිබඳ විමසා ඇතැයි වන්නිනායක මහතා ජූනි 24 වැනිදා පොලිස් බලධාරීන්ට පැමිණිලි කළේය. පසුව එදිනම සවස 2.30ට පමණ නිලධාරීන් දෙදෙනෙක්, වන්නිනායක සාමාන්‍යයෙන් නීති වෘත්තියේ නියැළී සිටින උසාවි සංකීර්ණය වෙත ගොස් ඔහු පිළිබඳ විමසීම් කර ඇති අතර ඔහුගේ මෝටර් රථය පිළිබඳ ද විමසා තිබේ. මෙම නිලධාරීන් දෙදෙනා ඔහු වෙත පැමිණ ඔහුගේ බිස්නස් කාඩ්පත ඉල්ලා ඇත්තේ නඩුවක් සම්බන්ධයෙන් ඔහුගෙන් උපදෙස් ලබාගැනීමට බලාපොරොත්තු වන බවට ව්‍යාජ හේතු දක්වමිනි. වන්නිනායක මහතා මෙන්ම ඔහුගේ නීතීඥ මිතුරන් කිහිප දෙනෙක්ම මෙම නිලධාරීන් දෙදෙනාගේ හැසිරීම් පිළිබඳ සෝදිසියෙන් සිට ඇති අතර එහිදී ඔවුන් සොයාගෙන ඇත්තේ උසාවි පරිශ්‍රය තුළ දෙවන නිලධාරී කණ්ඩායමක්ද සිටින බව සහ එම පළමු නිලධාරීන් දෙදෙනා, කළ යුතු දේ පිළිබඳ උපදෙස් ලබාගැනීම සඳහා ඔවුන් වෙත ගිය බව ය. GI 8786 දරණ අංක තහඩුව සහිත වාහනයට පළමු පොලිස් නිලධාරීන් දෙදෙනා ගොඩ වූ බවද නීතීඥවරු සොයාගත්හ. එම වාහනය පොලිස් මත්ද්‍රව්‍ය නිවාරණ කාර්යංශයට අයත් එකක් වන අතර එකී නිලධාරීන් දෙදෙනා එම ශාඛාවෙන් පැමිණි අය බව තහවුරු කර ගැනීමට ද නීතීඥවරු සමත් වූහ.

පොලීසියට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමෙන් පසුව මෙම ගැටලුව සම්බන්ධයෙන් පොලීසිය මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ නඩුවක් ගොනු කළ අතර නඩුව ජූලි 4 වැනිදාට ඇසීමට නියමිතව තිබිණි. මේ අතර බොරු හේතු දක්වමින් වන්නිනායක මහතා සමග සමථයකට පැමිණීමට උත්සාහ කළ පොලිස් නිලධාරීන් ඇත්ත වශයෙන්ම පවසා තිබුණේ තමන් සොයමින් ආවේ වෙනත් අයෙකු බවත් වැරදීමකින් වන්නිනායක මහතා හමුවීමට උත්සාහ කළ බවත් ය.

**වන්නිනායක මහතා ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ නීතීඥවරයෙකු බැවින් මේ කරුණු පැහැදිලිකිරීම, සත්‍යයක් නොවන බව නීතීඥවරු විශ්වාස කරති. මේ පිළිබඳ ඔවුන් දරන මතය වන්නේ, මෙම පොලිස් නිලධාරීන් විසින් වන්නිනායක මහතා සහ ඔහුගේ වාහනය සොයා ඒම, යම්කිසි රහස් මෙහෙයුමක කොටසක් වන බව ය. ඇතැම් සාක්ෂි ව්‍යාජ ලෙස ඇති කිරීමෙන් පසු එමගින් ඔහුව සහ ඔහුගේ රියැදුරා ඒවාට පටලැවීම පිණිස මෙසේ කරන්නට ඇතැයි සිතනු ලැබේ. ඇත්තෙන්ම ඔවුන් සොයන්නේ කාවදැයි නීතීඥවරුන් විසින් විමසා තිබූ නමුත් පොලිස් නිලධාරීන් එම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට අපොහොසත් වී තිබේ.**

වන්නිනායක මහතා ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ නීතීඥවරයෙකු බැවින් මේ කරුණු පැහැදිලිකිරීම, සත්‍යයක් නොවන බව නීතීඥවරු විශ්වාස කරති. මේ පිළිබඳ ඔවුන් දරන මතය වන්නේ, මෙම පොලිස් නිලධාරීන් විසින් වන්නිනායක මහතා සහ ඔහුගේ වාහනය සොයා ඒම, යම්කිසි රහස් මෙහෙයුමක කොටසක් වන බව ය. ඇතැම් සාක්ෂි ව්‍යාජ ලෙස ඇති කිරීමෙන් පසු එමගින් ඔහුව සහ ඔහුගේ රියැදුරා ඒවාට පටලැවීම පිණිස මෙසේ කරන්නට ඇතැයි සිතනු ලැබේ. ඇත්තෙන්ම ඔවුන් සොයන්නේ කාවදැයි නීතීඥවරුන් විසින් විමසා තිබූ නමුත් පොලිස් නිලධාරීන් එම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට අපොහොසත් වී තිබේ.

මෙයට පෙර ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරියට එරෙහිව දෝෂාභියෝග ක්‍රියාවලිය සිදුවෙමින් පවතින විට ද වන්නිනායක මහතාගේ දිවි තොර කිරීම සඳහා උත්සාහයක් විය. පොලිස් නිලධාරීන් කිහිප දෙනෙක් ඔහුගේ නිවසට ගොස් ඔහුව පැහැරගෙන යාමට උත්සාහ කර තිබූ අතර එය ව්‍යර්ථ වී ගියේ අසල්වාසීන්ගේ මැදිහත්වීම නිසා ය. ඔහු සහ මහේස්ත්‍රාත් අධිකරණයේ නීතීඥ සංගමය විසින් පොලිස් බලධාරීන්ට මේ සම්බන්ධයෙන් පැමිණිල්ලක් කර තිබියදීද එකී පැහැරගැනීමට උත්සාහ කිරීම සම්බන්ධයෙන් කිසිවෙකු අත්අඩංගුවට ගැනීමක් හෝ අභිචෝදනය කිරීමක් සිදු නොවීය.

එපමණක් නොව ආණ්ඩුවට තර්ජනයක් ලෙස තේරුම් යන යම්කිසිවෙකුට එරෙහිව සංකීර්ණ සහ විදග්ධ බුද්ධි අංශ මෙහෙයුමක් පවතින බවට ආසියානු මානව හිමිකම් කොමිසම විසින් නැවත නැවතත් අනතුරු අඟවා තිබේ. වන්නිනායක මහතා එක්සත් ජාතික පක්ෂයේ ක්‍රියාකාරී සාමාජිකයෙක් වන අතර අධිකරණය සහ නීතීඥවරුන්ගේ ස්වාධීනත්වය වෙනුවෙන් අරගල කරන නීතීඥ ජාලයේ ඉතාම සක්‍රිය සාමාජිකයෙකු ද වේ. එවැනි තැනැත්තන් වරදවලට පටලැවීම සඳහා රහස් උත්සාහයන් යෙදීම එවැන්නන්ව බ්ලැක්මේල් කිරීමේ සහ ඔවුන්ට විරුද්ධව බොරු චෝදනා ගෙතීමේ කොටසක් වේ.



# සෝදාපාළුව බරපතළයි

**නීතීඥ ගුණරත්න වන්නිනායක මහතාට විරුද්ධව සිදුවන්නට ගිය කුමන්ත්‍රණය කුමක්දැයි සිතාගැනීම අසීරු නොවේ. නමුත් නීතියේ සහ යුක්තියේ දළ සෝදාපාලුව ගැන ඉඟිකරන එහි බරපතළකම සිතාගැනීමට පවා නොහැකි තරම් ය. ආසියානු මානව හිමිකම් කොමිසමේ විධායක අධ්‍යක්ෂ බැසිල් ප්‍රනාන්දු මහතා මේ අවදානම මෙසේ විශ්ලේෂණය කරයි.**

\- බැසිල් ප්‍රනාන්දු විසිනි

කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය සම්බන්ධ තුන් තේරවිල්ලේ පටලැවිල්ල දැන් මෙපරිද්දෙන් ලිහා ගත යුතුය. පොලිස් මත්ද්‍රව්‍ය නිවාරණ කාර්යාංශය ප්‍රකට හල්ස්ඩෝර්ෆ් නීතීඥ ගුණරත්න වන්නිනායක ට එරෙහිව සිදුකරන්නට ගිය කුමන්ත්‍රණය කුමක්ද? අන් සියල්ලටම පෙර මෙවැනි කුමන්ත්‍රණයක අවශ්‍යතාවය කුමක්ද? ඇතැම්විට මේ සියල්ලටම වඩා වැදගත්ම ප්‍රශ්නය විය හැක්කේ, පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය මේ සඳහා මෙහෙයවමින් සිටියේ කවුද යන්නයි. ඉන්පසුව නැගෙන ස්වභාවිකම ප්‍රශ්නය වන්නේ,

මේ කුමන්ත්‍රණය පිටුපස සිටින්නේ මීට පෙර අසාර්ථක වූ පැහැරගෙන යාමේ උත්සාහය පිටුපස සිටි අයවලුන්මද යන්නයි.

සැබවින්ම මේ සඳහා පිළිතුර අතිශයින්ම සරල ය. සැඟවුණු මෙහෙයුම්කාරකයා කිසිවිටෙක එළිදරව් නොවනු ඇත. මෙය නියත වශයෙන්ම කෆ්කානු සන්නිවේශය හෙවත් කෆ්කානු තත්වයයි. අඩුම වශයෙන් මේ කොටස ශ්‍රී ලංකාවට අතිශය ආගන්තුක දෙයක් නොවේ. මෙබඳු කුමන්ත්‍රණ සිදුකරන ඒජන්තයන් සිද්ධියෙන් සිද්ධියට වෙනස් විය හැකි නමුත් බොහෝ පුද්ගලයන් මේ හා සමාන තත්වයන්ට මුහුණ පා සිටිති. සාමාන්‍ය සැකය වන්නේ මෙබඳු සියලු උත්සාහයන් පිටුපස සිටින නියාමකයා අඩු වැඩි වශයෙන් එකම පුද්ගලයා වන බවයි.

දුරකථනය ඔස්සේ ආසියානු මානව හිමිකම් කොමිසම අමතමින් වන්නිනායක මහතා කියූ පරිදි, ඔහුට තිබෙන සැකය වන්නේ, ඔහුගේ නිවසට සහ මහේස්ත්‍රාත් අධිකරණ පරිශ්‍රයට පොලිස් මත්ද්‍රව්‍ය නිවාරණ කාර්යාංශයේ නිලධාරීන් දෙදෙනෙකු පැමිණීම, ඔහුව යම්කිසි බරපතළ අපරාධයකට පටලැවීම පිණිස වූ බවයි. ආසියානු මානව හිමිකම් කොමිසම සමග කතා කළ තවත් නීතිඥවරුන් කිහිප දෙනෙක් පැවසුවේ, වන්නිනායක මහතා ඍජු ලෙස හෝ ඔහුගේ රියැදුරා හරහා වක්‍ර ලෙස පැටලවීම සඳහා ඔහුගේ රථයට මත්ද්‍රව්‍ය දැමීමට උත්සාහ කළාද යන්න පිළිබඳ සැකයක් පවතින බවයි.

වන්නිනායක මහතාගේ නිවසට සහ ඔහු නීතිඥ වෘත්තියේ නියැළී සිටින අධිකරණයට පැමිණියේ මන්දැයි සත්‍ය යැයි සිතිය හැකි පැහැදිලිකිරීමක් ලබාදීමට එම පොලිස් මත්ද්‍රව්‍ය නිවාරණ නිලධාරීන් දෙදෙනා අසමර්ථ වීම මගින් මෙම සැකයට තහවුරුවීමක් සිදුවේ. එය අනන්‍යතාවය වැරදීම නිසා සිදුවූවක් බවට පැහැදිලි කරමින් ඔවුහු එතැනින් ඉවත්ව යාමට උත්සාහ කළහ. කෙසේ නමුත් එසේ නම් ඔවුන් සැබවින්ම සොයන්නේ කාවදැයි ඇසූ විට ඔවුහු පිළිතුරු ලබාදීමට අපොහොසත් වූහ.

ශ්‍රී ලංකාවේදී 'අනන්‍යතාවය වැරදීම' හෙවත් වැරදියට හඳුනාගැනීම අතිශයින්ම සහ සත්තකින්ම භයංකාර ය. වත්තල පොලිස් ස්ථානයේ පොලිස් නිලධාරීන් කණ්ඩායමක් ජෙරල්ඩ් පෙරේරා ව අත්අඩංගුවට ගෙන, පුරා සති දෙකක් සිහි විසංඥව සිටීමට සලස්වමින් වකුගඩු අකර්මණ්‍ය වන මට්ටම දක්වා ම්ලේච්ඡ ලෙස වධ හිංසා පැමිණවූ විට, ඔවුන්ගේ අවසන් පැහැදිලි කිරීම වූයේ 'අනන්‍යතාවය වැරදී යාම' යි. තමන් අත්දුටු අව සැලකීම් සම්බන්ධයෙන් ඔහු ඔවුන්ට විරුද්ධව අභියෝග කළ විට ඔවුන්ගේ ඊළඟ පියවර වූයේ ඔහුව ඝාතනය කිරීමයි.

## මහජන අර්ථසාධනය බරතපතළ ලෙස ගැනීමේ භයානක කම

වන්නිනායක මහතා මේ අවස්ථාවේදී සිටින්නේ එවැනි තත්වයක ය. කුමන්ත්‍රණය සාර්ථක වූයේ නම්, ඔහුගේ දුර්දසාව කුමක්දැයි දැකීම අසීරු නොවනු ඇත. එය වන්නේ ඇප දිය නොහැකි වරදක් සඳහා චෝදනා ලැබීමයි. දැන්, ඔහු මේ කුමන්ත්‍රණය නිරාවරණය කර ගැනීමට සමත්ව සිටින නිසා, ජෙරාල්ඩ් පෙරේරා සිය වධකයන්ට



**ෆ්‍රාන්ස් කෆ්කා**

සැඟවුණු මෙහෙයුම්කාරකයා කිසිවිටෙක එළිදරව් නොවනු ඇත.

අභියෝග කළ විට පැන නැගුණු ප්‍රශ්නයටම දැන් ඔහු මුහුණ දී සිටියි. ශ්‍රී ලංකාවේ බොහෝ මිනිසුන් මුහුණ දී සිටින්නේ මෙබඳු තත්වයකට ය. එක් අතකින් ඔවුන්ට විරුද්ධව සිදුවන කුමන්ත්‍රණ තිබේ. අනෙක් අතට, ඔවුන් ඉදිරිපත් වී ඒවාට අභියෝග කළේ නම් ඔවුන්ට ඊටත් වඩා නරක තත්වයකට මුහුණ දීමට සිදුවනු ඇත.



ශ්‍රී ලංකාවේදී 'අනන්‍යතාවය වැරදීම' හෙවත් වැරදියට හඳුනාගැනීම අතිශයින්ම සහ සත්තකින්ම භයංකාර ය. වත්තල පොලිස් ස්ථානයේ පොලිස් නිලධාරීන් කණ්ඩායමක් ජෙරල්ඩ් පෙරේරා ව අත්අඩංගුවට ගෙන, පුරා සති දෙකක් සිහි විසංඥව සිටීමට සලස්වමින් වකුගඩු අකර්මණ්‍ය වන මට්ටම දක්වා ම්ලේච්ඡ ලෙස වධ හිංසා පැමිණවූ විට, ඔවුන්ගේ අවසන් පැහැදිලි කිරීම වූයේ 'අනන්‍යතාවය වැරදී යාම' යි. තමන් අත්දුටු අව සැලකීම් සම්බන්ධයෙන් ඔහු ඔවුන්ට විරුද්ධව අභියෝග කළ විට ඔවුන්ගේ ඊළඟ පියවර වූයේ ඔහුව ඝාතනය කිරීමයි.

ගුණරත්න වන්නිනායක මහතා ආණ්ඩුවේ නියෝජිතායතනයකින් මෙබඳු සැලකීමක් ලබන්නට තරම් යෝග්‍ය වී දැයි සමහරෙකු විසින් අසන්නට ඉඩ තිබේ. පොදු මතයට අනුව වන්නිනායක මහතා කීර්තිමත් නීතිඥවරයෙක් වන අතර මහජන අර්ථ සිද්ධිය බරපතළ ආකාරයෙන් ගණන් ගන්නෙකි. ශ්‍රී ලංකාවේදී මහජන අර්ථ සිද්ධිය බරපතළ ආකාරයෙන් ගණන් ගැනීම දැන් සැලකේන්නේ සාහසික අපරාධයක් ලෙස ය.

මහජන අර්ථ සාධනය බරපතළ ආකාරයෙන් සලකනු ලබන්නන් කෙරෙහි එල්ල වන මෙබඳු ප්‍රතික්‍රියාවන් ශ්‍රී ලංකාවේ දේශපාලන තත්වයේ හරය හෙළිකර සිටියි. ආරක්ෂක තත්වයේ යාන්ත්‍රණය මෙහෙයවනු ලබන්නේ සැඟවුණු නියාමකයෙකු විසිනි. එම නියාමකයා විසින් රජයේ නියෝජිතායතන ගණනාවක් ක්‍රියාත්මක කරවන අතර පොදු හෘද සාක්ෂිය පිළිබඳ සංජානනයක් පවතින බවට ලකුණක් හෝ පළ කරන ඕනෑම පුද්ගලයෙකු ට එරෙහිව ක්‍රියාත්මක වීමට ඉලක්ක කරගෙන සිටියි. නිහීන අවනීතිකතාවයේ සහ අයුක්තියේ නමින් නිහඬව සිටීම, 'සාමදානයේ' සිටීමට සිතන ඕනෑම අයෙක් විසින් කළ යුතු දෙයකි. එසේ නොවන අයට සාමදානයේ සිටීමට නොව 'සාමදානයේ සැතපීමට' සිදුවනු ඇත. මේ වෘත්තාන්තයේ අලුත්ම ජවනිකාව වන්නේ ප්‍රසිද්ධියේ නීතිඥවරුන් වෙනුවෙන්, අධිකරණයේ ස්වාධීනත්වය වෙනුවෙන් සහ නිදහස් හා සාධාරණ මැතිවරණ වෙනුවෙන් නැගී සිටි වන්නිනායක මහතා හට මුහුණදීමට සිදුවූ තත්වයයි.


# ගිනිගන්නා රටක කෙළින මී හරකුන් වැනි පුතුන්















ලමික මහ අබ්ලික් රටකි. මහ රජා ඩෙංගු නැති කිරීමට වැහිපීලි තහනම් කළේය. තමන්ගේ දියණියගේ ගවුමේ වාටි මැසීමට අණකළ ගුරුවරියව දණ ගැස්සූ අට පාස් නැති ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඇප මත නිදහස් වී එන විට ඔහු පිළිගැනීම සඳහා උසාවියේ පටන් නගර මධ්‍යය වන තෙක්ම පිළිගැනීමේ උත්සව සංවිධානය කර තිබුණේය. ඒ නිසා දැන් එම ගුරුවරිය මාරු වී යන්නට පාසලක් සොයන්නේලු. නියෝජ්‍ය පොලිස්පති වාස් ගුණවර්ධන මහ තැනගේ පූර්ණ අනුදැනුම මත මිනී මරන විට ඔහුගේ පුතුන් ගිනි අවි සහ කෝටි ගණන් මුදල් සමග හුරතල් වුණෝය. යෝෂිත රාජපක්ෂගේ පහරකෑම ලක්වූ විනිසුරුවරයා තවමත් සැඟවුණු ගමන් ය. මේ අතර අලුත්ම ප්‍රවණතාවය වශයෙන්, හෝටලක සිට බැල්කනියෙන් පැන්න හෝ වැටුණු මාධ්‍ය ඇමතිගේ පුත්, අහසෙන් බිමට පනින්නට තීරණය කර තිබීමයි. ඔහු ඇත්තෙන්ම වැසිකිළි දොරත් බ්‍රිටිෂ් එයාවේස් ගුවන්යානයේ දොරත් පටලවා ගත්තේය. මේ සිද්ධියේ සෙසු ආශ්‍රිත කරුණු රාශියක් හෙළිදරව්







වී ඇති නිසා, ලංකාවේ උදවිය දැන් රටේ සල්ලිවලින් සූර් වී පිස්සු කෙළීමට කියන්නේ 'නින්දෙන් ඇවිදීම' කියා ය. මාධ්‍යයට උගන්වන්නට පෙර කෙහෙළිය සිය පුතාට සදාචාරය ඉගැන්විය යුතුය.

එළඹ තිබෙන්නේ 'අපට පුතේ-රටක් නැතේ' කියා ලංකාව සදාකාලයටම දුක්විය යුතු සමයකි. එහෙත් මේ අබ්ලික් රටේ සියල්ල සිදුවන්නේ සිදුවිය යුතු දිශාවට නොව අනෙක් අතට ය. නායකයන්ගේ මුවේ නිරන්තරයෙන් මිමිණෙන ජය ගීය වන්නේ 'මං නැතිදා- මේ රට නුඹටයි- නුඹේ යහලුවන්ටයි' යන්නය. ඒ බව සනාථ කරමින් මෙවර පළාත් සභා මැතිවරණයට මැති ඇමතිවරුන්ගේ පුත්‍ර රත්නයන් රොත්ත බුරුත්ත පිටින් ඉදිරිපත් වීමට නියමිත ය. නාමයෝජනා ලැබූවන් අතර ගුරුතුමිය දණ ගැස්වූ මහින්ද පුතා ප්‍රධාන ය. අබ්ලික් රටේ නඩුත් හාමුදුරුවන්ගේ ය. බඩුත් හාමුදුරුවන්ගේ ය. ඒ නිසා මේ පින් බිමේ උපන් අපට හූල්ලනවා ඇරෙන්නට කළ හැකි දෙයක් නැති ගාන ය.




# පාරිශුද්ධ අධිකරණයක්...?

- බැසිල් ප්‍රනාන්දු විසිනි.

*1978 ආණ්ඩුක්‍රමය තුළ බල කාමයෙන් වල්මත් වූ විධායකය අධිකරණයට අත පෙවූයේ අද ඊයේ සිට නොවේ. නමුත් වත්මන් විධායක ජනාධිපතිවරයා තරම් තුච්ඡ සහ නිර්ලජ්ජිත ලෙස අධිකරණ ස්වාධීනත්වයට අත පෙවූ සහ අධිකරණයේ ගෞරවය නග්න කර කෙළසූ පාලකයෙකු මෑත ඉතිහාසයේ නොවූ තරම් ය. පසුගිය දිනෙක ජනාධිපතිවරයා අධිකරණය පිළිබඳ සිය ඉදිරි සැලසුම් හෙළි කළේය. ඒ ප්‍රකාශය විමසා බලමින් ශ්‍රී ලංකාව: පාරිශුද්ධ අධිකරණයක නව යුගයක් කරා පෙර ගමන්කරු ද? යනුවෙන් ආසියානු මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කළ ප්‍රකාශයයි.*

අධිකරණය තවදුරටත් 'පාරිශුද්ධ' ලෙස තබාගැනීම සඳහා අවශ්‍ය කරන්නේ කුමක්දැයි බලා තමන් ඒ පියවර දැඩි ලෙස ගන්නේ යැයි ජනාධිපති මහින්ද රාජපක්ෂ මෑතකදී ප්‍රකාශ කළේය. මේ ප්‍රකාශය ගැටලු ගණනාවක් මතුකරයි.

යහපත් අධිකරණයක් පිළිබඳ පරීක්ෂාව වන්නේ ස්වාධීනව ක්‍රියාකිරීම සඳහා එයට තිබෙන හැකියාවයි. මෙහිදී, 'ස්වාධීන' යන්නෙන් අදහස් කරන්නේ විධායකය මත රඳාපැවතීමක් නොමැති වීමයි. නීතිය විසින් ඉල්ලා සිටින විට විධායක ජනාධිපතිවරයා ද ඇතුළුව ඕනෑම විධායක නියෝජනයකට එරෙහිව ක්‍රියාකිරීම සඳහා ඕනෑම පියවරක් ගැනීමට අධිකරණය සමත්විය යුතුය. ඉතා සරල ලෙස, මෙබඳු ස්වාධීනත්වයක් ශ්‍රී ලංකාවේ දැන් නැත. එසේ නම් ස්වාධීන වීමට ඉඩ නොදෙන කල අධිකරණයක පැවතිය හැක්කේ කෙබඳු ආකාරයේ පාරිශුද්ධතාවයක්ද? සැබෑ ආශ්‍රිත කරුණු සහ කාලයේ අවදානම හේතුවෙන් නීතිය විසින් ඉල්ලා සිටින තීන්දු ගැනීමෙන් අධිකරණය වැළකී සිටින මොහොතේම, එය අමාරුවේ හෙළා ඇති අතර ඒ අනුව 'පාරිශුද්ධ' යැයි කිව හැකි කිසිම ආකාරයකින් එයට ක්‍රියාකළ නොහැකි වේ. ජනාධිපතිවරයා විසින් මේ තත්වය ඇති කර තිබේ. මේ අනුව, ඔහු අධිකරණය පාරිශුද්ධ කරන්නට කතා කරන විට, මේ දක්වා පැතිර පවත්නා තත්වය ආපස්සට හැරවෙතැයි එයින් තේරුම් නොයන අතර විධායකය විසින් තමන්ට දඬුවම් දේ යැයි බියෙන් තොරව අධිකරණයට දැන් තීන්දු ගත හැකි යැයි ද එයින් අරුත් නොගැන්වේ.

අධිකරණය පවිත්‍රදැයි බැලීම කිසිම ආකාරයකින් විධායකයේ කාර්යයක් නොවේ. අධිකරණය සහ විධායකය අතර පවතින සම්බන්ධතාවය තුළ තිබෙන්නේ අධිකරණය විසින් විධායකය සියුම් නිරීක්ෂණයට ලක් කර

විධායකය නීතිය තුළ ක්‍රියාකරන්නේ දැයි බැලීමයි. ජනාධිපතිවරයා කරන්නට යන දේ නම් මේ සම්බන්ධතාවය ඔළුවෙන් හිටවා, අධිකරණය පරීක්ෂා කිරීමේ රාජකාරිය තමන්ට පවරා ගැනීමයි. මෙය මෙසේ සිදුවන විට තවදුරටත් බලතල බෙදීමේ සංකල්පයක් නැත. ඒ වෙනුවට තිබෙන්නේ නියත වශයෙන්ම එහි විරුද්ධාර්ථයයි. මේ අලුත් වින්‍යාසය තුළ විධායකය සහ අධිකරණය අතර පවතින සබඳතාවය ප්‍රජාතාන්ත්‍රික සම්බන්ධයක් වීම ඉතා අසීරු ය. කෙටියෙන් පවසන්නේ නම්, ජනාධිපතිවරයාගේ ප්‍රකාශය, සියලු සබඳතා දැන් ඒකාධිපති ක්‍රමයක් තුළ පවත්නා සම්බන්ධතා බවට පරිවර්තනය වී ඇති බව තවදුරටත් සනාථ කිරීමකි.

දකුණු ආසියානු සන්දර්භය තුළ පවිත්‍රකරණය යන වදන සහශ්‍රක ගණනාවක් මුළුල්ලේ ඉතා කිළිටි අර්ථයකින් යෙදූ බව අපි දනිමු. බ්‍රාහ්මණ ක්‍රමය තුළ බමුණන්ගේ කැමැත්තට එරෙහිව ඕනෑම දෙයක් කිරීම අපවිත්‍ර කිරීම හෝ කිළිටි කිරීම ලෙස සැලකුණේය. දාලිත් හෝ කුලහීනයන් යැයි කියූ දුගී කුල හැමවිටම අපවිත්‍ර කිරීම හෙවත් කිළිටි කිරීමේ යෙදී සිටි බව කියැවිණි. සිය තත්වය උසස් කර ගැනීම හෝ දියුණු කර ගැනීම පිණිස කරන ඕනෑම දෙයකින් ඔවුන් තවදුරටත් දූෂිත හෝ අපිරිසිදු වේ යැයි ගණන් ගනු ලැබීය. නොකිළිටි බවේ සිද්ධාන්තය, ස්ත්‍රීන්ව යටත් කර ගැනීම සනාථ කිරීම පිණිස ද යොදාගැනුණේය.

මේ තත්වය යටතේ අධිකරණය පාරිශුද්ධව පවතින්නේදැයි බැලීම සඳහා දැඩි පියවර ගැනීම මගින් අදහස් කළ හැක්කේ විධායකය වෙත සම්පූර්ණයෙන් 'පාරිශුද්ධ' ගැතිකමක් විධායකය අපේක්ෂා කරන බවයි. එවැනි ගැතිකමකට අවනත නොවෙන්නන් 'දැඩි පියවර'වලට ලක්වනු ඇත. මේ අනුව, පවිත්‍රකරණය මගින් අධිකරණය දේශපාලනීකරණය නොවීම නොව එය දේශපාලනීකරණය වීමේ ක්‍රියාවලිය සම්පූර්ණ වීම අදහස් කෙරේ.

දකුණු ආසියානු සන්දර්භය තුළ පවිත්‍රකරණය යන වදන සහශ්‍රක ගණනාවක් මුළුල්ලේ ඉතා කිළිටි අර්ථයකින් යෙදූ බව අපි දනිමු. බ්‍රාහ්මණ ක්‍රමය තුළ බමුණන්ගේ කැමැත්තට එරෙහිව ඕනෑම දෙයක් කිරීම අපවිත්‍ර කිරීම හෝ කිළිටි කිරීම ලෙස සැලකුණේය. දාලිත් හෝ කුලහීනයන් යැයි කියූ දුගී කුල හැමවිටම අපවිත්‍ර කිරීම හෙවත් කිළිටි කිරීමේ යෙදී සිටි බව කියැවිණි. සිය තත්වය උසස් කර ගැනීම හෝ දියුණු කර ගැනීම පිණිස කරන ඕනෑම දෙයකින් ඔවුන් තවදුරටත් දූෂිත හෝ අපිරිසිදු වේ යැයි ගණන් ගනු ලැබීය. නොකිළිටි බවේ සිද්ධාන්තය, ස්ත්‍රීන්ව යටත් කර ගැනීම සනාථ කිරීම පිණිස ද යොදාගැනුණේය.

පෙනී යන පරිදි ජනාධිපතිවරයා විසින් අධිකරණය පාරිශුද්ධ කිරීමට යන ආකාරයෙන්, එය මේ වන විට ස්වාධීනත්වයේ සහ නීතියේ ආධිපත්‍යයේ විජාතික සංකල්පවලින් කිළිටි වී ඇතැයි ද ඒ නිසා දැඩි පියවර මගින් එය පිරිසිදු කළ යුතු යැයි ද එවිට අධිකරණය විධායකයේ කැමැත්ත සඳහා පමණක් කැපවීමට සූදානම් බව ද ව්‍යංගයෙන් අදහස් කරන්නේ යැයි පෙනී යයි.

ආචාර්ය ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරිය ඉවත් කිරීම පිණිස එබඳු ප්‍රබල ක්‍රියාමාර්ගයක් මේ වන විටත් ගෙන තිබේ. මේ පවිත්‍රකරණයේ තවත් ක්‍රියාවක් නම්, අධිකරණ සේවා කොමිසම විසින් දූෂණ චෝදනාවක් මත වැඩ තහනම් කළ විනිසුරුවරයෙක් නැවත පත් කිරීමයි. තවත් ක්‍රියාවක් වන්නේ, ආණ්ඩුව විසින් අගවිනිසුරුවරිය ව ඉවත් කිරීමට විරුද්ධ වූ අධිකරණ නිලධාරීන් විශාල සංඛ්‍යාවක් ඔවුන්ගේ අධිකරණමය මනස්වලට පිළිගත හැකි ආකාරයේ කිසිදු නිසි පරීක්ෂණයකින් තොරව මාරු කිරීමයි. මේ සියල්ල, ජනාධිපතිගේ ඇසින් අධිකරණය තවදුරටත් 'පාරිශුද්ධ' ව තබාගැනීම සඳහා තවදුරටත් ගනු ලබන දැඩි ක්‍රියාමාර්ගවල සංඥාවන් ය.

*ශ්‍රී ලංකාවේ මාධ්‍ය සඳහා හඳුන්වාදීමට සැලසුම් කරන මාධ්‍ය ආචාරධර්ම යෝජනාවලිය, ආණ්ඩුවේ ඉදිරි සැලසුමක කොටසක් බව සන්ඩේ ටයිම්ස් කර්තෘ මණ්ඩල නීති උපදේශිකා කිශාලි පින්ටෝ-ජයවර්ධන, ජූනි 26 දා ලංකාදීප පුවත්පතට සම්මුඛ සාකච්ඡාවක් ලබාදෙමින් අවධාරණය කරන්නීය. පහත දැක්වෙන්නේ 'රාජ්‍ය මාධ්‍ය ආචාර ධර්ම යෝජනාවලිය ඉදිරි සැලසුමක කොටසක්ද?' යන මැයෙන් පළ වූ එම ලිපියයි.*


Daily Lankadeepa 26 Jun 2013

කාලීන සටහන

රාජ්‍ය මාධ්‍ය ආචාර ධර්ම යෝජනාවලිය

තොරතුරු දැන ගැනීමේ අයිතිය සෑම රටකම පාහේ නීතියෙන් සුරක්ෂිත කර තිබේ. අපේ අසල්වැසි රටවල් මෙයට හොඳ උදාහරණයි. මේ නීතිය මුළු සමාජයටම

# මාධ්‍යයට ආචාරධර්ම ...?


කිශාලි පින්ටෝ-ජයවර්ධන

මාධ්‍යයට ආචාරධර්ම පද්ධතියක් හඳුන්වාදීමට ආණ්ඩුව කටයුතු කරමින් තිබේ. මේ සම්බන්ධයෙන් ප්‍රධාන කරුණු දෙකක් පැහැදිලි කළ යුතුය. ප්‍රතිපත්තියක් වශයෙන් නවීන ප්‍රජාතන්ත්‍රවාදී රටක මාධ්‍ය ආචාරධර්ම ගොඩනැගෙන්නේ මාධ්‍යයෙන්ම ය. වෙනත් ආකාරයකට කියන්නේ නම් මාධ්‍යයෙන්ම මාධ්‍ය නියාමනය වීම අවශ්‍ය ය. ලෝකය ගත්තද ආසියානු කලාපය ගෙන බැලුවද ආණ්ඩුවෙන් මාධ්‍යයට හඳුන්වාදෙන ආනයනය කරන ආචාර ධර්ම පද්ධතියක් මාධ්‍යය පිළිගන්නේ නැත. අප අසල්වැසි රටවන ඉන්දියාව දෙස බැලීමේදී මේ කාරණය හොඳින්ම පැහැදිලි වනු ඇත. එනිසා වඩා හොඳම ක්‍රමය වන්නේ මාධ්‍යයෙන්ම ආචාර ධර්ම පද්ධතියක් සකසා ගෙන එය බලාත්මක කර ඒ අනුව කටයුතු කිරීම ය.

මාධ්‍යයේ තිබෙන බලය ගොඩනැගෙන්නේ රටේ කියවන ජනතාව මාධ්‍යය කෙරෙහි දක්වන ගෞරවය, වගකීම අනුව ය. යම් මාධ්‍යයක ජනප්‍රියතාවය ඉදිරියට ගමන් කරන්නේ එම මාධ්‍යයට ජනතාව දක්වන ගෞරවය මත ය. මාධ්‍යවේදියෙකු වුවත් අයුතු ආකාරයෙන් කටයුතු කළහොත් සහ මාධ්‍ය ක්‍රියාකාරකම්වල නිරත වුවහොත් සමාජයේ ඔවුන් කෙරෙහි ඇතිවන ගෞරවය එතැනින්ම අවසන් වනු ඇත. නැතිනම් ජන සමාජය එකී මාධ්‍ය කෙරෙහි තබාතිබූ විශ්වාසය බිඳ වැටෙනු ඇත. එනිසා ප්‍රතිපත්තියක් වශයෙන් මාධ්‍යයෙන්ම මාධ්‍ය ආචාර ධර්ම පද්ධතියක් ගොඩනගා ගැනීම ප්‍රායෝගික ක්‍රමයකි. එය ඕනෑම රටකට පොදු කාරණයකි.

මේ තර්කය ලංකාවට ආදේශ කළ විට කාරණය බරපතළ ආකාරයෙන් සැලකිල්ලට ගැනීමට සිදුවනු ඇත. එයට ප්‍රධාන හේතුව වත්මන් ආණ්ඩුවේ මාධ්‍ය ප්‍රතිපත්තියේ ස්වභාවයයි. ආණ්ඩුවේ මාධ්‍ය ප්‍රතිපත්තිය සෑහෙන්න විවේචනය කිරීමට අපට පුලුවන. ආණ්ඩුවේ මාධ්‍ය සම්බන්ධයෙන් විස්තරාත්මකව අවධානය යොමුකිරීම මේ පසුබිම යටතේ වැදගත් ය. මීට මාස කිහිපයකට පෙර හිටපු අගවිනිසුරුවරියට එරෙහිව දෝෂාභියෝගයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරිණි. මේ දෝෂාභියෝගය විභාග කෙරුණු කාලයේ ආණ්ඩුවේ මාධ්‍ය හිටපු අගවිනිසුරුවරියටත් අනෙක් විනිශ්චයකාරවරුන්ටත් දෝෂාරෝපණය කළේ පහත් ආකාරයෙනි. එහෙත් මේ ආණ්ඩුවට ඒ සම්බන්ධයෙන් කිසිදු ප්‍රශ්නයක් තිබුණේ නැත. එම අවස්ථාවේදී ආණ්ඩුවේ මාධ්‍ය, ආචාර ධර්ම පද්ධතියකට අනුගතව සිටියාදැයි ප්‍රශ්නයකි. ආණ්ඩුවේ මාධ්‍යයට ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට නොහැකි නම් පෞද්ගලික මාධ්‍යවලට ආචාරධර්ම පද්ධතියක් හඳුන්වාදෙන්නේ ඇයිද යන ප්‍රශ්නය මතු වනු ඇත. මා සිතන ආකාරයට ආණ්ඩුවේ මාධ්‍ය තම වාර්තාකරණවලදී මුලින්ම ආචාරධර්ම පද්ධතියක් අනුගමනය කළ යුතුය. එසේ නොකරන බව මේ රටේ ජනතාව පැහැදිලිව දන්නා කාරණයකි. ලංකාවේ පවතින වාතාවරණය දෙස බලනවිට මෙය එක් කාරණයකි.

දෙවැනි කාරණයේදී මේ ආචාර ධර්ම පද්ධතිය සැලකිල්ලට ගෙන බැලිය යුතුය. මාධ්‍යවලට අවශ්‍ය ආකාරයට වැඩ කිරීමට සම්පූර්ණ බලය තිබේ යැයි මා කිසිවිටෙකත් කියන්නේ නැත. ලංකාවේ මාධ්‍යයට හොඳ

ආචාරධර්ම පද්ධතියක් අවශ්‍ය ය. මුලින් සඳහන් කළ ආකාරයට එය සකස් කර ගත යුත්තේ මාධයෙයන් ම ය. එසේ සකසාගත් ආචාරධර්ම මාධ්‍යම අනුගමනය කළ යුතුය.

උතුරේත් දකුණේත් යුද්ධය පැවති කාලයේ මාධ්‍ය සහ අද පවතින මාධ්‍ය අතර විශාල වෙනසක් තිබේ. කෙතරම් බාධා මධ්‍යයේ වුවත් ඕනෑම පොදු රාජ්‍ය මණ්ඩල රටක මාධ්‍ය සමග සැසඳිය හැකි මාධ්‍යයක් මෙරටට තිබුණි. හදිසි නීතිය යටතේ පවා මාධ්‍ය තම වැඩ කොටස කිරීමට උත්සාහ ගත්තේය.
අද තිබෙන මාධ්‍ය ආණ්ඩුවෙන් තළාදමා තිබේ.
මාධ්‍යවේදීන් රටෙන් පිටව ගොසිනි. සෑම අංශයක්ම පහළට ගොසිනි.
නීතියේ අධිකරණයේ පවා පහළ යාමක් දැකගත හැකිය.
ඒ වගේම මාධ්‍යයත් සෑහෙන පමණ ආණ්ඩුවට පාලනය වී තිබේ.
විවේචනාත්මකව ලිවීමට, බය නැතිව යමක් ගැන කතාකිරීමට ඇත්තේ සීමිත ඉඩකි.
මාධ්‍යයට බියක් තිබේ.
ඒ නිකම්ම නොවේ.
මාධ්‍ය එසේ බියවීමට යම් යම් හේතු තිබේ.
ඒවාත් සමග මෙවැනි ආචාර ධර්ම පද්ධතියක් දැමීම කිසිදු තේරුමක් නැත

මේ පසුබිම සැලකිල්ලට ගෙන ආණ්ඩුව හඳුන්වා දෙන ආචාරධර්ම දෙස විස්තරාත්මකව බැලීමේදී එහි සෑහෙන ප්‍රශ්න තිබේ. පාවිච්චි කර තිබෙන භාෂාව මෙහිදී විශේෂයෙන් වැදගත් ය. මෙහි ඇති අර්ථ දැක්වීම්, නියමයන් හරිම අපැහැදිලි ය. දුර්වල ය. එපමණක් නොව එකම දෙය වෙනස් ආකාරවලින් කියා තිබේ. යම් නීතියක් කෙටුම්පත් කරන විට පවතින මූලිකම ප්‍රතිපත්තික් තිබේ. එනම් දුබල, අපැහැදිලි භාෂාවක් පාවිච්චි නොකළ යුතු බවය. එයට හේතුව යම් වගන්තියක් හෝ විධිවිධානයක් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට ගිය විට අධිකරණවලට බොහෝ ප්‍රශ්නවලට මුහුණදීමට සිදුවන නිසා ය. අපැහැදිලි භාෂාවකින් හෝ දුබල භාෂාවකින් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් වූ හදිසි විධිවිධාන වුවත් ව්‍යවස්ථාවට අනුකූල නැති බව කියමින් ඉවත දැමූ අවස්ථා ඕනෑ තරම් මෙරට නීති ඉතිහාසයේ තිබේ. මේ ආචාරධර්ම නීතියක් නොවන බව බොහෝ දෙනා කියා තිබුණි. ජනාධිපතිවරයා ද ඒ අදහස ගෙනහැර පා තිබිණි. මෙය නීතියක් නොවූවද මෙහි ඇති බරපතළකම, මාධ්‍යයට කරන බලපෑම කවරක් දැයි පසුව පැහැදිලි කර ගත හැකිය. කෙසේ වෙතත් ආචාරධර්ම පද්ධතියක් හෝ නීතියක් කෙටුම්පත් කරන විට එහි භාෂාව ඒකාර්ථව, පැහැදිලි ව තිබිය යුතුය.

මේ ආචාරධර්මවල ප්‍රශ්න රාශියක් පැවතියද කිහිපයක් පමණක් ගෙනහැර දැක්වීමට පුලුවන. මෙහි 1(බී) දෙස අවධානය යොමුකළ හැකිය. ''විදේශ සම්බන්ධතාවලට බලපාන සම්පූර්ණ විවේචන' යනුවෙන් එහි සඳහන් කර තිබේ. සත්‍ය ලෙසම මෙයින් අදහස් කරන්නේ කුමක්ද? යම් මාධ්‍යවේදියෙකු ඉන්දියාවේ සහ ලංකාවේ ප්‍රශ්නයක් සම්බන්ධයෙන්, ලංකාවේ සහ ඇමරිකාවේ ප්‍රශ්නයක් සම්බන්ධව හෝ වෙනත් ඕනැම රටක් සමග ඇති ප්‍රශ්න ගැන ලිපි ලියුවහොත් ඒවා විදේශීය සම්බන්ධතා විවේචන වශයෙන් සැලකීමේ හැකියාව මේ යටතේ තිබේ. ලංකාව වෙනත් රටකින් ලබාගන්නා ණයක් හෝ ආධාරයක් සම්බන්ධව කරුණු විමසීමක් පවා මේ ගණයට වැටෙන්නට පුලුවන. විදේශ සමග කෙරෙන වෙනත් ගනුදෙනු සම්බන්ධයෙන් මාධ්‍යවල කෙරෙන හෙළිකිරීම්ද විදේශ සම්බන්ධතා විවේචන වශයෙන් සලකා කටයුතු කිරීමේ අවස්ථාව මේ නිසා උදා වන බව පැහැදිලි කාරණයකි. ඕනෑම විවේචනයක් මේ යටතට ගෙන කටයුතු කිරීමට අවශ්‍ය පසුබිමක් මෙමගින් සැලසෙනු ඇත. කිසියම් ආචාර ධර්ම පද්ධතියක් හෝ නීතියක් කෙටුම්පත් කරන විට මෙවැනි භාෂාවක් කිසිවිටෙකත් භාවිතා කරන්නේ නැත. එය විශේෂයෙන්ම අවධානයට ගත යුතු කාරණයකි.

නිශ්චිතව, පැහැදිලිව, ඒකාර්ථව යමක් සඳහන් නොකරන විට එය අනාගතයේ මාධ්‍යයට පමණක් නොව ආණ්ඩුවටද අමාරු කාරණයක් වනු ඇත. එයට ප්‍රධාන හේතුව මේවා අදාළ වන්නේ, බලපවත්වන්නේ කොතැනටදැයි නිශ්චිතව නොදන්නා නිසා ය. නිශ්චිතව යමක් ඉදිරිපත් නොකරන විට ඒවාට මුවාවී නොයෙක් දේ කිරීමේ හැකියාව පවතින බව අමතක නොකළ යුතුය.




ඒ වගේම තවත් කරුණක් මේ ආචාර ධර්ම පද්ධතියේ 1 (ඊ) හි දක්වා තිබේ. 'ජනතාව නොමග යවන තොරතුරු ඇතුළත්' යනුවෙන් එහි සඳහන් ය. 'ජනතාව නොමග යවන' යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? ඉහත සඳහන් කළ අවස්ථාවේ මෙන්ම මෙහි වචන භාවිතා කර තිබෙන ආකාරය අනුව මේවා අදාළ වන්නේ, බලපවත්වන්නේ කවරාකාරයේ අවස්ථාවලටද යන්න සිතා ගැනීම අපහසු ය. ඒ නිසා මේවා ඔස්සේ පුළුල් පරාසයක් ආවරණය කිරීමට අරමුණු කරගෙන ඇති බව නම් පැහැදිලි ය.

ඒ වගේම 'ජාති විරෝධී ආකල්ප' යනුවෙන් තවත් තැනක දක්වා තිබේ. 'ජාති විරෝධී ආකල්ප' යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි මේ අනුව මතුවන ප්‍රශ්නයකි. අප සිටින වාතාවරණය අනුව ආණ්ඩුවට එරෙහිව කියනා සෑම දෙයක්ම ගෙන හැර දක්වන්නේ ජාති විරෝධී වශයෙනි. ජාති විරෝධී යනුවෙන් අදහස් කරන්නේ රාජ්‍ය විරෝධී වීමද? මේ අනුව ඉදිරියේදී මාධ්‍ය ආණ්ඩුව සම්බන්ධයෙන් කරන විවේචන, අදහස් දැක්වීම් සියල්ල 'ජාති විරෝධී ආකල්ප' වශයෙන් අර්ථ දක්වන්නට හැකියාව තිබේ. එනයින් බලන කල ඉදිරියේදී ආණ්ඩුව විවේචනය කිරීමට-අඩුපාඩු පෙන්නුම් කිරීමට මාධ්‍යයට ඇති අවස්ථාව ඇහිරී යනු ඇත. මේ කාරණය මාධ්‍ය සම්බන්ධයෙන් පමණක් නොව සමාජය සම්බන්ධයෙන්ද කරන්නේ බරපතළ බලපෑමකි. මේවා වන්නේ ලංකාවේ පමණක් නොවේ. ඇමරිකාව ඉරාකයට පහර දෙද්දී ඇමරිකා රජයේ ප්‍රතිපත්ති විවේචනය කිරීම ඇමරිකාවට විරුද්ධ වීමක් බව ජෝර්ජ් ඩබ්ලිව් බුෂ් කියා තිබුණි. මෙයින් පෙනෙන්නේ තමන්ගේ ප්‍රතිපත්ති මාධ්‍යයෙන් විවේචනය වීම වළක්වා ගැනීමට ලෝකයේ සෑම ආණ්ඩුවක්ම පාහේ උත්සාහ ගන්නා බව ය. මෙරට මැති ඇමතිවරුන් යම් යම් අදහස් රාජ්‍ය විරෝධී, ජාති විරෝධී වශයෙන් ගෙන හැර දක්වන අවස්ථා තිබේ. එක් එක් පුද්ගලයන්ට එසේ කිරීමට පුලුවන. එහෙත් මාධ්‍ය ආචාරධර්මවලට මේවා ගෙනෙන විට එහි බරපතළ කමක් පෙන්නුම් කරනු ඇත.

මාධ්‍ය සඳහා වන ආචාර ධර්ම පද්ධතියේ 1 (එච්) හි දක්වා ඇති කාරණයද විශේෂයෙන් අවධානයට යොමු කළ යුතුය. ''විධායකයේ, ව්‍යවස්ථාදායකයේ, අධිකරණයේ අවංකභාවයට පටහැණි, විරුද්ධ කරුණු ඇතුළත්' යනුවෙන් එහි සඳහන් ය. මෙහි බොහෝ අකුරු වැරදි තිබේ. එය වෙනම කරුණකි. අවංකභාවය යනුවෙන් මෙහිදී අදහස් කරන්නේ කුමක්ද? 'අධිකරණයට අපහාස කිරීම' යනුවෙන් සංකල්පයක් නීතියේ තිබේ. මේ කාරණයේදී මාධ්‍ය බෙහෙවින්ම පරිස්සමෙන් කටයුතු කළ යුතුය. ඒ වගේම අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සහ යුක්තිය පරිපාලනය සුරැකීමේ අයිතිය තහවුරු කිරීමේ, සමබර කිරීමේ වගකීම අධිකරණයට තිබේ. කෙසේ වෙතත් අධිකරණයට අපහාස කිරීම යන කාරණය එක් තැනක දක්වා තිබෙන අතර ඊට පසු තවත් තැනක අධිකරණයේ අවංක භාවය යනුවෙන් කියා තිබේ. මෙවැනි ප්‍රශ්න රාශියක් මේ ආචාරධර්ම පද්ධතියේ ඇති බව කිව යුතුය. මේ පසුබිම යටතේ ප්‍රායෝගිකව මෙය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් බොහෝ වාද විවාද ඇති වන්නට පුලුවන.

යම් කාරණක් සම්බන්ධයෙන් නිසි තොරතුරු නැතිනම්, විශ්වාසනීයත්වයක් නැතිනම්, තහවුරු කර ගැනීමට සාධක නැතිනම් එවැන්නක් මාධ්‍යයෙන් ඉදිරිපත් නොකිරීමේ ප්‍රතිපත්තියක් මාධ්‍යයට තිබේ. මෙය එක්තරා ආකාරයකට මාධ්‍යට තිබෙන ස්වයං වාරණයක් වශයෙන් පෙන්වා දීමේ වරදක් නැත. ඒ වගේම යම් යම් කරුණු ඉදිරිපත් කිරීමේදී පවා මාධ්‍ය ස්වයං වාරණයක් අනුගමනය කරන බව පැහැදිලි ය. කෙසේ වෙතත් මේ

ආචාරධර්මවලින් උත්සාහ ගන්නේ මාධ්‍යවේදියෙකු උසාවි ගෙන යාමට නොවේ. යම් දෙයක් ලිවීම, මාධ්‍යයෙන් ඉදිරිපත් කිරීම මුලපටන්ම නතර කර ගැනීමට ය. අප්‍රසන්න බලපෑමක් කිරීමට ය. වාරණ නීති නොපැනවුවද ඉදිරියේදී පවතිනවාටත් වඩා ස්වයං වාරණය ඇති කිරීමට යොදාගන්නා ආයුධයක් වශයෙන් මෙය දැක්විය හැකිය.

> " මාධ්‍යවේදීන් ආචාරධර්මවලට පටහැණිව ක්‍රියාකළහොත් දැඩි ක්‍රියාමාර්ග ගන්නා බව පුවත්පත් කොමිෂන් නීතියේ 30 වැනි වගන්තියේ කියා තිබේ. ඒ අනුව ආණ්ඩුව හඳුන්වාදෙන ආචාරධර්ම පද්ධතිය ඉදිරියේදී පුවත්පත් කොමිසම ක්‍රියාත්මක කළහොත් එය ලංකාවේ මාධ්‍යයට විශාල ප්‍රශ්නයක් වනු ඇත. පුවත්පත් කොමිසමේ නියෝගයකට යම් මාධ්‍යවේදියෙකු අවනත නොවුවහොත් නැතිනම් එම නීතියට පටහැණිව මාධ්‍යවේදියෙකු ක්‍රියාත්මක වුවහොත් අධිකරණය හමුවට පැමිණවීමට පුලුවන. "

මෙය නීතියක් නොවන බව කියා තිබේ. එය සත්‍යයකි. එහෙත් පුවත්පත් කොමිසමේ නීතිය දෙස බලනවිට මෙහි ඇති බැරෑරුම්කම වැටෙහනු ඇත. මාධ්‍යවේදීන් ආචාරධර්මවලට පටහැණිව ක්‍රියාකළහොත් දැඩි ක්‍රියාමාර්ග ගන්නා බව පුවත්පත් කොමිෂන් නීතියේ 30 වැනි වගන්තියේ කියා තිබේ. ඒ අනුව ආණ්ඩුව හඳුන්වාදෙන ආචාරධර්ම පද්ධතිය ඉදිරියේදී පුවත්පත් කොමිසම ක්‍රියාත්මක කළහොත් එය ලංකාවේ මාධ්‍යයට විශාල ප්‍රශ්නයක් වනු ඇත. පුවත්පත් කොමිසමේ නියෝගයකට යම් මාධ්‍යවේදියෙකු අවනත නොවුවහොත් නැතිනම් එම නීතියට පටහැණිව මාධ්‍යවේදියෙකු ක්‍රියාත්මක වුවහොත් අධිකරණය හමුවට පැමිණවීමට පුලුවන. ඉන්පසුව තවත් ක්‍රියාමාර්ගවලට යාමට හැකිය. මේ ආචාරධර්ම දැනට කෙටුම්පතක් බව සැබෑවකි. එහෙත් මේ ආකාරයට ඉදිරියට ගෙන ගියහොත් පුවත්පත් කොමිසමෙන් මෙය ක්‍රියාත්මක කළොත් ප්‍රායෝගිකව මෙරට මාධ්‍යයට සැහෙන ප්‍රශ්න ඇතිවන්නට පුලුවන. නීතියට පටහැණිව කටයුතු කරනවා යැයි කියා මාධ්‍යයට විශාල වශයෙන් බලපෑම් කරන්නට පුලුවන. කෙසේ වෙතත් මේ ආචාරධර්ම වලින් අනාගතයේ ලංකාවේ මාධ්‍යයට බරපතළ බලපෑම් කරන බව නම් පැහැදිලි ය.

පුවත්පත් කොමිසම නීතියේ හැටියට ස්ථාපිත වී නැති බවට විරෝධතා තිබේ. දැනට මාධ්‍යවේදීන්ගෙන් සහ පුවත්පත්වලින් නියෝජිතයන් මෙහි නැත. දැනට එහි සිටින්නේ ආණ්ඩුවෙන් නම් කළ අය පමණි. එනිසා මෙය නීතියට පටහැණි බවටත් ඉදිරියට කරගෙන යා නොහැකි බවටත් විරෝධතා තිබේ. මේ සම්බන්ධ තීරණාත්මක තැනකට තවම පැමිණ නැත. එනිසා සමස්තයක් වශයෙන් ගෙන බලන විට මෙය ආචාරධර්ම පද්ධතියක් පමණක් යැයි කියා පැත්තකින් තැබීම කිසිසේත් සුදුසු වන්නේ නැත.

කර්තෘ සංසදය, පුවත්පත් පැමිණිලි කොමිසම සාදාගත් ආචාරධර්ම පද්ධතියක් මේ රටේ තිබේ. ඒවා කාලයෙන් කාලයට අලුත් කෙරෙනු ඇත. එවැන්නක් තිබියදී ආණ්ඩුවෙන් මාධ්‍ය ආචාරධර්ම ඉදිරිපත් කිරීම සුදුසු යැයි මා සිතන්නේ නැත. ඕනෑම රටක මාධ්‍ය නියාමනය විය යුත්තේ ආණ්ඩුවෙන් නොවේ. කවුරු හෝ එසේ සිතන්නේ නම් එය ආදිකාලයේ සිතුවිල්ලකි. නවීන ප්‍රජාතන්ත්‍රවාදය යනු මෙවැනි අදහස් බැහැර කළ ප්‍රජාතන්ත්‍රවාදයකි. එසේ නම් අපේ අදහස විය යුත්තේ ආයෙම හත්තෑගණන් වලට යාමටද? නැතිනම් ඉදිරියට යාමටද? මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් හොඳින් අවධානය යොමුකර කටයුතු කිරීම අවශ්‍ය ය.

ආණ්ඩුව මේ ආචාරධර්ම ගෙන එන්නේ හුදෙක්ම මාධ්‍ය බලය තමන් අතට ගැනීමේ අපේක්ෂාවෙන් බව පැහැදිලි ය. තම රටේ ආණ්ඩුව එසේ කරනවා යැයි නොසිතිය යුතු වුවද ආචාර ධර්ම සකසා ඇති ආකාරයත් එහි ඇතුළත් කාරණා දෙසත් බලනවිට එවැන්නක් තිබේ යැයි තීරණය කිරීමට සිදුවනු ඇත.

> "උතුරේත් දකුණේත් යුද්ධය පැවති කාලයේ මාධ්‍ය සහ අද පවතින මාධ්‍ය අතර විශාල වෙනසක් තිබේ. කෙතරම් බාධා මධ්‍යයේ වුවත් ඕනෑම පොදු රාජ්‍ය මණ්ඩල රටක මාධ්‍ය සමග සැසඳිය හැකි මාධ්‍යයක් මෙරටට තිබුණි. හදිසි නීතිය යටතේ පවා මාධ්‍ය තම වැඩ කොටස කිරීමට උත්සාහ ගත්තේය. අද තිබෙන මාධ්‍ය ආණ්ඩුවෙන් තළාදමා තිබේ. මාධ්‍යවේදීන් රටෙන් පිටව ගොසිනි. සෑම අංශයක්ම පහළට ගොසිනි."

උතුරේත් දකුණේත් යුද්ධය පැවති කාලයේ මාධ්‍ය සහ අද පවතින මාධ්‍ය අතර විශාල වෙනසක් තිබේ. කෙතරම් බාධා මධ්‍යයේ වුවත් ඕනෑම පොදු රාජ්‍ය මණ්ඩල රටක මාධ්‍ය සමග සැසඳිය හැකි මාධ්‍යයක් මෙරටට තිබුණි. හදිසි නීතිය යටතේ පවා මාධ්‍ය තම වැඩ කොටස කිරීමට උත්සාහ ගත්තේය. අද තිබෙන මාධ්‍ය ආණ්ඩුවෙන් තළාදමා තිබේ. මාධ්‍යවේදීන් රටෙන් පිටව ගොසිනි. සෑම අංශයක්ම පහළට ගොසිනි. නීතියේ අධිකරණයේ පවා පහළ යාමක් දැකගත හැකිය. ඒ වගේම මාධ්‍යයත් සෑහෙන පමණ ආණ්ඩුවට පාලනය වී තිබේ. විවේචනාත්මකව ලිවීමට, බය නැතිව යමක් ගැන කතාකිරීමට ඇත්තේ සීමිත ඉඩකි. මාධ්‍යයට බියක් තිබේ. ඒ නිකම්ම නොවේ. මාධ්‍ය එසේ බියවීමට යම් යම් හේතු තිබේ. ඒවාත් සමග මෙවැනි ආචාර ධර්ම පද්ධතියක් දැමීම කිසිදු තේරුමක් නැත.

තොරතුරු දැනගැනීමේ අයිතිය සෑම රටකම පාහේ නීතියෙන් සුරක්ෂිත කර තිබේ. අපේ අසල්වැසි රටවල් මෙයට හොඳ උදාහරණයි. මේ නීතිය මුලු සමාජයටම බලපාන්නකි. මේ නීතිය මෙරට ඇතිකිරීමට අවස්ථා කිහිපයකදීම උත්සාහ කළ ද එය සාර්ථක වූයේ නැත. දැනටත් මේ නීතිය මෙරට නැත. මේ වාතාවරණය යටතේ ජනතාවට යම් තොරතුරක් හෝ දෙන්නේ මාධ්‍යයෙනි. එය තවදුරටත් පාලනය කිරීමට යන්නේ ඇයිදැයි සිතාගත නොහැක.

විවේචනය නැවැත්වීම මේවායේ අරමුණ බව පෙනෙන්නට තිබේ. යමක් ලිවීම නතර කිරීම ඝාතනයෙන් පමණක් නොව චරිත ඝාතනයෙන්ද කළ හැකිය. වත්මන් ආණ්ඩුව බොහෝ උපාය උපක්‍රම සූක්ෂමව යොදාගන්නා බව පෙනෙන්නට තිබේ. ඒ සම්බන්ධයෙන් සැකයක් නැත. එසේ කරන්නේ යම් අරමුණක් ඇතිව ය. සාමාන්‍ය ජනයාට ප්‍රශ්න ඇතැයි කිව නොහැක. එය දකුණේ සිට උතුරටම පොදු ය. යුද්ධයෙන් පසු සංවර්ධනය කෙරෙන ආකාරය විශාල ප්‍රශ්නයකි. ව්‍යාපෘති කෙරෙන්නේ කෙසේද, ප්‍රදාන දෙන්නේ කෙසේද, මේවායින් ප්‍රතිලාභ ගන්නේ කවුරුන්ද යන්න ගැන ප්‍රශ්න තිබේ. ඉඩම් ප්‍රශ්න ගැන ආන්දෝලනයක් තිබේ. ආණ්ඩුවේ ක්‍රියාවලට නීතිය බලනොපාන ආකාරයට මාධ්‍යයෙන් විවේචනය නොවන ආකාරයට විශේෂ රාමුවකට ගැනීම මෙහි පරමාර්ථය බව පෙනෙන්නට තිබේ. මේ සියලු සාධක සැලකිල්ලට ගෙන බලන විට මේ ආචාර ධර්ම ඉදිරි සැලසුමක කොටසක් බව පැහැදිලි ය.



# මාතලේ සමූහ මිනීවළේ නිදන්නේ කවුද..?


\- ආසියානු මානව හිමිකම් කොමිසම විසිනි.

*මාතලේ සමූහ සුසානය පිළිබඳ වෝහාරික පරීක්ෂණ භාරව සිටි අධිකරණ වෛද්‍ය නිලධාරියා වහාම ක්‍රියාත්මක වන පරිදි මාරු කරනු ලැබීය. සමූහ මිනීවළ පිළිබඳ නඩුවටද ආණ්ඩුවෙන් අති මහත් බලපෑම් එල්ල වෙමින් තිබේ. එහෙත් ඇත්ත වසං කරන්නට තැත් කරනවුන් අමතක කරනා එක් දෙයක් ඇත. එය නම්, සෑම අබිහරසකම මතු යම් දිනෙක එළිවන ස්වභාවයක් තිබෙනා බවයි. පහත දැක්වෙන්නේ මෙම සිද්ධිය පිළිබඳ මනා අවධානයකින් පසුවන සහ ඒ පිළිබඳ කරුණු ගවේෂණයේ යෙදී සිටින ආසියානු මානව හිමිකම් කොමිසම,* '**SRI LANKA: Whose remains are in the mass grave at Matale**' *යනුවෙන් ප්‍රකාශයක් නිකුත් කරමින්, සමූහ මිනී වළේ නිදන්නේ කවුරුන්ද යන්න සහ අපරාධ චූදිතයන් කවුරුන් විය යුතුද යන්න ඉතා පැහැදිලිව - නම් ගම් සහිතව හෙළි කර සිටින ආකාරයයි.*

මාතලේ සමූහ මිනී වළ පිළිබඳ ප්‍රසිද්ධියට පත්වී තිබෙන කරුණු වන්නේ මේ සමූහ මිනීවළෙන් පුද්ගලයන් 154 දෙනෙකුගේ අවශේෂයන් හමුවූ බවත්, එම අවශේෂයන්වල ඔවුන් සියලු දෙනාම ඝාතනයට ලක්වූ බව හඟවන තුවාල තිබූ බවත්, ඒ සියලු දෙනා 1986 සහ 1991 අතර යම්කිසි කාලයකදී මරා දමා ඇති බවත් ය.

කෙසේ වෙතත්, එහි තිබෙන්නේ කාගේ අවශේෂයන්ද යන්න මූලික ප්‍රශ්නයකි. මේ සමූහ සුසානය තුළ තිබෙන අවශේෂවල හිමිකරුවන්ගේ සැබෑ නම් හඳුනාගැනීම, යුක්තිය හා සබැඳි අනාගත මුලපිරීම්වලට පමණක් නොව මේ කාලපරිච්ඡේදයේදී සිය ප්‍රියයන් අහිමි වූ පවුල්වල දෘෂ්ටි කෝණයෙන් ද වැදගත් වෙයි. බොහෝ පවුල්වලට, මේ කාල පරිච්ඡේදය තුළ 'අතුරුදන් වූ' සිය ප්‍රියයන්ට සිදුවූයේ කුමක්ද යන්න මනෝවිද්‍යාත්මක වශයෙන් වැදගත් ප්‍රශ්නයක් මෙන්ම භාවතිශය ගැටලුවක් ද වෙයි. සෙසු තොරතුරු මූලාශ්‍රයන්ගෙන්, මේ තැනැත්තන් කවුරුන්ද යන ප්‍රශ්නයට පිළිතුරු සොයාගතහොත්, ඔවුන්ගේ අවශේෂයන් මෙතැනට පැමිණියේ කෙසේද යන ගැටලුවට පිළිතුරු සොයාගැනීම ද කළ හැකි දෙයක් බවට පත් වේ.

ඔවුන් කවුරුන්ද යන්න පිළිබඳ සාක්ෂි සොයාගැනීම පිණිස අපි, චන්ද්‍රිකා බණ්ඩාරනායක ආණ්ඩුව විසින් පත් කළ ස්වෙච්ඡා සහගත නොවන අතුරුදන්වීම් විමර්ශනය කිරීම සඳහා පත්කළ විශේෂ ජනාධිපති කොමිෂන් සභාවන්ට ලබාදී තිබෙන සාක්ෂි වාර්තා විමසා බැලුවෙමු. සිය පවුල්වල සාමාජිකයන්ගේ හෝ වෙනත් ඔවුන් දැනසිටි සහ සැලකිලිමත් වූ අයවලුන් ගේ අතුරුදන්වීම් පිළිබඳ විවිධ තොරතුරු හෙළිකරමින් පැමිණිලිකරුවන් විසින් ලබාදුන් දහස් සංඛ්‍යාත සාක්ෂි මේවායේ අන්තර්ගත වේ. ඇත්ත වශයෙන් පවසන්නේ නම්, මෙම සාක්ෂිවල පිටු සිය දහස් ගණනක් අප සතු ය.




*කාටූන් ශිල්පියෙකු යථාර්ථය දුටු හැටි*

මෙම සමූහ මිනීවළ පිහිටා තිබෙන්නේ මාතලේ වන හෙයින් මධ්‍යම සහ ඌව පළාතවල වශෙෂ පනාය්පති කොමිෂන් සභාවන් වෙත ලබාදී තිබෙන සාක්ෂි කෙරෙහි අපි අවධානය යොමු කළෙමු. ඕලුවිල්කන්ද, රත්තොට, අලුවිහාර, කයිකාවෙල, උඳස්ගිරිය, ගුරුබැවිල, මැටිහක්ක, මුමන්දෙණිය සහ අලකොළමඩ ප්‍රදේශවලින් අතුරුදන්වූ පුද්ගලයන් පිළිබඳ අපි විශේෂ අවධානයක් යොමු කළෙමු. මේ ගම්මානවලින් පැමිණි පැමිණිලිකරුවෝ පැහැරගැනීමට ලක්වූ පුද්ගලයන් පිළිබඳ මෙන්ම ඔවුන්ව පැහැරගත්තේ කවුද යන්න ගැනත් එසේම ඔවුන් පැහැරගැනීමට හේතු වූ විශේෂිත කරුණු පිළිබඳ ද සසල වනසුලු කතාන්දරයන් පැවසූහ. ඔවුන් අතරින් ගණනාවක් සුලු හේතු මත අත්අඩංගුවට ගෙන ඇති බවට වූ කම්පනය වන සුලු කරුණු, ඔවුන් සියලු දෙනාම ආණ්ඩුවට එරෙහිව ජවිපෙ වෙනුවෙන් අවි අමෝරා ගත්තවුන් බවට පෙන්වූ රජයේ අනුවාදය විදහා දැක්වීය.

එකී පැමිණිලි අතරින්, පහත දැක්වෙන ප්‍රදේශවලින් අතුරුදන් වූ පුද්ගලයන්ගේ නම් ඒකරාශී කර ගැනීම ට අපට හැකි විය.

| | නම | පැහැර ගැනීමට ලක්වූ ස්ථානය | පැහැර ගැනීම සිදුකළ අය |
|---|---|---|---|
| 1 | වයි.බී. රාමනායක - රත්තොට | වඩු තාක්ෂණික පාසලකින් | කළු ඇඳුම් ඇඳි වෙස්මුහුණු පැළඳි අය |
| 2 | එම්. ජිනසේන- කයිකාවල | කයිකාවල පොල්වත්ත | අංක තහඩුවක් නොමැති වාහනයකින් පැමිණි කොමාන්ඩෝ ඇඳුමින් සැරසුණු පුද්ගලයන් 12 දෙනෙකුගෙන් පමණ යුත් කල්ලියක් විසින් |
| 3 | දයානන්ද බණ්ඩාර- කයිකාවල | පොල්වත්ත | ඉහත එම |
| 4 | කරුණාරත්න බණ්ඩා- කයිකාවල | පොල්වත්ත | ඉහත එම |
| 5 | ආර්.ඒ. රණසිංහ- කයිකාවල | පොල්වත්ත | ඉහත එම |
| 6 | ජිනසේන -කයිකාවල | පොල්වත්ත | ඉහත එම |
| 7 | ජිනසේන ප්‍රනාන්දු-කයිකාවල | පොල්වත්ත | ඉහත එම |
| 8 | ලැම්බට් පෙරේරා- කයිකාවල | පොල්වත්ත | ඉහත එම |
| 9 | ගුණසිරි - කයිකාවල | පොල්වත්ත | ඉහත එම |
| 10 | සුදත් හෙවත් සනා- කයිකාවල | පොල්වත්ත | ඉහත එම |
| 11 | විජේසිංහ -කයිකාවල | පොල්වත්ත | ඉහත එම |
| 12 | ගාමිනී- කයිකාවල | පොල්වත්ත | ඉහත එම |

| | | | |
|---|---|---|---|
| 13 | කේ.ජී. රත්නපාල -කයිකාවල | පොල්වත්ත | ඉහත එම |
| 14 | ආර්.එම්.කරුණාරත්න-කයිකාවල | පොල්වත්ත | ඉහත එම |
| 15 | ගුණසිරි - කයිකාවල | පොල්වත්ත | ඉහත එම |
| 16 | ඩබ්.ඒ. සිරිකුමාර - මුමන්දෙණිය | නිවසේ සිටියදී | මාතලේ විජේ විද්‍යාලයේ සහ රත්තොට හමුදා කඳවුරේ සිට සුදු පැහැති ඩෙලිකා වෑන් රියකින් සහ නිල් පැහැති පැජරෝ ජීප් රථයකින් පැමිණි සිවිල් ඇඳුමින් සැරසුණු තැනැත්තන් ගණනාවක් විසින් |
| 17 | ජී.ජී. පුංචිබණ්ඩා-අලකොලමඩ | අලකොලමඩ සිය නිවසේ සිටියදී | පැමිණිලිකරුවන් විසින් , විජේ විද්‍යාලයේ සහ රත්තොට කඳවුරුවලින් පැමිණි බවට සැකකරන සිවිල් ඇඳුමින් සැරසුණු තැනැත්තන් විසින් |
| 18 | ජී.ජී. දසනායක- අලකොලමඩ | ඉහත එම | ඉහත එම |
| 19 | ටී.එම්. තෙන්නකෝන් බණ්ඩා-ගුරුබැවිල | රත්තොට කඳවුරට භාර වූ අතර එහි සිට ඔහුව විජේ විද්‍යාල කඳවුර වෙත ගෙන යන ලදී. | |
| 20 | පී.ඩී. කරුණානායක-උදස්ගිරිය | අරදාස මහතාගේ සාප්පුවේ සිටියදී | යටවටේ හමුදා කඳවුරේ කෝප්‍රල් විමලසිරි, කපිතාන් බණ්ඩාර සහ සෙසු නිලධාරීන් සය දෙනෙක් විසින් |
| 21 | සුමන් අශෝක-අලුවිහාර | නිවසේ සිටියදී | බිල්ලෙක් ලෙස පැමිණි කේ. සෝමසුන්දරම් සමග සිටි මාතලේ පොලිස් ස්ථානයේ පොලිස් නිලධාරියෙක් විසින් |
| 22 | ඒ.ජී. ජයතුංග - ඔරුවිල්කන්ද | නිවසේ සිටියදී | ඔරුවිල්කන්ද හමුදා කඳවුරේ සාජන්ට් ජයතිස්ස විසින් |
| 23 | එන්.කේ.ජී.ජී. උපසේන - ඔරුවිල්කන්ද | සිය නිවස අසල කුඹුරක සිටියදී | හමුදා නිලධාරී, නිමල් සේනාවීර සහ සුසිනි ජයසිංහ, පොලිස්පති කරුණාතිලක, නන්දසිරි ජිනදාස සහ ඕලුවිල්කන්ද හමුදා කඳවුරේ නිලධාරියෙකු වූ ජයතිස්ස. චමින්ද සුගතපාල නමැති පුද්ගලයෙක් බිල්ලා ලෙස පැමිණියේය. |
| 24 | ජී.එච්.ඩී. කුමාරසිරි-ඔරුවිල්කන්ද | නිවසේ සිටියදී | හමුදා නිලධාරීන් ජයතිස්ස සහ වතු හිමිකරු ගුණසේකර වසන්ත මහතා සහ කුම්සොන්සිරි හා මුතුසාමි නමැති බිල්ලන් ලෙස පැමිණි දෙදෙනෙක් |
| 25 | කේ.පී. සිරිසේන- ඔරුවිල්කන්ද | දෙවාර පන්සලේදී | සාජන්ට් ජයතිස්ස සහ හමුදා නිලධාරීන් සය දෙනෙක්. වෑන් රථයකින් පැමිණ ගෙන යන ලදී. |
| 26 | යූ.ජී. චන්ද්‍රපාල- ඔරුවිල්කන්ද | ඕලුවිල්කන්ද කඳවුර අසලදී | උදස්ගිරිය කඳවුරේ සාජන්ට් ප්‍රේමදාස සහ ඕලුවිල්කන්ද කඳවුරෙන් සාජන්ට් ජයතිස්ස |

*මේ කාලය වන විට මළ සිරුරු හමුවී තිබූ පුද්ගලයන්ගේ නම් අප විසින් මෙම ලැයිස්තුවට ඇතුළත් කර නැත.*

පැමිණිලිකරුවන් විසින් විශේෂ කොමිෂන් සභාව ඉදිරියේ සිදුකළ ප්‍රකාශයන්ගෙන් හෙළිවන වැඩිදුර තොරතුරුවලින් ඇතැම් පැහැරගැනීම්වලට සවිස්තරාත්මක හේතු සැපයීය. අංක 2 සිට 15 දක්වා ලැයිස්තුගත කර තිබෙන පුද්ගලයන් අත්අඩංගුවට ගෙන තිබුණේ පොල්වත්ත කයිකාවල පිරිත් මඩුවකට උදවු කරමින් සිටින අතර ය. මෙම පිරිත් මඩුව ඉදිකර තිබුණේ ප්‍රදේශයේ මැණික් ව්‍යාපාරිකයෙක් විසිනි. ඩෙලිකා වෑන් රථයකින් සහ පැජරෝ රථයකින් කොමාන්ඩෝ නිල ඇඳුම්වලින් සැරසුණු හමුදා නිලධාරීන් පැමිණ ඔවුන්ව පැහැරගෙන ඇත්තේ එවිට ය. මෙම පුද්ගලයන් ප්‍රාදේශීය දේශපාලනඥයෙකු වූ කවිරත්න මහතා සමග යම්කිසි දේශපාලන ගැටලුවක් ඇති කර ගෙන තිබිණි. විශේෂ කොමිෂන් සභාවට සිදුකරන ලද එක් පැමිණිල්ලකට අනුව, තමන්ට එරෙහි වූ පුද්ගලයන් ගණනාවක් දැන් සිටින්නේ මළවුන් අතර යැයි කවිරත්න මහතා විසින් පසුව පුරසාරම් දොඩා තිබේ. පැමිණිලිකරුවන් තවදුරටත් පැවසුවේ ඒ දිනවල මළ සිරුරු පාරවල්වල ප්‍රදර්ශනය කෙරෙන විට, තමන්ගේ විරුද්ධවාදීන්ගේ මළ සිරුරු ද ඒ මළවුන් අතර වේ දැයි කවිරත්න මහතා එම ස්ථානවලට ගොස් පරීක්ෂා කර බලන බවයි.




මුමන්දෙනියේ අංක 16, ඩබ්.ඒ.සිරිකුමාර වෙනුවෙන්
ඉදිරිපත් වූ පැමිණිල්ලේ සඳහන් වන්නේ ඔහුව
පැහැරගැනීම සිදුකළේ ඒ කාලයේ ගජබා
රෙජිමේන්තුවේ අණ දෙන නිලධාරියා වශයෙන් කටයුතු
කළ ගෝඨාභය රාජපක්ෂ විසින් බවයි.
ප්‍රදේශය භාර එස්.පී. බාලසූරිය වෙතද මේ සම්බන්ධ ව
පැමිණිලි කරනු ලැබීය.

මුමන්දෙනියේ අංක 16, ඩබ්.ඒ.සිරිකුමාර වෙනුවෙන් ඉදිරිපත් වූ පැමිණිල්ලේ සඳහන් වන්නේ ඔහුව පැහැරගැනීම සිදුකළේ ඒ කාලයේ ගජබා රෙජිමේන්තුවේ අණ දෙන නිලධාරියා වශයෙන් කටයුතු කළ ගෝඨාභය රාජපක්ෂ විසින් බවයි. ප්‍රදේශය භාර එස්.පී. බාලසූරිය වෙතද මේ සම්බන්ධ ව පැමිණිලි කරනු ලැබීය. මාතලේ පොලිස් ස්ථානයේ '1' ශාඛාවේ අණ දෙන නිලධාරියා වූ නාවලගේ මහතා වෙත ද පැමිණිල්ලක් ඉදිරිපත් කරනු ලැබීය.

ඉහතින් නම් සඳහන් කළ පුද්ගලයන්ගේ අවශේෂයන් මේ සමූහ සුසානයෙන් සොයාගත් මළ සිරුරු අතර තිබීමට පුලුවන.

පැමිණිලිකරුවන් සහ පවුල්වල සෙසු සාමාජිකයන්ගෙන් වැඩිදුර තොරතුරු එක්රැස් කර ගන්නේ නම් මේ තිබෙන්නේ කාගේ අවශේෂයන්ද යන පැනය තවදුරටත් කිසිම ආකාරයකින් අබිරහසක් නොවනු ඇත. ඇතැම්විට ඉහත සඳහන් ගම්මානවලින් වැඩිමනත් තොරතුරුද ලබාගත හැකිවනු ඇති අතර මේ සමූහ සුසානයේ වළ දැමුවේ කවුරුන්වදැයි හඳුනාගැනීමේදී ඒ තොරතුරු ප්‍රයෝජනවත් වනු ඇත.

# ප්‍රශ්නයක් ගැන කතා කරමු



\- **බැසිල් ප්‍රනාන්දු විසිනි.**

දයාබර මිතුර, මගේ පුරවැසි සගය,
මා මේ ලියන්නේ
මා සිතන දෙය ඔබට පැවසීමටයි.
ඔබත් මමත් දෙදෙනාම ගිලන් ය.
අප හැම දෙනාම ගිලන් ය.
අතිශය ගිලන් ය.
මා ලියන්නේ ඔසුවක් දීමට නොවේ
විසඳුමක් දීමට ද නොවේ
නමුත් ඔබට ප්‍රශ්නය ගැන කීමටයි.
මගේ ප්‍රශ්නය, ඔබේ ප්‍රශ්නය
අපේ ප්‍රශ්නය.
අප ගිලන් ය. ඉතා ගිලන් ය.
මා සිතන්නේ පිළිගත යුතු ය ප්‍රශ්නය
නොදන්නා නමුත් අප විසඳුමක්

අපි ඝාතන-මහා ඝාතන සමරන්නෙමු
ඒ බව පිළිනොගන්නෙමු.

නමුත් මිතුර, පුරවැසි සගය,
ඝාතනය කරන්නේ කෙසේදැයි
කොතරම් ඝාතන කරන්නේදැයි
නියතවම අපි දුටුවෙමු.

අපි දුටුවෙමු අපේ පුරවැසි සගයන්
මව්වරුන්, පියවරුන්, සහෝදර සහෝදරියන්
කෑ ගසමින් හඬන අයුරු, දිවා රෑ දෙකෙහිම
වසර ගණන් හඬන අයුරු.

නියතවම අපි දන්නෙමු අප මරා දමන බව.
අපි දුටුවෙමු. නමුත් අපට දැකීමට අවශ්‍ය නොවීය.
අපි ඇසුවෙමු. නමුත් අපට ඇසීමට අවශ්‍ය නොවීය.
අපි දන්නෙමු. නමුත් අපට දැනගන්නට ඇවැසි නොවීය.
අප දැනගන්නට අකමැති ය.

අපට කොතරම් නිහඬ වන්නට අවැසි වීද.
අපේම මනස් අපට කියමින් සිටියා
අප මිනී මරන බව, බොහෝ ගණනින් මිනී මරන බව,
අති විශාල ලෙස මිනී බව, අනුකම්පා විරහිත ව මිනී මරන බව.

අපට මේ ප්‍රශ්නය තිබේ.
දැනගැනීමට බිය, නැවැත්වීමට බිය.

අප නැවතත් මිනී මරන බව අපි දන්නෙමු.
එය පිළිගන්නට අපට අවැසි නැත.
අපි දන්නෙමු, අපි දන්නෙමු, මගේ මිතුර, මගේ පුරවැසි සගය,
අප එය නැවතත් කරන බව, ඔව්, නැවත නැවතත්.

අපට ප්‍රශ්නයක් තිබේ. මගේ මිතුර, මගේ පුරවැසි සගය,
අපට ප්‍රශ්නයක් තිබේ.
අපි කතා කරමු. ඇති තරම් වේලා කතා කරමු.
අපේ ප්‍රශ්නය ගැන කතා කරමු.



# සාධාරණ තීන්දු වෙනුවෙන් අපි එදා විනිසුරු කුටියේදී අසිපත් අමෝරා ගත්තා

**ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ තිස් නව වැනි වාර්ෂික සම්මේලනය සඳහා විධායකය පත්කළ අගවිනිසුරුට නොව රටේ යුක්ති සහගත අගවිනිසුරුවරිය වන ආචාර්ය ශිරානි බණ්ඩාරනායක මැතිනියට ඇරයුම් කිරීමට කටයුතු කෙරිණි. එම උත්සවයේදී ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ නව සභාපති වශයෙන් උපුල් ජයසූරිය මහතා හඳුන්වා දෙමින් කීර්තිමත් සී.වී. විග්නේස්වරන් විනිසුරු පැවැත්වූ කතාව, පීඩනෝන්මාදයෙන් යුත් රෙජීමයකින් පාලනය වන රටක නීතීඥවරුන් විසින් ගෙන යන අරගලයට මග පෙන්වීමකි. පහත දැක්වෙන්නේ එම කතාවේ සිංහල පරිවර්තනයයි.**

2013 මාර්තු 30 වැනි දින
කොළඹ 7 රාජකීය විද්‍යාල නවරංගහලේදී ය.

*ගුරු බ්‍රහ්ම ගුරු විෂ්ණු ගුරු දේවෝ මහේෂ්වර ගුරු සාක්ෂාත් පාර බ්‍රහ්ම තස්මයි ශ්‍රී ගුරාවේ නමාහ්*

*ගුරු ආචාර්ය ශිරානි බණ්ඩාරනායක මැතිනියනි, නීතීඥ සංගමයේ සභාපති උපුල් ජයසූරිය මහතාණෙනි, හිටපු නීතිපති සුනිල් ද සිල්වා මහතාණෙනි, මගේ දයාබර සහෝදර සහෝදරවරුනි, පළමු අධිකරණ නිලධාරීන්ගේ වාර්ෂික සම්මේලනය ආමන්ත්‍රණය කිරීමට මට වාසනාව ලැබී මේ වන විට දිගු කාලයක් ගතවී නැහැ. එවිට මම සඳහන් කළා, ඔවුන්ට මා මතක් වන්නට විශ්‍රාම ගොස් දිගු අට වසරක් ගෙවී ගිය බව. එනිසා දින කිහිපයකට කලින්-පසුගිය බදාදා තෝරා පත් කර ගත් ඔබේ අලුත් සභාපතිවරයා මා අමතා මට ඔබ අමතන මෙන් ඇරයුම් කළ විට එය නිසැකවම සිත්කළු පුදුමයක් වුණා. කෙටි දැනුම් දීමක් වුවත් එයින් පෙනී ගියා, මෑත කාලයේදී අප වටා දියාරු වී වැගිරුණු සහ විඛාදනය වුණු-එදා අපෙන් සමහරු අති දැවැන්ත විශ්වාසනීයත්වයකින් යුතු වූ සාරධර්ම සහ ප්‍රතිපත්ති ප්‍රමාද වී නමුත් නීතීඥ වෘත්තිය විසින් තවමත් අගය කරන බව.*

අප්‍රකට ජීවිත ගත කිරීමට යොමු වෙමින් සහ ලද දෙයින් තුටු වෙමින් කිසියම් කාලයකට එබඳු ප්‍රේරණයන්ගෙන් ඈත්ව හිඳීම, සත්‍ය වශයෙන්ම අපේ මිත්‍රයන්ගෙන් සහ සෙසු අය වෙතින් නෛතික වෘත්තියේ සහ අධිකරණවල සිදුවන්නේ කුමක්ද යන්න ගැන සොයාගැනීමට ඉවහල් වන බවට මට සැකයක් නැහැ.

1979 වර්ෂයේ අධිකරණ සේවයට කැඳවීමට පෙර මා සක්‍රිය ලෙස වසර 15 ක් නීතීඥ වෘත්තියේ නියැළී සිටි බව ඔබෙන් බොහොමයක් දෙනා දන්නේ නැහැ. 1977 දී නැසී ගිය රාජ නීතීඥ නෙවිල් සමරකෝන් මහතා වෙත ගොස්, ඔහුට නීතීඥ සංගමයේ සභාපති ධුරයට තරග කරන ලෙස ඇරයුම් කළ තරුණ නීතීඥවරුන් අතරින් මමද එක් අයෙක්. එවිට ඔහු කිව්වා, *"මට පාඩුවේ ඉන්න දෙන්න! මම සාමකාමී ජීවිතයකට කැමතියි!"* ඉන්පසුව

ඔහු තමන්ගේ සාමකාමී ජීවිතයට අත්‍යවශ්‍යයි කියල සැලකුව, මෙතැනට අදාළ නැතැයි මා විශ්වාස කරන දේවල් විස්තර වශයෙන් දැක්වුවා!

**නමුත් මාස කිහිපයක් ඇතුළත ඔහු මේ රටේ අගවිනිසුරු කබාය සඳහා තරග වැදී තිබු ා. එයින් මද කාලයකට පසුව මට ඔහුව සාදයකදී මු ගැසු ාම මම මෙහෙම ඇහුවා. *"සර්, ඔබ එදා නීතීඥ සංගමයේ සභාපති ධුරයට තරග වදින්නට පැකිළු ා. නමුත් දෛවය ඔබතුමා වෙනුවෙන් වෙනත් සැලසුම් සකස් කර තිබෙනවා වගෙයි."* ඔහු මහ හඬින් සිනාසී, දුම් පයිප්පය පිඹ මෙහෙම කිව්වා. *"ජේ. ආර්. මට කතා කරලා අග විනිසුරු ධුරය පිළිගන්න කිව්වම මම මෙහෙම කිව්වා "එක කොන්දේසියක් උඩ මම එහෙම කරන්නම් කියලා. ඒ මොකක්ද කියල ජේ.ආර්. ඇහුවා. මම කිව්වා, "කිසිම ආකාරයක අතපෙවීම් බෑ' කියලා.* කොහොම වු ත් ජනාධිපති ජයවර්ධන ඔහුගෙ පොරොන්දුව අමතක කරලා අධිකර යට ඇඟිලි ගහන්න පටන් ගත්තා. එයින් මුල පිරු ු දේ, අපේ අවසානාවන්ත ඉතිහාසයේ කොටසක්.**

ගතවූ දශක තුනහමාර ඇතුළත අපේ නෛතික පද්ධතිය පුරා ඔඩු දිවූ බොහෝ පසුතැවිලිදායක සිද්ධීන් තිබුණත් වෘත්තියේ අනාගතය අද තත්වය මෙන් දුක්මුසු වුණේ නැහැ. විනිසුරු වෘත්තියේ විසි පස් වසරක සමග ලබන වසරේ වෘත්තියේ පණස් වසරක් සපුරන පුද්ගලයෙකු සඳහා නීති පද්ධතියේ ගමන් මග දොම්නස් සහගත සහ වඩාත් මෑතකාලීනව තැති ගන්වනසුලු එකක් බව කිව හැකියි. අප සිටින්නේ අපේ වෘත්තියේ පහත්ම ස්ථානයේ යි. ක්‍රමානුකූල ආයතනයික පිරිහීම තරම් කිසිවක් තැතිගන්වනසුලු නැහැ.

මේ රටේ බලය හරියට ගස් සඳහා වනය කපා දැමීම වගෙයි. අධිකරණයේ ස්වාධීනත්වයට ඇඟිලි ගැසීම තුළින් සදාකාලිකව මේ රටේ නීතිය හා යුක්තියට බාධා පමුණුවනවා. පෙනෙන හැටියට ශ්‍රී ලංකාවේ සිද්ධ වෙන දේ වැදගැම්මකට නැති අගයන්ගේ හුදු සිද්ධි හෝ සිද්ධි දාමයන්. එය හරියට ඔවුන්ගේ ඇස් වලට ගස් කිහිපයක් පමණක් පෙනෙනවා වගේ දෙයක්. මහා හිම කන්දක් කඩා වැටෙන්නට නියමිත බවත් එය, අප පිය මනින භයංකාර කැලය නමැති මේ රටේ අධිකරණයේ අනාගතය විනිවිද පැතිර යන බවටත් කිසිම අදහසක් ඔවුන් තුළ නැතිවා වාගෙයි. තමන්ගේම මතයේ ඇලී ගැලී සිටින-කෙටි දුරක් පමණක් දකින අපට බිත්තියේ ලියා ඇති දේ පෙනෙන්නේ නැහැ.

ආගම් හෝ යුක්ති අධිකරණයන් සමග වැඩ කටයුතු කිරීමේදී අපි අපේ මාංශ පේශීන් සුනම්‍ය කර ගත යුතු නැහැ. කොහොම වුණත් ඕනෑම ආගමික සංවිධානයක් විසින් කරනු ලබන කුපිත කරවීමක් හේතුවෙන් එම මස්පිඬු නම්‍යශීලී කරගැනීම නෙවෙයි නිසි පිළිවෙළ විය යුත්තේ. විශේෂයෙන්ම එවැනි සංවිධානවලට දේශීය වශයෙන් විතරක් නෙවෙයි රටෙන් පිටත පවා චිත්තවේගී ස්වභාවයන් තිබෙන විට. ඒ වගේම නැවත වරක් වත්මන් සන්දර්භය තුළ, නීතියේ අධිකරණ සම්බන්ධයෙන් මැරවර උපායන් යෙදවීමත් ඉතාම අමනෝඥ දෙයක්. ආගමික නිදහස මත පහර එල්ල කිරීම විසින් රාජ්‍ය සංස්ථාව රැඩිකල්කරණය වනවා වගේම ඒවා

අපේ සමාජයට, දේශපාලනිකමය හෝ වෙනත් ආකාරයකින් බලපෑම් කරන ගැටලු ගැන කැළඹිලි ඇති කරන්නටත් ඒවා ගැන භාවාතිශය වන්නටත්, ඉන් පසුව එම ගැටලු සම්පූර්ණයෙන්ම අමතක කර දමන්නටත් ශ්‍රී ලාංකිකයන් වන අපේ සිරිතක් තිබෙනවා.

අපි හැඟීම්බර නමුත් අපේ මතකය කෙටිකාලීනයි. සමහරවිට එය අපේ දූපත් ගති ලක්ෂණය වන්නට පුළුවන්.

නමුත් සිංහල භාෂාවෙන් විස්තර කරන විදිහෙ වාසි පැත්තට හෝයියා කියන අවස්ථාවාදී චපල කම අපි මේ තරම් සාරවත් විදිහට උරුම කරගත්තෙ කොහෙන්ද..?

මේ රටේ බලය හරියට ගස් සඳහා වනය කපා දැමීම වගෙයි.

පෝෂණය කළ අයට පවා පාලනය කළ නොහැකි පරිදි එම අවදානම් බැම්වලින් මුදවා හරිනවා. යුක්තියේ දෙව්මැදුර මතට එල්ලකරන ප්‍රහාර විසින් ඉවත් කර දමන්නේ තාර්කිකත්වය සහ ආණ්ඩුවත් තනි පුද්ගල අතිරික්තයත් පිළිබඳ අපක්ෂපාතී සංවරණය පමණයි. වර්තමානයේ තිබෙන ආකාරයට මේ දෙකේ සංකලනය, පුපුරන්නට බලා සිටින කාල බෝම්බයක් සහ එකවිට වෙනත් ප්‍රදේශවලටත් පැතිරෙන පිළිකාවකට සමානයි.

තමන්ගේ ආගම සහ තමන්ගේ වෘත්තිය ප්‍රහාරයට ලක්වී තිබෙන විශේෂ ආරාධිතයන්ගෙන් එක් අයෙකු අද දිනයේ මෙහි නොපැමිණීම, සැලකිය යුතු පුද්ගලයන් වෙත පවා එල්ල වී තිබෙන පීඩනය අවතක්සේරු කරන්නක් සහ එහි බලපෑම දුර්වල කරන්නක්. මේ සම්බන්ධයෙන් මා සිතුවා ගරු නීතිපති තුමා මෙහි පැමිණ ඔහුගේ චාරිත්‍රමය බැඳීම කිසිදු බියකින් තොරව ඉටු කළ යුතුයි කියා. නමුත් මට ඔහු ව අද මෙතැන පෙනෙන්නේ නැහැ.

තමන් විසින් නිර්මාණය කළ ආගමික අන්තවාදීන් ට ආගමික ලැදියාවෙන් යුතුව සිය ජීවිතවලින් පවන් සළන දේශපාලනඥයන් අප දැක තිබෙනවා. නීතිය සහ යුක්තියේ අධිකරණවලට මැදිහත් වෙන්නට උත්සාහ කර, පසුව ඔවුන්ගේම කුටෝපායන්ගේ ගොදුරු බවට පත්වූ දේශපාලනඥයන් මා දැක තිබෙනවා. ප්‍රචණ්ඩකාරී උපායන් වපුරනවාට වඩා, එම ආගමික සංවිධානයේ ප්‍රකාශයකයන් හෝ නායකයන් සමග වැදගත් ගැටලු සාකච්ඡා කිරීමයි, කළ යුතු හොඳම දෙය. ඒ වගේම ඔවුන් වෙනුවෙන් නීතිය විසින් නිරූපිතව දක්වා තිබෙන නිරවුල් අනුකූලතාවන් ගෙන හැර දැක්වීමට අධිකරණයට ඉඩදීමත් ඉතා හොඳ දෙයක්. අප ව කොතරම් ඉහළ තත්වයකට එයින් නැංවුණත්, නෛතික ආයතන අපේ හදිසි කල්පනාවන් හෝ ආසාවන් වලට නම්මාගැනීමට හෝ එසේ කිරීමට අප උත්සාහ කරනවා නම් එවැනි ක්‍රියාවන් නැවතත් අප වෙතටම බූමරංග මෙන් කැරකී එනවා.



කාලයකට පෙර උතුරේදී සිදුවුණු බවට අසන්නට ලැබුණු දෙයක් මම කියන්නම්. දිසා විනිසුරුවරයෙක් ඉඩම් නඩුවක් සම්බන්ධයෙන් නියෝගයක් දුන්නා. නඩු කියල පැරදුණු පුද්ගලයා කැන්ගරු උසාවියකට ගියා. විනිසුරු හිටියා. අවුරුදු විසි ගණන්වලට පසුවුණු තරුණියක් අතට දිසා විනිසුරු තීන්දුවෙ කොපියක් දුන්නා. ඇයට හිතුණා තීන්දුව හරි කියලා. ඒ බව ඇය අධිකරණයෙදි ප්‍රකාශ කළා. නමුත් දිසා අධිකරණයෙදි නඩුව පැරදුණු පුද්ගලයා හමුදා කණ්ඩායමක ප්‍රබලයෙක් නිසා වෙන්න ඇති, ඇය එම පුද්ගලයාට ඉඩමේ ටික කාලයක් ඉන්නට පුළුවන් වන විදිහට ඒ නඩු තීන්දුවෙ වෙනස්කම් කිහිපයක් කළා. දිසා අධිකරණයෙදි නඩුව දිනුව කෙනාට දිසා අධිකරණයෙන් රිට් ආඥාවක් ගන්නට උවමනා වුණා. නීතීඥවරයා එම පුද්ගලයාට මෙහෙම කිව්වා. "ඔබ ළඟ ඔබේ වාසියට ලැබුණු නීත්‍යානුකූල නඩු තීන්දුවක් තියෙනවා. අනෙක් කෙනා ළඟ ඔහුගෙ වාසියට ලැබුණු ඩී ෆැක්ටෝ (තත්කාර්ය) තීන්දුවක් තියෙනවා. ඔබ රිට් ආඥාවක් ගත්තොත් ඔබ ව අධිකරණයට අපහාස කළා කියලා කැන්ගරු අධිකරණය ඉදිරියට අරන් යන්න ඉඩ තිබෙනවා. කළ යුතු දේ මොකක්ද කියල ඔබ තීරණය කළ යුතුයි. »

උදාහරණයක් වශයෙන් ජේ.ආර්.ජයවර්ධන මහතා මේ රටේ ආණ්ඩුක්‍රමය, ඔහුටත් ඔහුගේ පක්ෂයටත් අවශ්‍ය පරිදි නමා සකස් කර ගත්තා. නමුත් ඔහු කළ විගඩමෙන් වාසි ලබන්නේ ඔහුගේ පක්ෂය නෙවෙයි. මෙවැනි දුරාචාරයන්ට වර්තමානයේ ඉඩ දී සිටින අය, ජේ.ආර්. එදා කළේ කුමක්ද සහ අද සිදුවන්නේ කුමක්ද යැයි බලා එයින් පාඩම් ඉගෙනගත යුතුයි. බූමරංගය කැරකී අප වෙතම ආ පසුව එය වළක්වාගැනීම සඳහා ප්‍රමාද වැඩි වෙන්නට පුළුවන්. අපේ සමාජයට, දේශපාලනිකමය හෝ වෙනත් ආකාරයකින් බලපෑම් කරන ගැටලු ගැන කැළඹිලි ඇති කරන්නටත් ඒවා ගැන භාවාතිශය වන්නටත්, ඉන් පසුව එම ගැටලු සම්පූර්ණයෙන්ම අමතක කර

දමන්නටත් ශ්‍රී ලාංකිකයන් වන අපේ සිරිතක් තිබෙනවා. අපි හැඟීම්බර නමුත් අපේ මතකය කෙටිකාලීනයි. සමහරවිට එය අපේ දූපත් ගති ලක්ෂණය වන්නට පුළුවන්. නමුත් සිංහල භාෂාවෙන් විස්තර කරන විදිහෙ වාසි පැත්තට හෝයියා කියන අවස්ථාවාදී චපල කම අපි මේ තරම් සාරවත් විදිහට උරුම කරගත්තෙ කොහෙන්ද..? අපේ විනිසුරුවරුන් සහ නීතීඥ වෘත්තියේ සමහරුන් මීට කලින් දවසක මේ රටේ වැරදි අගවිනිසුරු පැත්තට හදිසියේම හැරිලා ඔහු ළඟ දොඩමලු වෙමින් සිටගෙන සිටින ආකාරය මම දැක්කා. විශාලතම වගකීම ගත යුතු ඉහළම අධිකරණය කොතරම් විශිෂ්ට විදිහට ඔවුන්ව යටත් කරගෙන තිබෙනවාද..? නියම අධිකරණයේ සහ නීතීඥ සංගමයේ සාමාජිකයන්ගේ බලාපොරොත්තු සුණු විසුණු වී ඇති බව දැනුණා. මේ බලාපොරොත්තු සුන්වීම ඉදිරියටත් ක්‍රියාත්මක වේවිද යන්න දැකගන්නට ලැබේවි. අප අස්වැන්න ලෙස කපාගන්නේ අප වපුරන දෙයම බව අප මතක තබාගත යුතුයි. ජනාධිපති ජේ.ආර්. විසින් කළ අයහපත් දේවල්වල ප්‍රතිඵලය ඔහුගේ පක්ෂයට උරුම වුණා.

අධිකරණය ඇතුළු අපේ වෘත්තිය පිළිබඳ මතයන් කිහිපයක් දක්වන්නට තරම් මා ජ්‍යෙෂ්ඨ බව මම විශ්වාස කරනවා. අප කිසිවෙකුගේ වෘත්තිය එකිනෙකාගෙන් වෙනස් නැති බව මතක තබාගනිමු. අප යනු වෘත්තියයි. වෘත්තිය යනු අපයි. මේ අනුව අප එකිනෙකා වෘත්තීය ජීවිතය තුළ කරන්නේ මොනවාද, එය තමයි අප විසින් ලෝකයට ලබාදෙන ජනප්‍රිය චිත්‍රය. නමුත් මට සහතික වන්නට පුළුවන්, එය ප්‍රශංසාත්මක නැහැ. අපව පෙනෙන්නේ, සමාජයේ ලේ උරා බොමින් තරවෙන නමුත් කිසිවක් ආපසු සමාජයට ලබානොදෙන පරපෝෂිතයො වගෙයි.

විනිසුරුවරුන් ගැන කතා කරන්නේ නම්, පැහැදිලි හා ඉතා හොඳ නඩුවක් පවතින විටදී ද ඇතැම් විනිසුරුවරුන් ඇතැම් අවස්ථාවන්හිදී එම පාර්ශවයන්ට එකඟතාවයකට එළඹෙන්නට බල කරන ආකාරය පෙනෙනවා. එක්කෝ ඔවුන් සාක්ෂි හරහා ගොස් ඒ අනුව සොයාගැනීම් කිරීමේ ක්‍රමවේදය සඳහා වෙහෙසෙන්නට කැමති නැහැ. එසේත් නැතිනම් ඔවුන් පැහැදිලිවම වද වෙන්නේ නඩු තීන්දුව වාර්තාගත කිරීමට පමණයි. තමන්ගේ ජනප්‍රියම නීතීඥයන් තම නඩු සඳහා පෙනී සිටීමට සැලැස්වීම සම්බන්ධයෙන් ඇතැම් විනිසුරුවරුන් විවේචනයට ලක්වී සිටිනවා. එය එසේ බව සහ විනිසුරු පක්ෂපාතී බව නිතර දෙවේලේ විවේචනයට ගොදුරු වෙනවා. මේ තත්වය යටතේ නීතීඥවරු, පදවි ප්‍රාප්ත විනිසුරුවරයා ඉදිරියේ බාගෙට දනින් නැමී විනිසුරුගේ කැමතිම නීතීඥයන් වීමට පෙළඹෙනවා. එවැනි අධිකරණමය ආශිර්වාදයක් ලැබීම සඳහා ම සිය සේවාදායකයාගේ නඩුව සමථයකට පත්කරගැනීමට ඔවුන් සූදානම් වෙනවා.

යම්කිසි නීතීඥයෙකු විසින් ඕනෑම විනිසුරුවරයෙකුට අයැදසිටිනවා නම් සහ එය අධිකරණයේදී උසුළා සිටිනවා නම් මේ සම්බන්ධයෙන් සාධාරණ මතයක් දැක්විය හැකි බවට සැකයක් නැහැ. නමුත් සිය මගෙන් බැහැර වී යම්කිසි ආකාරයක පක්ෂපාතී කමක් නොදක්වන ලෙසට විනිසුරුවරුන් ප්‍රවේශම් විය යුතුයි. මා මුලසුන හෙබවූ පළාත් බද අධිකරණයන්හිදී, අනෙක් පාර්ශවයේ නීතීඥයන් සමග නොඑනවා නම් මම නීතීඥයන්ට මා හමුවෙන්නට අවස්ථාව ලබාදුන්නේ නැහැ. එහෙම නැතිනම් සියලු අයදුම්කරුවන් විවෘත අධිකරණයේ සිටිය යුතුයි. මා හමුවීමට විනිසුරු කුටියට පැමිණෙන සෑම අයෙක්ම තමන්ගේ නම ලියා මා සමග සාකච්ඡා කරන්නට බලාපොරොත්තු වන්නේ මොනවාද යන්න, මා විසින් ආරච්චි ළඟ තබාතිබූ පොතේ ලියා දැනුම් දිය යුතු වුණා. යම්කිසි නඩුවක් සම්බන්ධයෙන් යම්කිසි නීතීඥයෙකුට මා තුළ ඇති කළ හැකි කෝපයට, එම දිනයේම එම නීතීඥවරයාම වෙනත් නඩුවකට මා ඉදිරියේ පෙනී සිටින විට බලපෑමක් නොකරන්නට මා උත්සාහ ගත්තා. එවිට එම දෙවන අවස්ථාවේදීත් එම නීතීඥයා ඒ දිනයේ මා ඉදිරියේ පළමු වරට පෙනී සිටිනවා හා සමානයි. සරල අර්ථයෙන් ගත්විට මට උවමනා වුණේ නීතීඥවරුන් පිළිබඳ හුරුපුරුදු කමක් හෝ නුරුස්නා කමක් අති විශාල දුරකට වළක්වා ගන්නටයි.

මට පෙනෙන ආකාරයට තවත් අඩුලුහුඬුතාවක් වන්නේ අභියාචනාධිකරණයේ සහාය විනිසුරුවරුන් නඩු තීන්දු ලිවීම සඳහා දක්වන අඩු උනන්දුවයි. නඩු තීන්දුව ලිවිය යුතු විනිසුරු විනිසුරු තීරණය කිරීමෙන් පසුව සෙසු විනිසුරුවරුන් නඩු තීන්දුව අධ්‍යයනය කරන්නට හෝ තමන්ගේ ම නඩු තීන්දුවක් ලියන්නට හෝ විසම්මුතික නඩු තීන්දුවක් ලියන්නටවත් කැමැත්තක් පෙන්වන්නේ නැහැ. එහි ප්‍රතිඵලයක් විදිහට නඩු තීන්දුවල තැනින් තැනින් එකතුකරගත් ස්වභාවය සහ අසම්පූර්ණ ස්වභාවය දැක ගන්නට ලැබෙනවා. එකී විනිසුරුවරයා ලියන

නඩු තීන්දුව සම්බන්ධයෙන් සෙසු විනිසුරුවරුන් ද උනන්දු වෙනවා නම් නඩු තීන්දුව සුපරීක්ෂාකාරී ව ලියැවෙනවා. මාර්ක් ප්‍රනාන්දු විනිසුරුවරයා නීතියේ දීප්තිමත්ම ශිෂ්‍යයෙක් වුණත්, අපේ නඩු තීන්දුවලට බලපාන ගැටලු සම්බන්ධයෙන් ඔහු සමග විනිසුරු කුටියේදී අසිපත් අමෝරාගන්නට මා පුරුදු වී සිටියා. මාර්ක් ඉතාම ඉවසිලිවන්ත විනිසුරුවරයෙක්. ඕනෑම ගැටලුවක් සම්පූර්ණයෙන්ම සහ හරියටම සාකච්ඡා කරන ඔහු, අපේ තීන්දුවල අනිසි විපාක දුටුවොත් සමහර වෙලාවට තමන්ගේ මතය වෙනස් කරනවා.

අපේ වැරදි ගැන පමණ ඉක්මවා විවේචනය කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් මා කිව යුතුයි, ඔබලාව අද දිනයේ ඇමතීම සඳහා ලැබුණු මේ ඇරයුම මා භාරගත්තේ, සිය ධුරය සහ අගවිනිසුරුගේ ධුරය සම්බන්ධයෙන් නිවැරදි නෛතික ස්ථාවරත්වය දැරීම පිණිස උපුල් ජයසූරිය මහතාගේ භාරකාරත්වයට නීතිඥ සංගමය භාරදීමට බවයි. මේ සමාරම්භක උළෙල, ආචාර්ය ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුතුමිය හට සිය මතය මාධ්‍ය හරහා සමස්ත මහජනතාව වෙත කියාපෑමට අවස්ථාව ලබාදෙනවා. මා විශ්වාස කරනවා, තමන් යම්කිසි පුරාණ සිංහල රජතුමෙකුගේ ඥාතියෙක් යැයි ස්වයං පාපොච්ඡාරණයක යෙදෙන කිසිවෙක් මේ රැස්වීමේදී, අද රටේ නීතිය බවට පත්වී ඇති බව පෙනෙන පාදඩකම්වල සිදුනොකරාවි කියා.

ශිරානි බණ්ඩාරයනායක අගවිනිසුරුවරියට එරෙහිව ගෙන ආ ඊනියා විශ්වාස භංග ක්‍රියාවලිය නීතිමය අර්ථයෙන් සදෝෂී බව අප මතක තබාගත යුතුයි. ශ්‍රේෂ්ඨාධිකරණය වගේම අභියාචනාධිකරණයත් මේ සම්බන්ධව තීරණ ලබාදී තිබෙනවා. නීතියේ නිසි අධිකරණ විසින් මේ දක්වාම මේ ක්‍රියාදාමය සදෝෂී බව පිළිගෙන ඇති නිසා, එම නියෝග සහ තීන්දු බලරහිත කරවා ගැනීමට එම විශ්වාසභංගය සඳහා උපදෙස් ලබාදුන් අය අදාළ අධිකරණ හෝ අධිකරණයන් වෙත යා යුතුයි. නමුත් ඔවුන් එසේ කළේ නැහැ. එසේ නොකිරීමෙන් උභතෝකෝටිකයක් පැන නගිනවා. දැනට පවත්නා නියෝග පූර්ණ විනිශ්චයාසනයක් විසින් ආපසු හරවා නැති නිසා සහ නියත වශයෙන්ම අනාගතයේදී තහවුරු වන නිසා, මේ දක්වා ඕ ෆැක්ටෝ හෙවත් නිල නොවන අගවිනිසුරු විසින් ගත් තීන්දු නීති විරෝධී වෙනවා. එවිට, නීතිය යටතේ මේ රටේ අගවිනිසුරු ලෙස පෙනී සිටිය නොහැකි පුද්ගලයෙක් විසින් අසනු ලැබූ නඩුවල නඩු කියූ පාර්ශවයන්ට පිළිසකර කළ නොහැකි හානියක් සහ අනර්ථයක් සිදුවෙනවා.

ඕ ෆැක්ටෝ අගවිනිසුරුවරයා තවදුරටත් තමන්ගේ විධානයන් නීතිය ට අනුව වලංගු සේ සලකා අයදුම්පත් සලකා බැලීම, විනිශ්චයාසන පිහිටුවීම සහ ධනාත්මක ලෙසත් ආංශික විනිශ්චයාසනයක් විසින් දැනටමත් තමන් විසින් ලබාදී තිබෙන නියෝග හා තීන්දු ආපස්සට හරවාවි යැයි අපේක්ෂාවෙන් තවදුරටත් ලබාදීම සිදුකළහොත්, අනාගතයේදී ඒ තීන්දු ආපස්සට හැරවුවත්, එවිට එම නියෝගයන් සිදුකරන ගරු විනිසුරුවරුන්ගේ අවංකත්වය සහ අපක්ෂපාතී බව ප්‍රශ්න කිරීමට ලක්වේවි. ප්‍රමාදය මගින් දැනටමත් විශ්‍රාමයට මග සලසා දී තිබෙන අතර ඉදිරියට පැමිණෙන්නට හිමිකම ඇත්තවුන් ට ඒ සම්බන්ධයෙනුත් ප්‍රමාදයක් ඇති කර තිබෙනවා.

අධිකරණය විසින් දැනටමත් ලබාදී තිබෙන විනිශ්චයන් සමාලෝචනයට ලක් කිරීම සඳහා අනාගතයේදී පූර්ණ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයාසනයක් කැඳෙව්වේ නැති නම් මේ තත්වය අධිකරණ ක්‍රමයේ විහිළුවක් බවට පත්වේවි. නීතියේ අධිකරණයක සොයාගැනීම්වලට පටහැණි විදිහට ක්‍රියාකරමින් අපට පියවර ගන්නට සිදුවෙනවා පමණක් නොවෙයි, මේ රටේ ඉහළම අධිකරණ ව්‍යූහයේ වලංගු නියෝග සහ තීන්දුවලට කුඩාම වැදගත්කමක්වත් නොදෙන්නට අපට සිදුවෙනවා.

ඇත්ත වශයෙන්ම දැනටමත් ගෙන තිබෙන පියවර අතීතයට බලපාන පරිදි වලංගු කිරීම ට අයදුම්පතක් ඉදිරිපත් කරන්නට පුළුවන්. දැන දැනම නීතිය උල්ලංඝනය කර තිබෙනවා නම් එවැනි අයට ඒ ක්‍රියා සඳහා සහනයක් ලබාදිය යුතුයිද කියන ගැටලුව විසඳා ගත යුතුයි. නමුත් අවසාන වශයෙන් එයින් මුළු මහත් වෘත්තියම සහ අධිකරණයම අවනම්බුවට පත්වෙනවා.

මේ නිසා වෙනත් කරුණු අතර, සිදුවිය හැකි දේවල් තුනක් තිබෙනවා. මේ දේවල් තුනම අවුල් ජාලකට හේතුවෙන්නට පුළුවන්. මේ වන විට කර තිබෙන නියෝග එසේම තිබෙන්නට හැරියොත්-එනම් ආපස්සට හැරවූයේ නැතිනම්, ඒවා ආපස්සට හැරවූයේ නම් හෝ එසේ ආපස්සට හැරවීම සඳහා අයදුම්පත් ඉදිරිපත් වූයේ

නැතිනම්, එයින් බරපතළ ප්‍රතිඵල ඇති වෙනවා. අවනීතිකතාවය සහ/හෝ අවිනිශ්චිතතාවයන්ට යටවෙලා ප්‍රජාතන්ත්‍රවාදයක් වැජඹෙයි කියා හිතන්න බෑ.
කාලයකට පෙර උතුරේදී සිදුවුණු බවට අසන්නට ලැබුණු දෙයක් මම කියන්නම්. දිසා විනිසුරුවරයෙක් ඉඩම් නඩුවක් සම්බන්ධයෙන් නියෝගයක් දුන්නා. නඩු කියල පැරදුණු පුද්ගලයා කැන්ගරු උසාවියකට ගියා. විනිසුරු හිටියා. අවුරුදු විසි ගණන්වලට පසුවුණු තරුණියක් අතට දිසා විනිසුරු තීන්දුවෙ කොපියක් දුන්නා. ඇයට හිතුණා තීන්දුව හරි කියලා. ඒ බව ඇය අධිකරණයෙදි ප්‍රකාශ කළා. නමුත් දිසා අධිකරණයෙදි නඩුව පැරදුණු පුද්ගලයා හමුදා කණ්ඩායමක ප්‍රබලයෙක් නිසා වෙන්න ඇති, ඇය එම පුද්ගලයාට ඉඩමේ ටික කාලයක් ඉන්නට පුළුවන් වන විදිහට ඒ නඩු තීන්දුවෙ වෙනස්කම් කිහිපයක් කළා. දිසා අධිකරණයෙදි නඩුව දිනුව කෙනාට දිසා අධිකරණයෙන් රිට් ආඥාවක් ගන්නට උවමනා වුණා. නීතිඥවරයා එම පුද්ගලයාට මෙහෙම කිව්වා. "ඔබ ළඟ ඔබේ වාසියට ලැබුණු නීත්‍යානුකූල නඩු තීන්දුවක් තියෙනවා. අනෙක් කෙනා ළඟ ඔහුගෙ වාසියට ලැබුණු ඩී ෆැක්ටෝ (තත්කාර්ය) තීන්දුවක් තියෙනවා. ඔබ රිට් ආඥාවක් ගත්තොත් ඔබ ව අධිකරණයට අපහාස කළා කියලා කැන්ගරු අධිකරණය ඉදිරියට අරන් යන්න ඉඩ තිබෙනවා. කළ යුතු දේ මොකක්ද කියල ඔබ තීරණය කළ යුතුයි."

අද අපි සිටින්නේත් ඒ බාල තත්වයේයි. මේ අනුව, අධිකරණ බලය ආරූඪ කරගන්නට යාම නිසා පාර්ලිමේන්තුව කැන්ගරු උසාවියක් බවට මේ මොහොතේදි පත්වෙලා කියල කියන්නට පුළුවන්ද..?

නීතිය සහ එහි දණ්ඩදේයත්වය අද දිනයේ පදනම් වෙලා තිබෙන්නේ පොදු සම්මුතියක් මත නෙවෙයි බල කිරීම මත බව කියන්නට පුළුවන්. සම්මතික නීත්‍යානුකූලභාවයට වඩා බල කළ නීත්‍යානුකූලභාවය මත බව කියන්නට පුළුවන්. අපට නීතිය මතට සම්මුතිකමය නීත්‍යානුකූලභාවය පටවන්න පුළුවන් බව නීතියට බලයෙන් හැඟවීමක්.

නීතිඥවරුන් මේ ක්‍රියාදාමයේ අනුල්ලංඝනීය කොටසක්. උපරිමාධිකරණවල නියෝග සහ තීන්දුවලට නීත්‍යානුකූලභාවය සහ අනුමැතිය ලබාදීම ප්‍රතික්ෂේප කිරීමෙන් ඒවායේ බලය සහ ඵලදායීතාවය රහසින් පීඩා කෙරෙනවා. එබඳු පිරිහීමකට පාර්ලිමේන්තුවෙන් උල්පන්දම් දීමෙන් කියන්නේ අපේ නීති සම්පාදකයන්ගේ අසනීපයයි.

සිද්ධ වන දේවල්වල බරපතළ කම නීති වෘත්තිය විසින් තේරුම්ගෙන, අභියෝගවලට මුහුණදීමට සූදානම්වීම ගැන මම සතුටු වෙනවා. ඔබ සමග සිටීමට සහ ඔබ කරමින් සිටින දෙය සමග මගේ එකඟතාවය පෙන්වා දීම සඳහා මට මේ අවස්ථාව ලබාදීම ගැන මම නීතිඥ සංගමයේ සභාපතිවරයාට සහ සාමාජිකයන්ට ස්තුතිවන්ත වෙනවා. ඇත්ත වශයෙන්ම අමු අමුවේ සිදුකරන භෞතික තාඩන පීඩන නොවේ නම් පුවත්පත් හරහා සිදුකරන චරිත ඝාතන, තර්ජන සහ බියවැද්දවීම්, ඒවාට සම්බන්ධ වූ පාර්ශවයන් විසින් ඔබ වෙත එල්ල කරන්නට පුළුවන්. නමුත් මතක තබාගන්න, ඔබලා යෙදී සිටින්නේ අගනා ගමනක බව. ඒ ගමන, මේ රටේ නීතිය හා සාමය වෙත ගරුත්වය සහ නීත්‍යානුකූලභාවය රැගෙන එනු පිණිසයි! ඒ ගමන අපේ වෘත්තිය ඒකාබද්ධ කරනු පිණිසයි!

ජයසූරිය මහත්මයා! ඔබ ඉදිරියේ තිබෙන්නේ ප්‍රිය නූපදවන කාර්යයක්. නීතිඥ සංගමය ඉතා ප්‍රබල ලෙස තමන්ගේ සහයෝගය ඔබට ලබාදෙනවා. ඔබ ඒ විශ්වාසයේ අගනා කෝෂ්ඨාගාරයක් වේ යැයි මා විශ්වාස කරනවා. දැන්, අන් කවරදාටත් වඩා, පක්ෂ සබඳතා සහ පුද්ගලික විෂමතා පසෙකින් තබා වෘත්තියට නිසි තැන සහ අභිමානය ලබාදිය යුතු කාලයයි! නිලයේ නැවුම් වසරට මම ඔබට සුබ පතනවා. ඔබ සියලු දෙනාට දෙවි පිහිටයි! ස්තුතියි.

- සී.වී. විග්නේස්වරන් විනිසුරු